# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014 මැයි 20 වන අඟහරුවාදා**
2014 வைகாசி 20 செவ்வாய்க்கிழமை
Tuesday 20th May 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.44 ට පළාත් සභාව රැස් විය.**
**மு.ப. 09.44 க்கு சபை கூடியது**
The Provincial Council met at 09.44 a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදන
## ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ගරු මන්ත්‍රීවරුන් වෙත සභාවේ ආසන පැනවීම සම්බන්ධ කෙටි දැනුම් දීමක් තිබෙනවා.*

*අභිනව පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් වෙත දැනට තිබෙන තත්ත්වයන් මත ආසන වෙන් කිරීමක් තාවකාලිකව සිදු කර තිබෙනවා. මෙය තවදුරටත් සංශෝධනය වීමට ඉඩ තිබෙනවා. බොහෝදුරට. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ධුරයන් කිහිපයක් සම්පූර්ණ වීමත් සමගම එම වෙනස් කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.*

*එමෙන්ම ඒ ඒ පක්ෂවලට අයත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා සමීප ආසනවල සිටීමට හැකි වන පරිදි ආසන කාණ්ඩ වශයෙන් වෙන් කර ගැනීමේ අභිලාසයක් ද තිබෙන්නට පුළුවන්.*

*ඒ නිසා කවර හෝ ගරු මන්ත්‍රීවරයෙකුට එසේත් නැත්නම් පක්ෂ කණ්ඩායමකට කිනම් හෝ දුෂ්කරතාවයක්, නොගැලපීමක් සිදු වී ඇතැයි අදහස් කරනවා නම්, ඒ පිළිබඳව නොපැකිලව මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත ලිඛිතව දැනුම් දෙන මෙන් ඉතා කාරුණිකව දැනුම් දෙනවා.*

*ඒ සියලු ඉල්ලීම් පිළිබඳව සාධාරණව සලකා බලා සභා රීති ප්‍රකාරව හා සභා සම්ප්‍රදායනට අනුකූලව ගරු මන්ත්‍රීවරුන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් නොවන පරිදි අවශ්‍ය සහනයන් ලබා දීමට මම කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු ඔබතුමන්ලා වෙත කාරුණිකව දැනුම් දෙනවා.*

*එවැනි සියලු ඉල්ලීම් ලිඛිතව මා වෙත හෝ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන මෙන් නැවතත් සිහිපත් කරනවා."*

*ii*

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ VI වන පළාත් සභාවේ ගරු විපක්ෂ නායක වශයෙන් ගරු මංජු ශ්‍රී අරංගල මැතිතුමාවත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස ගරු හර්ෂන සුපුන් රාජකාරුණා මැතිතුමාවත් 2014.04.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇති බව දැනුම් දෙනවා."*

(බාධා කිරීමක්)

*iii*

*"2014.04.22 වන දින පැවති බස්නාහිර පළාත් සභාවේ VI වන පළාත් සභාව සඳහා ගරු මන්ත්‍රීවරුන් තේරී පත් වී ඇති දේශපාලන පක්ෂවල කණ්ඩායම් රැස්වීමේදී ඇති කර ගත් එකඟතාවයන් අනුව VI වන පළාත් සභාවේ පක්ෂ නායකයන් වශයෙන්,*

*එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාව,*

*එක්සත් ජාතික පක්ෂයෙන් මංජු ශ්‍රී අරංගල මැතිතුමාව,*

*ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් ගරු එස්.කේ. කිදෙල්පිටිය මැතිතුමාව,*

*ජනතා විමුක්ති පෙරමුණෙන් ගරු කේ.ඩී. ලාල්කාන්ත මැතිතුමාව,*

*ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ ගරු එම්. ශාෆි රහීම් මැතිතුමාව,*

*ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණේ ගරු එම්. ගනේෂන් මැතිතුමාව හා*

*අඛිල ඉලංගෙයි මහජන කොංග්‍රසයෙන් ගරු ඒ.ජේ.එම්. ෆායිස් මන්ත්‍රීතුමාව*

*2014.04.22 දින සිට පිළිගනු ලැබ ඇති බවත්,*

*තවද, මැතිවරණයට ඉදිරිපත් වූ දේශපාලන පක්ෂ සමඟ සංවිධානගත වී ඇති දේශපාලන පක්ෂවල කණ්ඩායම් නායකයන් ද පක්ෂ නායකයන් වශයෙන් පිළිගැනීමට ඇති කර ගත් එකඟතාවය අනුව, එක්සත් ජනතා නිදහස් සන්ධානය තුළ සන්ධානගත දේශපාලන පක්ෂවල නායකයන් ඉදිරියේදී නම් කරන බව ද මෙම ගරු සභාවට කාරුණිකව දැනුම් දෙනවා. "*

*iv*

*"ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් එවා ඇති, ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 අප්‍රේල් මස 30 දින ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයේ සවිස්තර වාර්තාවක් හා 2014 අප්‍රේල් මස 30 දින ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයේ දෙමළ භාෂා පිටපත් ද, සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇති බවත් කාරුණිකව දැනුම් දෙනවා. එම ලේඛන ඔබතුමන්ලාගේ සභා මේසය මත තබා තිබෙනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
# PAPERS PRESENTED

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
**[ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]**
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs)
[on behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, මුදල් ප්‍රකාශ සංශෝධනය 2014 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය, පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම 2013 යන ලේඛන මම මෙම සභාවට පිළිගන්වනවා.

මෙම ලේඛනවල පිටපත් අද දිනට නියමිත න්‍යාය පත්‍රය සමඟම ගරු මන්ත්‍රීවරුන්ට තැපැල් මඟින් ලැබෙන්නට සලස්වා තිබෙනවා. එම ලේඛන පිළිබඳ ඉදිරි වැඩ කටයුතු අද දින පොදු කටයුතු අවස්ථාවේදී ඉටු කිරීමට බලාපොරොත්තු වෙනවා.

# කාරක සභා වාර්තා
# COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.05.07 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

එම වාර්තාවේ, මෙම වසර තුළ ඉදිරි කාලයේ සභා රැස්වීම් පැවැත්වෙන දින ඇතුළත් ලේඛනයක් තිබෙන බවත් ගරු මන්ත්‍රීවරුන්ගේ කාරුණික අවධානයට යොමු කරනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
# PETITIONS

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, හෝකන්දර දකුණ, ඇවරිහේන, අංක 488/C හි පදිංචි එම්.එච්. පීරිස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මහබුත්ගමුව, පන්සල පාර, අංක 128/4/1 - A හි පදිංචි එස්.පී.කේ. නානායක්කාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පොල්ගස්ඕවිට, හෙරලියාවල, අංක 38 හි පදිංචි කේ. සිසිර කුමාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

*න්‍යාය පත්‍රයේ ප්‍රශ්න අංක **01** යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට එවෙලේ ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නොසිටි බැවින් ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන හැටියට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.*

*Since the Hon. Member was not present in the Council Chamber at the time to present the question under No. 01 in the Agenda by Hon. Member Niroshan Padukka to obtain a reply from the Hon. Chief Minister, Hon. Chairman ordered to refer that question to the next Council Meeting.*

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, "*විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.*"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine and Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අද මෙම සභාවට අපේ කාලයේ, ඒ වාගේම අනාගත දරු පරපුර වෙනුවෙන්, මේ රටේ ජනතාවට ඒ වගකීම ඉටු කරන අතිශයින්ම වැදගත් කාරණාවක් පිළිබඳවයි අමාත්‍යවරුන්ගේ පැහැදිලි කිරීමක් යටතේ කිරීමට මම බලාපොරොත්තු වෙන්නේ. ගරු සභාපතිතුමා වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍යතුමන්ලා, ගරු මන්ත්‍රීතුමන්ලා, ඒ වාගේම විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා, මේ රටේ ජනතාව එක සිතින්ම එකඟ වූ, අනුමත කළා වූ, අපේක්ෂා කළා වූ මහඟු කාර්යයකට අපට අධිකරණයේ අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ තමයි දුම්වැටි දවටනවල රූපමය අවවාද ඇතුළත් කිරීම.

විශේෂයෙන් අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ සහ මහින්ද චින්තන ඉදිරි දැක්ම පිළිබඳව පිටු කිහිපයක් පෙරළා බැලුවොත් එතුමාගේ වැඩ පිළිවෙළේ ප්‍රධාන කාරණා දෙකක් ඇතුළත් වුණා. එකක් තමයි මේ රටේ තිබුණු යුද්ධය අවසන් කිරීම. යුද්ධය අවසන් කරලා, මේ රටේ සාමය ස්ථාපිත කරලා ඊළඟ පියවර තමයි රට ආර්ථික, සාමාජීය වශයෙන් ඉහළ තැනකට ඔසවා තැබීම. මේ කාරණා අතර දෙවැනි කාරණාව හැටියට මේ රටේ අනාගතයේ යහපත් දරු පරපුරක් සඳහා අවශ්‍ය කටයුතු රජයක් හැටියට ඉටු කිරීම. ඒ නිසාවෙන් අද විශේෂ ස්තුතියක්, විශේෂ ගෞරවයක් බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රසන්න රණතුංග මැතිතුමා වෙනුවෙන්, ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට, ඒ වාගේම අපේ ගරු අමාත්‍යතුමන්ලා වෙනුවෙන් සහ අපේ පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් විශේෂ ස්තුතියක්, ගෞරවයක් - මෙම යෝජනාව 2012 දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා 225 දෙනාගේම ඒකමතික එකඟතාවය මත සම්මත වෙලා පසුව අධිකරණයටත් යන්න සිද්ධ වුණා. මේ රටේ දුම්කොළ සමාගම් - මේ විශේෂ ප්‍රකාශය කරන්න මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. නැත්නම් ඒ ගැන කියන්න පුළුවන්. දුම්කොළ සමාගම්වලින් පවරපු නඩුව අපට ජයග්‍රහණය කරන්න ලැබුණා. 80% කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, 60% ක් දක්වා රූපමය අවවාද ඇතුළත් කරන්න තීන්දු වුණා. මේ අනාගත පරපුර වෙනුවෙන් ඉටු කළා වූ මහඟු සත් කාර්යය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු අමාත්‍යතුමන්ලා, ඒ වාගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ඒ වාගේම අධිකරණයටත් ගෞරවනීය ස්තුතිය, ප්‍රණාමය මේ වෙලාවේ පළ කරන්නට ඕනෑ.

මම විශේෂයෙන් මේ වෙලාවේ මතක් කළ යුතු දෙයක් තිබෙනවා. අපේ මතයක් තිබෙනවා ගරු සභාපතිතුමනි,

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

මේ මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි හරහා ලොකු ආදායමක් රජයට ලැබෙනවාය කියලා. මේක එක පැත්තකින් ආර්ථික විද්‍යාත්මකව ධනාත්මක පැත්තෙන් නිවැරදි බවක් තිබෙන්න පුළුවන්. හැබැයි, අපි පිළිගත යුතු දෙයක් තිබෙනවා. අද මේ දුම්වැටි, මත්පැන්, මත්ද්‍රව්‍ය හරහා සිදු වන මහා ව්‍යසනය, රෝගී තත්ත්වය අපි පැහැදිලිව තේරුම් ගන්නට ඕනෑ. ඒ නිසාවෙන් අද රෝගී වන තත්ත්වය කොයි තරම්ද කියනවා නම් අවුරුදු 40 ක් 50 ක් වෙන කොට අද පිළිකා රෝගීන් 60% ක් පිළිකා රෝග කාරක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ. මේ දුම්වැටි පාවිච්චි කිරීම නිසාවෙන් දවසකට 65 දෙනෙක් මිය යනවා. අවුරුද්දකට කෝටි 450 ක් වැය වෙනවා. අවුරුද්දකට 21,000 ක් මිය යනවා. ඒ නිසාවෙන් අද මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ ව්‍යසනය තේරුම් අරගෙන අපේ රටේ අනාගතය වෙනුවෙන්, අනාගත දරු පරපුර වෙනුවෙන් මේ මහඟු කාර්යය ඉෂ්ට සිද්ධ කරන්නට පුළුවන්කම ජනාධිපතිතුමාට ලැබුණේ.

විශේෂයෙන් අපි මතක් කරන්න තිබෙන විශේෂ කාරණාවක් තමයි මේ රටේ මේ මත්ද්‍රව්‍ය හරහා ලැබෙන ආදායම වෙනුවට ඉතාම නීරෝගී සම්පන්න, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් රටට උරුම වෙනවා. කොතරම් මුදලක් ලැබුණත්, බිලියන ගණනක මුදලක් අපට ලැබුණත් ඊට ප්‍රතිවිරුද්ධව ලැබෙන රෝගී තත්ත්වයන් සමනය කරන්න - විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ තත්ත්වයන් අපි ඉදිරියේදී පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙනවා. මගේ වගකීමක් සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට. මේ රෝගී තත්ත්වයන් සමනය කරන්න, සුවපත් කරන්න, ප්‍රතිකාර කරන්න, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන්න ඊට වඩා අති දැවැන්ත මුදලක් සෞඛ්‍ය සේවාවට වැය වෙනවා. ඒ නිසාවෙන් අපි රෝගී වූ, දුර්වල වූ, කායික සහ මානසික පීඩනයකින් යුක්ත අනාගත පරපුරකට හිමිකම් කියනවාට වඩා, නීරෝගී, කායික සහ මානසික යහපත්, නිවැරදි, නීරෝගී සම්පන්න ජනතාවක් රටට උරුම කරන්න ලැබීම අපේ කාගෙත් යහපතක් හැටියට මම විශ්වාස කරනවා. ඒ නිසා මේ වෙලාවේ හැටියට අතිගරු ජනාධිපතිතුමා ගත්ත නිවැරදි තීන්දුව, මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්වැටි මේ සියලු දේවල් තීන්දුව පිළිබඳව අපේ පළාත් සභාවේ ගරු මහ ඇමතිතුමා, ඒ වාගේම ගරු අමාත්‍ය මණ්ඩලය, ඒ වාගේම පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ බලවත් ප්‍රසාදය සහ ගෞරවය පළ කර සිටින්නට ඕනෑ. ඒ නිසාවෙන් බස්නාහිර පළාත් සභාවේ ඒ ගෞරවය තවදුරටත් මේ ඉදිරි ගමන ශක්තිමත් කරන්න අතිගරු ජනාධිපතිතුමාටත්, මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමතිවරයා වන මෛත්‍රීපාල සිරිසේන ගරු ඇමතිවරයාටත් මේ වෙලාවේ ඉතසිතින්ම, හදවතින්ම කෘතඥතාව පළ කර සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ පුටු ප්‍රශ්නයක්. මම මේ පුටුව මාරු කරලා, ස්ථානය මාරු කරලා ඉන්නේ. මගේ පුටුව ඉඳ ගන්න පුළුවන් තත්ත්වයක නැහැ. එහා පැත්තෙන් පුටුවක් මාරු කරන්නත් බැලුවා. කාර්ය මණ්ඩලය කියන්නේ, මේ පුටු කැඩිලාලු. කාලයක් තිස්සේ. ඉතින් ඉඳගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා කඩිනමින් පුටුව හදලා දෙන්න. මෙතැන ඉන්න මහජන නියෝජිතයා ආවොත් මට ඉඳගන්න තැනක් නැතිව ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ඒ ප්‍රශ්නය පිළිබඳව මම අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රශ්නයට අපි ඉතාමත් ඉක්මණට විසඳුම් ලබා දෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මගේ පුටුවත් එහෙමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ප්‍රශ්නයට ඉක්මණින් විසඳුම් ලබා දෙනවා. මොකද, අපි පුටු ඇණවුම් කරලා තිබෙන්නේ. මම හිතන්නේ කඩිනම්ව අපි අලුත් පුටු ලබා දෙනවා. මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මීට ඉස්සෙල්ලා සභාවකත් මම මේ අදහස ඉදිරිපත් කළා. ඇත්තටම අතිගරු ජනාධිපතිතුමාත් විටින් විට සියලු නිලධාරීන්ව

දැනුවත් කළා, අඩු ගණනේ බදාදා දවස ජනතාව වෙනුවෙන් වෙන් කරලා, ජනතාවට හමු වෙන්න පුළුවන් විධියට බදාදා දවසේ සියලු රජයේ නිලධාරීන්ට තමන්ගේ කාර්යාලවල රැඳී සිටින්නය කියලා. ඇත්තටම මම දැක්කා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මේ මෑතකදී ප්‍රකාශයක් කරලා තිබුණා. නමුත් මම දැකපු දේ තමයි අපි බදාදා දිනයට මහජන දිනය කරන කොට අපි ගොඩක් ආයතනවලට කථා කළාම ගොඩක් ප්‍රධානීන් බදාදා දවස්වලට තමයි බොහෝ වෙලාවට රැස්වීම් දා ගන්නේ. නැත්නම් බදාදා දවස්වලට ෆීල්ඩ් එකේ ගිහිල්ලා. මොනවාම හරි ප්‍රශ්න. මේ නිසා මහජනතාව ලොකු අපහසුතාවයකට පත්ව දුක් විඳිනවා.

අපි ගත්තාම දුෂ්කර පළාත්වල ඉඳලා මේ අමාත්‍යාංශයකට ආවාට පස්සේ අමාත්‍යාංශයේ අදාළ නිලධාරියා නැත්නම් ඒ මනුස්සයාට තව දවසක් එන්න වෙනවා. ඉතින් ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේ බදාදා දවස සියලුම නිලධාරීන්ට - ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමාටත් වඩා උසස් අය තමයි සමහර නිලධාරීන්. ජනාධිපතිතුමා කිව්වත්, බස්නාහිර පළාත හැටියට අපේ ගරු මහ ඇමතිතුමා කිව්වත් මේවා අහන්නේ නැති පිරිසක් ඉන්නවා. ඒ නිසා මේකට කඩිනම් විසඳුමක් දෙන්න. මේක අනිවාර්ය කරලා, මේවාට නීතියක් හැටියට හරි ගේන්න ඕනෑ බදාදා දවස අනිවාර්යයෙන් ඉන්න කියලා. ඉතින් එසේ මතක් කරමින් - ඒ වාගේම මේක රේඛීය අමාත්‍යාංශවලත් තදින් තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, රේඛීය අමාත්‍යාංශවල සියලුම ගරු අමාත්‍යවරුන්ට මේ පිළිබඳව දැනුම් දීමක් කරන්න කියලා. ලිඛිතව දැනුම් දීමක් කරන්න කියලා. මේ අයට බදාදා දිනවල සියලුම රජයේ නිලධාරීන්ට ඒ තමන්ගේ කාර්යාලවල ජනතාව වෙනුවෙන් රැඳී සිටින්න කියලා මම ඉල්ලීමක් හැටියට කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 2014.04.08 වන දින අද පුවත්පතේ පළ වූ ලිපිය ගැන සඳහන් කරනවා. වාර්තාකරු කඳාන රුක්මන් කියලා තමයි සඳහන් වෙලා තිබෙන්නේ. මීට ඉහතත් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී මේ වාර්තාකරු ගැන සඳහන් කළා. මොකද, මෙතුමා ජා-ඇළ කොට්ඨාශයේ ධර්මරත්න විදුහලේ ගුරුවරයෙක්. ප්‍රාථමික ගුරුවරයෙක්. එහි ගුරුවරයෙක් හැටියට වැඩ කරමින් සිට 2012 මැයි 28 වන දින ජාතික ශික්‍ෂාභට බලකායේ මූලස්ථානයේ ලිපියකින් විදුහල්පතිවරයාට ලියුමක් ලියලා, ඒ පාසලින් නිදහස් වෙලා අධ්‍යාපන පරිපාලනයේ නීතිරීතිවලට පටහැනිව අමාත්‍යාංශයෙන්, දෙපාර්තමේන්තුවෙන්, කලාපයෙන් අනුමැතියක් නැතිව, එතුමා විදුහල්පතිවරයාට ලිපියක් ලියලා නිදහස් වෙලා තිබෙනවා. එදා ඉඳලා මේ වන තෙක් විශේෂයෙන්ම පාසල්වලට විරුද්ධවත්, ඒ වාගේම මන්ත්‍රීවරුන්ට විරුද්ධවත් එතුමාගේ නමින්ම අද පත්තරේටත්, ඒ වාගේම රිවිර, මව්බිම, දිවයින පත්තරවලටත් අසත්‍ය තොරතුරු ප්‍රකාශ කරලා එතුමා ලියනවා. මොකද එදා ප්‍රධාන අමාත්‍යතුමාගේ වැඩ භාර ගැනීමේ උත්සවයේදී එතුමා සහභාගී වුණෙත් නැහැ. ඒ වාගේම මාධ්‍යකරුවන් ඒ වාගේම විද්‍යුත් මාධ්‍ය ගණනාවක් හිටියා. එතුමා මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට පහර දුන්නාය කියලා බොරු ප්‍රකාශයක් කරලා එතුමාගේ ප්‍රවෘත්තිය තමයි මුලින්ම පත්තරේ දැම්මේ. ඒ පත්තරේ අනුව තමයි මේක සඳහන් වුණේ. ඒ වාගේම නැවතත් 2014.05.07 වැනි බදාදා අද පුවත්පතේ දකුණු බටගම ධර්මාශෝක විදුහල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අඩාල වෙලා කියලා බොරු ප්‍රකාශයක්, අසත්‍ය ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා, අධ්‍යාපන ඇමති ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්. මෙම ගුරුවරයා පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. මොකද, එතුමා එදා ඉඳලා නීත්‍යානුකූලව නිදහස් නොවී වැඩ කටයුතු කරන ගමන් එතුමා අසත්‍ය ප්‍රකාශ කරමින් පත්තරවල ලියන එක ගැන. විශේෂයෙන්ම ගුරුවරයෙක් නිසා, පළාත් සභාවෙන් පඩි ගන්න, වැටුප් ගන්න ගුරුවරයෙක් නිසා එතුමාට විරුද්ධව පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 2013.08.17 වන දින කොළඹ නගර සභාව තුළ ඇති වුණු ලිපිගොනු පුළුස්සා විශාල වංචාවක් යට ගැසීමට අදාළ කාරණාවක් සම්බන්ධයෙන් තමයි ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ. විශේෂයෙන්ම එම ලිපිගොනු පිළිස්සීම ජාතික ලේඛනාරක්ෂක පනතටත්, ආයතන සංග්‍රහයටත්, සුසාන භූමි ආඥා පනතටත් අතිශය පටහැනි විධියටයි සිදු වී තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මෙම ලිපිගොනු පිළිස්සීම බොරැල්ල කනත්තේදී සිද්ධ වුණේ. ගරු සභාපතිතුමනි,

[ගරු සුනිල් වටගල]

මෙම ලිපිගොනු පිළිස්සීමට අදාළව මම නාගරික මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී මම ප්‍රශ්නයක් යොමු කළා. ඒ ප්‍රශ්නයක් යොමු කළාට පස්සේ 2013.09.30 වන දින උත්තරයක් ලබා දීලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මේ උත්තර අතර හාස්‍ය ජනක උත්තරයක් අපට ලබා දීලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයෙන් මම අසන්නේ, එම පිළිස්සීම සඳහා ගරු නගරාධිපතිතුමාගේ, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ, මහ සභාවේ හෝ ආයතන කමිටුවේ අවසරය ගෙන තිබුණේද? නැතහොත් අවම තරමින් ඔවුන් දැනුවත් කර තිබුණේද? කියලා. උත්තරේ දීලා තිබුණේ ගරු සභාපතිතුමනි, නාගරික කොමසාරිස්වරියගේ අනුමැතිය ලබා ඇත කියලා. ගරු සභාපතිතුමනි, මේක කෙටියෙන් කියනවා නම්, මම අහලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, ගේ ඇතුළේ සිරිපාල ඉන්නවාද කියලා. හැබැයි උත්තරේ දීලා තිබෙන්නේ අපේ මහත්තයා නම් ගෙදර නැහැයි කියලා. අන්න ඒ වාගේ උත්තරයක් තමයි මේ තිබෙන්නේ. එතකොට ගරු සභාපතිතුමනි, ඊට එහා ගියාට පස්සේ තවත් ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්නයෙන් කියන්නේ, ගරු සභාපතිතුමනි, බොරැල්ල කනත්තේ සිදු කරන ලිපිගොනු පිළිස්සීමේදී ප්‍රධාන වෛද්‍ය නිලධාරී ප්‍රදීප් කාරියවසම් මහතාව දැනුවත් කිරීම පූර්ව අවශ්‍යතාවයක් බව ඔබතුමා පිළිගන්නේද? ගරු සභාපතිතුමනි, බොරැල්ල කනත්ත අයිති වෙන්නේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයාට. එතකොට ඒකට ලබා දීලා තිබෙන උත්තරේ ගරු සභාපතිතුමනි, දැනුවත් කර ඇත කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ප්‍රදීප් කාරියවසම් මහත්තයා නගරාධිපතිවරයාට ලබා දීලා තිබෙනවා මේ පිළිබඳව විශේෂ ලිපියක්. ඒ ලිපිය මා සතුව තිබෙනවා. ඒ ලිපියේ දීලා තිබෙන උත්තරේ තමයි ගරු සභාපතිතුමනි,

I was not aware that it belongs to the Council.

එතුමා කියනවා පැහැදිලිවම ඒ පිළිබඳව දන්නේ නැහැයි කියලා. ඒ විතරක් නොවෙයි තවත් ඔහු කියනවා,

I was telling the PHI to get the waiting area repaired and was about to leave when the Municipal Council Mrs. D.H. Janaki Administrative Officer, Shelton Perera, Nandanie Fernando Municipal Commissioner's Cordinating Secretary came up to me. The Municipal Secretary informed me that they had come to burn some files.

ඒ වෙලාවේ තමයි එයා කියලා තියෙන්නේ, මේ ෆයිල් වගයක් පුච්චන්න ආවා කියලා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි,

I was surprised as the accepted procedure is to inform me is wating as the Chief Medical Officer of Health before such action is taken. As the Borella Kanatte comes under the purview of Public Health Department, according to the section 12 of the Cemeteries and Burial Ordinance no part of any cemetery shall be used for any purpose except for the purpose of cemeteray and any person making any other use of such lands shall be guilty of an offence

ඒක තමයි පනතේ කියලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. ඔහු ඒ උපටනය ඔහුගේ ලිපියේ දක්වලා තිබෙනවා. එතකොට ඒකෙන් කියන්නේ, මේ ලිපිගොනු පිළිස්සීමේ ක්‍රියාවලිය ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයා දැන ගෙන හිටියේ නැහැ කියන කාරණාවයි ගරු සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. තවත් විශේෂ කාරණයක් තිබෙනවා. මේ කාරණය තමයි මේ පිළිබඳව නගරාධිපතිවරයා කිසියම් පරීක්ෂණයක් කැදෙව්වා වහාම. ඒ පරීක්ෂණයේ වාර්තාවත් තිබෙනවා ගරු සභාපතිතුමනි. මා සතුව තිබෙනවා. මා සභාගත කරන්නම්.[1] ඒ පරීක්ෂණ වාර්තාවේ අවසානයට කියන නිගමනයක් තිබෙනවා. ඒ නිගමනය තමයි ගරු සභාපතිතුමනි,

1948 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 172 වන වගන්තියට අනුව සභාවේ ඔප්පුවල, ගිවිසුම්වල, ගිණුම්වල, වවුචර්වල, ලේඛනවල සහ ලියවිලිවල භාරය සම්බන්ධයෙන් සභාවේ කොමසාරිස්වරයා වගකිව යුතු අතර, යම් සභිකයෙකුට මහ නගර සභා කාර්යාලයේදී ඒවා පරීක්ෂා කිරීමට හෝ කියවා බැලීමට හෝ ඔහු විසින් ඉඩ දිය යුතුය. ඉහත 1(1) සහ 1(2) වලට අනුව ලිපිගොනු හා

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

ලියකියවිලි විනාශ කිරීම සම්බන්ධව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ කියන්නේ මේ ලිපිගොනු පිළිස්සීමට අදාළව කොළඹ මහ නගර සභාවේ මහ සභාව දැනුවත් වෙලා නැහැ ගරු සභාපතිතුමනි.

අවසාන වශයෙන් ඔබතුමාට කියන්නේ. අවසන් නිරීක්ෂණය. ඒ නිරීක්ෂණයේ කියනවා,

රාජකාරී ලිපිලේඛන විනාශ කර දැමීම හා සම්බන්ධ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනතේ විධිවිධානයන් හා ආයතන සංග්‍රහයේ නව වන පරිච්ඡේදයේ වගන්තියට අනුව ක්‍රියාකර තිබේද යන්න පිළිබඳව පරික්ෂා කර ගෙන යනු ලබන අතර, ඒ පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරියේදී භාර දීමට කටයුතු කරන බව ඉතා කාරුණික වනවා කියලා.

ඒ අනුව ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. මෙක දැන් 2013.08.17 වුණු සිද්ධියක්. මීට අදාළ වගකිවයුත්තෝ අද විශ්‍රාම යමින් ඉන්නවා. ෂෙල්ටන් පෙරේරා මහත්තයා. එතකොට ඔබතුමාගේ අවධානයට යොමු කරලා - මේ විශාල වංචාවක්, කෝටි ගණනක වංචාවක් යට ගහන්න කරපු උප්පරවැට්ටියක්. ඒ අනුව මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වන්නය කියන ඉල්ලීම ඔබතුමා මාර්ගයෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මම පෞද්ගලික පැහැදිලි කිරීම කරන්න ප්‍රථමයෙන් මේ අවස්ථාවේ විනාඩියක ස්තුතියක් කරන්න බලාපොරොත්තු වෙනවා. VI වන පළාත් සභාවට ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව මාව, විශේෂයෙන්ම කැලණිය, බියගම, මහර, වත්තල ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්න ඕනැ, මාව නැවත වරක් පත් කිරීම සම්බන්ධව. ඒ වාගේම ඒ ආසන හතරේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු පක්ෂ දෙකෙන්ම අට දෙනෙක් පරාජය වෙලත් අපි ජයග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මගේ පළාත් සභා ඉතිහාසයේ ගියවර පළාත් සභා මැතිවරණයට වඩා ඡන්ද 2000 කට ආසන්න වැඩි ඡන්ද ප්‍රමාණයක් මට ලැබුණා. ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මේ වෙලාවේ ඕවා කියන්න නොවෙයි නේ තිබෙන්නේ. ඔය ඡන්ද ගත්ත ගාණ කියන්න අපටත් පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒ වාගේම අනාරක්ෂිත භාවය සම්බන්ධව අපි කථා කරන්න ඕනැ. අනාරක්ෂිත භාවය සම්බන්ධව කථා කරනවා නම් කැලණියේ මෑත කාලය තුළ අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වන හසිත මඩවල මැතිතුමාත්, මේ ඊයේ පෙරෙයිදා පැලියගොඩ නගර සභාවේ අමිල සඳරුවන් මැතිතුමාවත් අමු අමුවේ පාරවල්වල මරලා දැම්මා. එක කවුරුත් දන්නවා. ඒක තුළ අපි දකින්නේ, කැලණිය ආරක්ෂා කර ගන්න බැරි ආණ්ඩුවට මොනවාද ඒ ගැන කථා කරන්නේ? ආණ්ඩුව ගැන මොනවාද මේ කථා කරන්නේ? අපට දැන් නිදහසේ මහජන නියෝජිතයෝ විධියට - (බාධා කිරීම්) මම තමුන්නාන්සේලාගේ මහජන නියෝජිතයෙක් ගැන කථා කරන්නේ. කිසිම ආරක්ෂාවක් නැහැ. ඒ වාගේ විතරක් නොවෙයි. මම ඉල්ලීමක් කරනවා, (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි. මම ඉල්ලීමක් කරනවා. ඒ විතරක් නොවෙයි ඡන්දයට දවස් හතරකට ඉස්සෙල්ලා මගේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කළා. (බාධා කිරීම්) අද කෝ පරීක්ෂණ? තවම ඇල්ලුවාද?

[සභාවේ ඝෝෂා]

ඒ විතරක් නොවෙයි මම සන්ධානයට එනවා කියලා පෝස්ටරයක් බෙදා හැරියා. කවුද මේ කැත වැඩ කළේ? කවුද මේ පෝස්ටරේ බෙදා හැරියේ? කවුද මේ වාගේ දේවල් කළේ? එහෙම කරලත් ඡන්ද වැඩි වුණා. මේවාට වග කියන්න ඕනැ තිබෙන ආණ්ඩු පක්ෂයයි. (බාධා කිරීම්) ආණ්ඩු පක්ෂය වගකියන්න ඕනැ. මම කවදාවත් එක්සත් ජාතික පක්ෂය අතහැරලා යන්නේ නැහැ. ඒත් ඡන්ද වැඩි වුණා. මෙන්න මේ වාගේ පෝස්ටර් ගැහුවා. අද කැලණියේ තත්ත්වය ගැන අමුතුවෙන් කියන්න ඕනැ නැහැ ගරු සභාපතිතුමනි. මම ඉල්ලීමක් කරනවා -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ජෝර්ජ් පනින්න හිටියේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තුෂාර පෙරේරා ගැහුවේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

සාකච්ඡා කළා පනින්න.

**ගරු ආනන්ද රංජිත් රූපසිංහ**
Hon. Ananda Ranjith Rupasinghe

පනින්න සාකච්ඡා කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බෙවන් පෙරේරා ගැහුවේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, අපි දන්නවා කැලණියේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, මර්වින් සිල්වා අමාත්‍යතුමාත් (බාධා කිරීම්)

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බෝම්බෙ ජෝර්ජ්මයි ගහගත්තේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මේ අමිල සඳරුවන් මැතිතුමා වැඩ කළේ, නිමල් ලාන්සා මැතිතුමාට. නිමල් ලාන්සා මැතිතුමාට වැඩ කළේ. අපි දන්නේ නැහැ මොකක්ද ප්‍රශ්නේ කියලා. මොකක්ද ප්‍රශ්නේ කියලා දන්නේ නැහැ. කොහොම හරි මහජන නියෝජිතයන්ට ආරක්ෂාව දෙන්න. කැලණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට පොලිස් ආරක්ෂාව දීලා තිබෙන්නේ. ඒකෙන් කැලණියේ තත්ත්වය තේරෙනවා. සමහර පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දීලා තිබෙනවා. අපි, සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට දෙන්න. ඉදිරියේදී ජනාධිපතිවරණයට මුහුණ දෙන්න ඕනෑ. මහ මැතිවරණයට මුහුණ දෙන්න ඕනෑ. අපි ඉදිරියට යන්න ඕනෑ. ජනතාව අතර ඉන්න ඕනෑ. අපි ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. මම ඒ ගැන බලන්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, (බාධා කිරීම්) මෙතුමාට ප්‍රශ්නය තියෙන්නේ බෙවන් එක්කයි. ඒ නිසා මේවාට ආණ්ඩු පක්ෂය ගාව ගන්න එපා. ඔයාගේ ප්‍රශ්නය ආණ්ඩු පක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි. ඔයා ඒක විසඳගන්න බෙවන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඉසුර මන්ත්‍රීතුමා, මේ පෞද්ගලික පැහැදිලි කිරීම් අවස්ථාවේ අනවශ්‍ය විවාදවලට යන්න එපා. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 03 ක කාලයක් තිබෙනවා. කරුණාකර ඉසුර මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගහන්න ගියා. ගැහුවේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. ඔබතුමා බොරු ප්‍රශ්න මතු කරන්න එපා. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද තිබෙන ප්‍රශ්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ. මම අවුරුදු 23 ක් දේශපාලනය කරලා තිබෙනවා. මැතිවරණ හයක් මම ජයග්‍රහණය කරලා තිබෙනවා. මැතිවරණ හයකට මම ඉදිරිපත් වෙලා තිබෙනවා. මට කවුරුත් තර්ජනය කරලා, ගහන්න ඇවිල්ලා නැහැ සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් මොකක්ද ප්‍රශ්නේ? ඔබතුමාට ප්‍රශ්නයක් නැහැනේ ඉතින්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මේගොල්ලෝ දූෂණ කරලා, වංචා කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. 36(1) යටතේ අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න. 36 (1) යටතේ කථා කරන්නේ ඔබතුමා ඔය -

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Electricity and Energy, Provincial Roads, Housing and Construction, Water Supplies and Drainage, Social Welfare and Urban and Estate Infrastructure Facilities)

ගරු සභාපතිතුමනි, ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, අපේ නෝනා ගැන, මහරගම නගරාධිපතිතුමිය ගැන කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා කථා කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

නගරාධිපතිතුමිය රැස්වීමකදී ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාට ගහන්න ගියාය කියලා. සම්පූර්ණයෙන්ම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියලා ඉල්ලා සිටිනවා. අපේ නගරාධිපතිතුමිය එසේ හැසිරෙන නෝනා කෙනෙක් නොවෙයි. ඒ නිසා ඒක හැන්සාඩ් එකෙන් කපා හරින්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සියලුම අනවශ්‍ය ප්‍රකාශ හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා. සියලුම අනවශ්‍ය ප්‍රකාශ. ගරු මන්ත්‍රීතුමන්ලා මේ අනවශ්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්න එපා. කථා කරන්න නිදහස තිබුණාය කියලා. මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැගී සිටියේය.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා දැන් ඉස්සෙල්ලාත් කිව්වා නේ. වාඩි වෙන්න. ඔබතුමාට ප්‍රශ්නවල ඉවරයක් නැහැ. ඔබතුමා ඉස්සෙල්ලාත් විනාඩි දෙකක් විතර -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මගේ දේශපාලන ජීවිතයේ මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ ඔතැන. ඔබතුමාට කථා කිරීමේ ප්‍රශ්නයක් මෙතැන නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙයාට ගිය රට ද එහෙනම්. මෙයාගේ සංවිධායකකමත් නැති වෙලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මගේ කාලය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට 36(1) කියලා ඔබතුමාගේ කථා කිරීමේ අයිතිය සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ, ඔබතුමාට. ඔබතුමාට කථා කිරීම පිළිබඳව ගැටළුවක් ඇති වුණේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න බැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා. කරුණාකර වාඩි වෙන්න ඔබතුමා. 36(1) කියලා ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඔබතුමාට කථා කිරීම පිළිබඳව ගැටළුවක් ඇති වුණේ නැහැ නේ? ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්නේ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය මන්ත්‍රීතුමා, ඔබතුමාව දැන් මම සභාවෙන් ඉවත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, අපේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාත් එක්ක ගෙවල්වලට වෙලා විසඳගන්න ඕනෑ ප්‍රශ්න මෙතැනට ගෙනැල්ලා අපට අපහාස කරන්න දෙන්න පුළුවන්ද? අපි දේශපාලන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අපහාසයක් වී තිබෙනවා නම් මම ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒවාට ඉඩ දෙන්න එපා ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට යම්කිසි අපහාසයක් තිබුණා නම් එම ප්‍රකාශය මම හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මෙම සභාවේ මම පළමුවෙන්ම අවධානය යොමු කරනවා. ගරු සභාපතිතුමා යම්කිසි නියෝගයක් පනවනවා, ඊළඟට කථා කරන්නේ කවුද කියලා. එයට යම්කිසි අවනත වීමක් සභාවේ තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී බාධා කරන්නේ නැහැ. ඒ දන්නේ නැති දේවල් ඉගෙන ගන්න. සභාවේ කාලය නාස්ති කරන්නේ නැතිව.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හරියට සංවර වෙලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මගේ පැහැදිලි කිරීම. මම විශේෂයෙන්ම පාඩු ලබන රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් කථා කරන්නයි මේ පැහැදිලි කිරීම ඉල්ලා තිබෙන්නේ. මම ඔබතුමා මගින් මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේත්, සමස්ත ජනතාවගේත් විශේෂයෙන්ම රජයේත් අවධානය යොමු කර සිටිනවා. ගරු සභාපතිතුමනි, කටාන ආසනයේ පවතින ගුවන් තොටුපලට අනුබද්ධව මිහින් ලංකා ගුවන් සේවය ක්‍රියාත්මක වෙනවා. මෙය අපි ද්වේශයෙන් කරන පැහැදිලි කිරීමක් නොවෙයි. අපි සියලු දෙනාම රටක් හැටියට ඉස්සරහාට යන කොට, අපි ආර්ථික වශයෙන් ඉතාම පල්ලෙහාට වැටුණු වකවානුවක් තමයි දැන් ගත කරන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමා, මෙතුමියට මේවා පාර්ලිමේන්තුවේ ගිහිල්ලා කියන්න කිව්වා නම් හරි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වර්ෂ 2012 දී අලාභය බිලියන 27% ක් වන කොට 2013 වර්ෂයේ බිලියන 28.6% ක් බවට වර්ධනය වෙලා තිබෙනවා. මේ මෙහෙයුම් අලාභය. ඉතින් මෙවැනි තත්ත්වයක අපි මේ ගුවන් සේවය පවත්වාගෙන යන කොට මේ වසර පුරාවටම අපි කිසිම ප්‍රගතියක් දක්වන්න සමත් වෙලා නැහැ. මෙහිදී ඇත්ත වශයෙන්ම අපි දන්නවා. රජය විදේශ සංචාරවලට මේ ගුවන් සේවය පාවිච්චි කරනවා. අපි දන්නේ නැහැ, කොපමණ ප්‍රමාණයකින් මේ වියහියදම් ගෙවනවාද? ඒ යන වියදම කොපමණද කියලා විනිවිදභාවයක් නැහැ. ඒ විතරක් නොවෙයි - (බාධා කිරීම්)

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පළාත් සභාවේ මැනේජ්මන්ට් එකක් දාමු. ඒක ද කියන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා මාර්ගයෙන් මේ පළාත් සභාවට බලපාන දෙයක් තමයි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. පුංචි කාලයක් තිබෙන්නේ එතුමියට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පළාත් සභාවටත් මේක බලපානවා. මොකද, පළාත් සභාව මධ්‍යම රජයට සම්බන්ධ ආයතනයක්. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් රටක් හැටියට - විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ තමයි මේවා පිහිටලා තිබෙන්නේ. මෙම ආදායම් වැඩි වර්ධනය කර ගත්තේ නැත්නම් අපි ඉතාම පසු බහින ජාතියක් බවට පත් වෙනවා. ඉතින් මෙහිදී අපි හැම කෙනෙක්ම මේ ගැන කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේවාට බාධා කරලා වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු කහටපිටිය මැතිතුමා, කරුණාකරලා ඔබතුමා පස්සේ එන්න ආසනයට. පස්සේ සීට් එකට ගිහිල්ලා එන්න. ඔබතුමා මූලාසනයට බාධා කළා. කරුණාකරලා පස්සට යන්න. ඔබතුමාගේ ආසනයට දැන් එන්න බැහැ. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ ඔබතුමා ජ්‍යෙෂ්ටයි නේද? කථාව මැද්දේ පනින්නේ. යන්න. යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. කරුණාකරලා ඔබතුමා ආදර්ශවත් වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආදර්ශවත් වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හැමදාම රීති කථා කරනවා. නමුත් ඔබතුමා රීති කඩනවා. ඔබතුමා ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔන්න රීති පොත වැරදුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔන්න විපක්ෂයේ මන්ත්‍රීවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලැජ්ජා වෙන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරයෙක්. ඔබතුමා ලැජ්ජා වෙන්න ඕනෑ. 68 (4) (ආ) - අහගන්න. (බාධා කිරීම්)

"මූලාසනයත්, කථා කරමින් සිටින මන්ත්‍රීවරයාත් අතරින් ගමන් නොකළ යුතුයි."

ඔබතුමා හැමදාම රීති ගැන කථා කරනවා. කරුණාකරලා වාඩි වෙන්න. කොහේද යන්නේ? කරුණාකර සීට් එකට යන්න. විහිළුවක් කර ගන්න එපා මේක. (බාධා කිරීම්) ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කරුණාකර (බාධා කිරීම්) මේ සභාව හැල්ලු කරන්න එපා. (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සභාපතිතුමාට අවනත නැත්නම් එළියට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මිහින් ලංකා ගැන කථා කරන්න කලින් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු රීති පොත කියවලා එන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය පොඩ්ඩක් වාඩි වෙන්න. කරුණාකරලා වාඩිවෙන්න. මම මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, මනෝ ගනේෂන් මන්ත්‍රීතුමාව එළියට දාන්න. දාලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් මන්ත්‍රීතුමා පොඩ්ඩක් - මම මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මේ නිවේදනය නිකුත් කරන්නේ. අලුත් මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. මේ පළාත් සභාවට පත් වුණු. මම ඒ අයටත් එක්ක මේ කියන්නේ. මම කනගාටු වෙනවා. කිත්සිරි කහටපිටිය පළාත් සභාවේ ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරයෙක්. හිටපු විපක්ෂ නායකවරයා. ඔබතුමා හැමදාම රීති ගැන කථා කරන්නේ. නමුත් ඔබතුමා මේ 68 (4) (ආ) රීතිය ගැන දන්නවා. මූලාසනයත්, කථා කරන මන්ත්‍රීතුමාත් අතර නොයා යුතුය කියලා තිබෙනවා ඒකේ. පැහැදිලිව තිබෙනවා. ඔබතුමා කියවන්න. ඔබතුමා රීති ඉදිරිපත් කරනවා නේ? මම ලජ්ජා වෙනවා ඔබතුමා ගැන.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක දැකලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමා, ඔබතුමා කියන විධියට මන්ත්‍රීවරයා කථා කරලා අවසන් වන තුරු එළියට වෙලා ඉන්න ඕනෑද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් පසුපස ආසනයක ඉන්න. කථා කරන වෙලාවට ඉන්න වෙනවා. ඒක තමයි රීතිය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීතිය තියෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රීති කාරක සභාවේ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම ඉන්න ඕනෑ. ඕක දන්නේ නැද්ද අවුරුදු ගණනක් ඉඳලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා ඒ දේවල් කරන්න එපා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කොහේද තියෙන්නේ ඉන්න ඕනෑ කියලා එතුමියගේ කථාව ඉවර වෙනකල්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට සීට් තිබෙනවා නේ ඕනෑ තරම්. වාඩි වෙන්න පුළුවන් නේ. ඔබතුමා එළියෙන් හරි ඉන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම කොහොමද මගේ සීට් එක - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජ්‍යෙෂ්ට මන්ත්‍රී. හිටපු විපක්ෂ නායක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම වාගේ මේ සභා රීති ගැන ගරු කරන්න. මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ අතිනුත් පොඩි වැරදීමක් සිද්ධ වුණා. ඒ ගැන කනගාටු වෙනවා. ඔබතුමා ඇත්ත වශයෙන්ම ඒ වැරැද්ද කරන්න එපා. මීට පසුව වැරදි පුළුවන් තරම් අවම කර ගන්න. කථා කරන මන්ත්‍රීවරයාට හා මූලාසනයට බාධා වන අයුරින් සභාවේ හැසිරෙන්න එපා. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. පළාත් සභාවේ හිටියා කලින්. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට තව විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි ගරු සභාපතිතුමනි. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට කියන්නේ. වැරදි කවුරු කළත් වැරදි තමයි. ඒක අපි පිළිගන්නවා. ඇත්ත වශයෙන්ම මම විශේෂයෙන් පෙන්වා දෙන්න කැමැතියි. අපේ දුම්රිය සේවය, මගී ප්‍රවාහනය. මේ සෑම අංශයක්ම පාඩු ලබන තත්ත්වයට දවසින් දවස පත් වෙලා තිබෙනවා. ඒ එක්කම ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මැයි දිනවලට බස් රථ දහස් ගණනින් ශ්‍රී ලංගමයෙන් අරගෙන ගියා. මේ සම්බන්ධයෙන් ගෙවීම් කරලා තිබෙනවාද කියන එක අපි දන්නේ නැහැ. විනිවිදභාවයක් අපට දකින්න හම්බ වුණේ නැහැ. ඒ නිසා මා මේ සභාවේ සභාපතිතුමා හැටියට ඔබතුමා මගින් රජයේ අවධානය යොමු කරනවා මීට වැඩිය අවධානයෙන් මේ සියලුම ආයතන ගැන කටයුතු කරන්න කියලා.

# පළාත් සභාවේ කටයුතු - I
## PROVINCIAL COUNCIL AFFAIRS - I

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, "අද දින පොදු කටයුතු සඳහා වෙන් කළ දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය" යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු - II
PROVINCIAL COUNCIL AFFAIRS - II

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

*ගරු සභාපතිතුමනි, "අද දින න්‍යාය පත්‍රයේ වැඩ කටයුතුවලදී රීති අංක 57(1), 57(4), 57(5) හා රීති අංක 86(2), 91(1) හා රීති අංක 110 හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය" යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී මෙම ගරු සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.25 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspended untill 11.25 a.m. and then resumed.*

# මුදල් ප්‍රකාශය සංශෝධනය - 2014
FINANCIAL STATEMENT AMENDMENT -2014

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

ගරු සභාපතිතුමනි, *"2014 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රකාශ සංශෝධනය - 2014 අනුමත කළ යුතුය"* යන යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නම්. ගරු සභාපතිතුමනි, VI වන පළාත් සභාවේ ගරු අමාත්‍යවරු දිවුරුම් දීමත් සමග අමාත්‍යාංශ විෂයයන් සංශෝධනය වී තිබෙනවා. ඒ අනුව 2014 මුදල් ප්‍රකාශයේ එක් එක් අමාත්‍යාංශවලට වෙන් කරන ලද මුදල් විෂයයන් සංශෝධනය වීමත් සමග නැවත සකස් කළ යුතු වෙනවා. එහෙයින් 2014 මුදල් ප්‍රකාශය සහ 2013 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා සංශෝධන මුදල් ප්‍රකාශය සහ සංශෝධන විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 2014 මුදල් ප්‍රකාශයේ සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන හතලිස් තුන් දහස් හත්සිය හතක් වූ අතර, ඉන් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන තිස් අට දහස් හැට තුනක්. ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන පන් දහස් හයසිය හතලිස් හතරක් වුණා. මෙම මුදල් ප්‍රකාශ සංශෝධනයෙන් එම මුළු සංඛ්‍යාවෙහි කිසිදු වෙනසක් සිදු නොවන අතර, අමාත්‍යාංශ පහ අතර, ඒවාට වෙන් කර ඇති මුදල් පමණක් සංශෝධනය වෙනවා. ඒ අනුව ප්‍රාග්ධන වියදම් යටතේ අමාත්‍යාංශවලට වෙන් කර ඇති පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සංශෝධනය වෙනවා. එසේම විෂයයන් සංශෝධනය වීම මත කාර්ය මණ්ඩල වෙනස් වීමක් ද සිදු වන හෙයින් පුනරාවර්තන වියදම් ද සංශෝධනය වෙනවා. නමුත් පළාත් සංවර්ධන වැඩ සටහන යටතේ අමාත්‍යාංශ පහට වෙන් කර ඇති මුදල්වල වෙනසක් සිදු වෙන්නේ නැහැ. අමාත්‍යාංශ පහේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු වෙනස්වීම්වල සහ පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුවල වෙනස්වීම්වලට අදාළ සියලු විස්තර සභාව වෙත ඉදිරිපත් කර, 2014 සංශෝධන මුදල් ප්‍රකාශයේ දක්වා තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අප දන්න විධියට අමාත්‍යාංශ විෂයයන් කිහිපයක් පමණයි මාරු වෙලා තිබෙන්නේ. ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් එහෙම වෙනස් වෙන්න හේතුව? දැන් ප්‍රාග්ධන වෙනස් වීම් වෙන්නේ නැහැ නේ? ඒ නිසා මොකක්ද එහෙම වෙන්න හේතුව විධියට -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකේ පැහැදිලිවම කියනවා. පුනරාවර්තන වියදම් නිලධාරීන්ගේ වෙනස් වීම නිසා වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ඒක හරි. ප්‍රාග්ධන වියදම් පිළිබඳව.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ වාගේම විෂයයන් මාරු වීම. දැන් මුළු ගණන එකයි. දැන් විෂයයන්වල වෙනස්වීම් වලදී සංස්කෘතික විෂය උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාට ගියා. එතකොට ඒකට වෙන් කරලා තිබුණු මුදල් එතැනට වෙනස් වෙන්න ඕනෑ. ඒ නිසා විතරයි ප්‍රාග්ධන වියදම්වල වෙනස් වීම වෙන්නේ. ඒක සුළු වෙනසක්. මේක පෙන්නලා තිබෙන්නේ ඒ අනුව.

***අනතුරුව ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Consequently, Question put and agreed to.*

## මුදල් ප්‍රකාශ සංශෝධනයට අදාළ විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය
## APPROPRIATION (AMENDMENT) STATUTE RELEVANT TO FINANCIAL STATEMENT AMENDMENT

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,*"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශ සංශෝධනය - 2014 ට අදාළ වූ 2014 අංක .... දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය අනුමත කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා. මේ මුදල් වියදම් කිරීම සඳහා අවශ්‍ය කරන විසර්ජන ප්‍රඥප්තිය.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2013 වර්ෂය
## AMENDING THE LIMITATIONS OF PROVINCIAL COUNCIL ADVANCE ACCOUNTS – YEAR 2013

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,*"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2013 නමැති උප ලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමාවන් සංශෝධනය කිරීමේදී 2012 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින් ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,*

*එම උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කළ යුතුය"* යන යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, පළාත් සභා මුදල් ප්‍රකාශනයේ දෙවන උපලේඛනයේ අත්තිකාරම් ගිණුම් කටයුතු දැක්වෙනවා. ඒ අනුව පළාත් සභා නිලධාරීන්ට නොයෙක් ණය ලබා දීම සඳහා අත්තිකාරම් සීමා එහි දැක් වෙනවා. එම සීමා යටතේ ණය දිය හැකි උපරිම මුදල් දක්වන සීමාව වර්ෂය තුළ ණය අය කර ගත යුතු සීමාව සහ වර්ෂය අවසානයේ පැවතිය යුතු ණය ශේෂයන් පිළිබඳව සීමාවන් පෙන්නුම් කරයි. 2012 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය අනුව මෙම සීමා සංශෝධනය කිරීමට අවශ්‍ය නම් එම සංශෝධන අදාළ වර්ෂය තුළ පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර, ඒවා ඊළඟ වර්ෂයේ මැයි 31 වන දිනට පෙර සභාවට ඉදිරිපත් කළ යුතුයි. ඒ අනුව 2013 වර්ෂයේ පහත කාර්යාල පහේ දක්වා ඇති අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී අතර, එය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධ සියලු විස්තර සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පොදු කටයුතු පිළිබඳ මුදල් ප්‍රකාශන සංශෝධන - 2014 යෝජනාවත්, මුදල් ප්‍රකාශනය සංශෝධන පිළිබඳ විසර්ජන ප්‍රඥප්තිය යෝජනාවත්, පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2013 වර්ෂය යන යෝජනා තුන ඒක ඡන්දයෙන් සභා සම්මත වූ යෝජනා වශයෙන් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මීළඟට ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් වූ ස්තුති යෝජනාව පිළිබඳව කල් තබන ලද විවාදය ආරම්භ කිරීමට අවස්ථාව.

## ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු ණ්ඩුකාරතුමාට ස්තූතිය පළ කිරීමේ යෝජනාව
MOTION FOR THANKING THE HON.GOVERNOR ON BEHALF OF PRESENTATION OF THE POLICY STATEMENT

2014.04.30 වන දින හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.

*"ජනවරමින් නැවතත් තහවුරු කළ අපරිමිත ජනතා විශ්වාසයට ගරු කරමින් හා සියලුම දේශපාලන පක්ෂවල සාධාරණ හා ඵලදායී දේශපාලන අදහස්වලට ගරු කරමින්ද, බස්නාහිර පළාතේ මානව හා භෞතික සම්පත් ඒකරාශී කර දැනට රට පුරා ක්‍රියාත්මක දැවැන්ත ජාතික සංවර්ධන වැඩ පිළිවෙළට සමගාමීව මධ්‍යම රජයේ සහාය තවදුරටත් ලබා ගනිමින් ක්‍රියාත්මක කරන සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් සංවර්ධන ප්‍රතිලාභ සැමට බෙදී යන අන්දමින් ද බස්නාහිර පළාත් ජනතාවගේ ඒකායන බලාපොරොත්තුව වූ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හි නාගරික හා ග්‍රාමීය හා වතු අංශයන්හි පොදු මහජනතාවගේ දියුණුව සැලසීම උදෙසා, පළාත තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කර පළාත් ජනතාවගේ ආර්ථික, සමාජ, සංස්කෘතික, ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය බස්නාහිර පළාතේ පළාත් සභාවේ VI වන පළාත් සභාව සඳහා සකස් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය 2014 අප්‍රේල් මස 30 වන දින එනම් (අද දින) මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර අල්හාජ් එස්. අලවි මව්ලානා මැතිතුමා වෙත මෙම පළාත් සභාව මහත් ගෞරවයෙන් යුතුව සිය ස්තූතිය පළ කර සිටින්නීය."*

[පූ.භා. 11.33]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, පළමුව මම ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න පෙර දෙවන අවස්ථාවටත් බස්නාහිර පළාත් සභාවට පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට පත් වීම සඳහා අවස්ථාව සලසා දුන් කඩුවෙල ප්‍රමුඛ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුති කරන්නත් මේ වෙලාවේ මම විනාඩියක අවස්ථාවක් ගන්නවා. විශේෂයෙන්ම පසුගිය අවස්ථාවේ මේ ලැයිස්තුවේ 24 වැනියාට මම පත් වුණේ. ඒ වාගේම මේ අවස්ථාව වන කොට, මෙවර පළාත් සභා මැතිවරණයේදී ආණ්ඩු පක්ෂය විධියට අපට යම් යම් අසීරුතා තිබුණා වුණත් හිටපු මන්ත්‍රීවරු රාශියක් මෙම මැතිවරණයෙන් පරාජයට පත් වෙද්දී, කඩුවෙල ප්‍රමුඛ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව මගේ ජයග්‍රහණය වෙනුවෙනුත් 29,587 ක මනාප ප්‍රමාණයක් ලබා දීලා කොළඹ දිස්ත්‍රික් ලැයිස්තුවේ 10 වන ස්ථානයට පත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්නේ, අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ගත්තාම හිටපු අමාත්‍යවරයෙක් විධියට උපාලි කොඩිකාර ඇමතිතුමාගේ ඡන්ද ප්‍රමාණයත් එක්ක, ඊට ආසන්නයෙන් ඡන්ද 10,362 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වැඩි කර ගත්ත මන්ත්‍රීවරයා විධියට තමයි මාව තේරිලා තිබුණේ. හිටපු අය අතර. ඒ නිසා මම හිතනවා, මේ මැතිවරණයේදී අති විශාල ධන ස්කන්ධයක්, වෙන බලයන්, පවුල් බලය, දේශපාලන වෙනත් බලයන්, වෙනත් සම්පත් නොමැතිව සාමාන්‍ය ජනතාවගේ හද ගැස්මත් එක්ක ඉඳලා වැඩ කටයුතු කරපු නිසා, හරි දේ නිවැරදිව කරපු නිසා අපේ ජයග්‍රහණයට මේ ප්‍රදේශයේ, දිස්ත්‍රික්කයේ ජනතාව සහාය දුන්නාය කියලා. ඒ පිළිබඳව ජනතාවටත්, විශේෂයෙන් මේ තැනට එන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය, මග පෙන්වීම, දායකත්වය වාගේම බැසිල් රාජපක්ෂ ගරු අමාත්‍යතුමාගේ සහායත්, ශක්තියත් මගේ

ජයග්‍රහණයේදී ලබා දුන්නා. එතුමන්ලා ඇතුළු පක්ෂයට, පක්ෂ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු හැමෝටමත් මම මේ වෙලාවේ ස්තූති කරන්න අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා, - විශේෂයෙන්ම අපි දන්නවා ආණ්ඩුවක් පවත්වාගෙන යන කොට ජනතාවගේ කැමැත්ත බොහෝ වෙලාවට අඩු වෙන්න හේතු වෙනවා. අර කථාවක් තිබෙනවා. නිතර දකින කුකුලාගේ කරමල සුදු පාටට පේනවා කියලා. නමුත් අපි දැක්කා පසුගිය මැතිවරණයේදී මේ රටේ ජනතාව මොන මොන හේතු කාරණා තිබුණා වුණත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළ, ඒ වාගේම එතුමා රට තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති වාගේම බස්නාහිර පළාත් සභාව විධියට අපි කර ගෙන ආපු වැඩ පිළිවෙළ පිළිබඳව විශ්වාසය තියලා, මේ පළාත් සභාවේ බහුතරය එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දීලා තිබෙනවා. ඒ බහුතර බලය ලබා දෙන්න මේ රටේ ජනතාව කටයුතු කළේ බස්නාහිර පළාත් සභාවේ අපේ ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයත්, ඒ අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම අනුව පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ පළාත් සභාවේ කටයුතු කර ගෙන යාම නිසාත් කියලා අපි විශ්වාස කරනවා. ඒ ජනතාව බස්නාහිර පළාත් සභාවට අලුතින් ජනතාවාදී වැඩ පිළිවෙළකට ඉස්සරහාට යන්නත්, මම හිතන්නේ යම් යම් මග පෙන්වීම් මේ මැතිවරණයේ ඡන්ද ප්‍රකාශ කිරීම හරහා අපට කියලා තිබෙනවා.

විශේෂයෙන්ම ආණ්ඩුකාරතුමාගේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් වෙන්නේත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මග පෙන්වීම, උපදෙස් අනුව. මේ රටේ යුද්ධයට පස්සේ තිබෙන ලොකුම ප්‍රශ්නය අපි විශ්වාස කරන්නේ දිළිඳුභාවයයි. එහෙම නැත්නම් ජනතාවගේ ආදායම් තත්ත්වයන් පහළ තියෙන එක තමයි රටක තිබෙන ඊළඟ ලොකුම ප්‍රශ්නය. මේ තිබෙන ලොකුම ප්‍රශ්නය විසඳන්න මේ රටේ මධ්‍යම රජය විධියට අතිගරු ජනාධිපතිතුමාත්, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත්, ආර්ථික කටයුතු අමාත්‍යාංශය විධියට වැඩ කටයුතු කර ගෙන යන කොට මේ රජය භාර ගන්න කොට මේ රටේ 25% ක 30% ක තිබුණු දිළිඳුභාවය අද 6% ට 7% ට අඩු වෙන්න බොහෝ වැඩ කොටසක් මධ්‍යම රජය සිදු කළා. මේ පළාත් සභාවලින් ප්‍රධාන පළාත් සභාව අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ මග පෙන්වීම අනුව ඒ සඳහා දායකත්වය දෙමින් යම් යම් වැඩ කොටස් සිද්ධ වුණා. ඒ වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යන්න මේ පළාත් සභාව තුළත්, විශේෂ නායකත්වයක්, දායකත්වයක් ලබා දෙන බව මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මුල් හැඳින්වීම තුළ තිබෙනවා. කුසගින්න හා අන්ත දුගී බව තුරන් කිරීම, ද්විතියික අධ්‍යාපනයේ සර්ව ව්‍යාප්තිකරණය. 33% ක් වූ ළමා මන්ද පෝෂණ අනුපාතය 12% දක්වා අඩු කිරීම හා 76% ක් වන ආයු අපේක්ෂණය වසර 80 ක් දක්වා ඉහළ දැමීම වාගේම නාගරික ප්‍රදේශවල පිරිසිදු ජල පහසුකම් සඳහා වන ප්‍රවේශයන් 65% සිට 90% දක්වා ඉහළ නැංවීම ආදී කරුණුවලින් මේ පළාත් සභාව තුළ ජනතාවට වඩා දැනෙන කාරණා රාශියක් වෙනස් කරන්න මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙනවා. ඒ වාගේම දැනට 2010 වර්ෂයේ ඇමරිකන් ඩොලර් 2400 කට තිබුණු ඒකපුද්ගල ආදායම 2016 වන කොට ඇමරිකන් ඩොලර් 4000 දක්වා වර්ධනය කරන්න - එය ඊටත් කලින් වෙන්න ඉඩකඩ තිබෙනවාය කියන කාරණා සඳහන් වෙනවා මේ වන කොට. එවැනි වෙනසකට යන්න මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මධ්‍යම රජයත් එක්ක ගැලපිලා යම් වැඩ පිළිවෙළක් හරහා ඉස්සරහාට යන්න අපේ ප්‍රධාන අමාත්‍යතුමා හරහා කටයුතු සිද්ධ වෙනවාය කියන කාරණාව තහවුරු කරලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් අපේ ගරු ආණ්ඩුකාරතුමන් පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා බස්නාහිර පළාත් සභාව මේ රටේ මධ්‍යම ආණ්ඩුවට පස්සේ දෙවනුව තිබෙන ප්‍රධාන පළාත් සභාව විධියට මේ පළාතේ ජනතාවගේ අවශ්‍යතාවයන් වඩා හොඳින් හඳුනාගෙන, විශේෂයෙන්ම දිළිඳුභාවය තුරන් කරලා ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීලා, ඔවුන් ඇති හැකි අය බවට පත් කරන්න, ඔවුන්ට ස්වශක්තියෙන් නැඟී සිටීමට අවශ්‍ය මග පෙන්වන්න අවශ්‍ය පියවරයන් ගන්න සූදානමින් ඉන්නවාය කියන කාරණය තමයි මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ තිබෙන්නේ. විශේෂයෙන්ම මේ කාරණා එකින් එක පැහැදිලි කරන්න කාලය ප්‍රමාණවත් වෙන්නේ නැති නිසා මම මේ වෙලාවේ බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර අල්හාජ් අලවි මව්ලානා මැතිතුමාට අපේ සුභාශිංසනය පිරි නමනවා.

එතුමා කාලයක් තිස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට කටයුතු කරලා තියෙනවා. ඒ වාගේම එතුමා වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති බල මණ්ඩලවල නායකත්වයේ යම් වගකීම්

[ගරු ජගත් කුමාර]

තවමත් දරමින් මේ රටේ සාමාන්‍ය ජනතාවගේ, වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවයන් සොයා බලන ගමන් රටේ ප්‍රධාන ධූරයක් දරමින් කටයුතු කරන අතර තමයි එතුමා සිය ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේ.

ගරු සභාපතිතුමනි, පැහැදිලිව රට ගෙන යන විධිය, පැහැදිලිව රටට අවශ්‍ය මොන වාගේ වැඩ පිළිවෙළක්ද කියන කාරණාව ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සඳහන් වෙලා තිබෙන නිසා අපි විශ්වාස කරනවා, ඉදිරි කාල පරිච්ඡේදය තුළ මේ රටේ අනාගතය යහපත් වෙන්න, ජනතාවට වඩා හොඳ තැනකට යන්න පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු විධියට අපි එකට එකතු වෙලා කටයුතු කළොත් අපට ඉදිරියේදී ජනතාවාදී පළාත් සභාවක් බවට බස්නාහිර පළාත් සභාව පත් කරන්න හැකියාව ලැබෙනවා. ඒ සඳහා ඉදිරිපත් කරපු මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේදී ගරු ආණ්ඩුකාරතුමන්ට කෘතවේදී ස්තුතිය - එතුමාගේ නායකත්වයත් විශේෂයෙන්ම එතුමා පරිණත දේශපාලනඥයෙක් වාගේම පරිණත රාජ්‍ය තාන්ත්‍රිකයෙක් විධියට බස්නාහිර පළාත් සභාවට ලබා දෙන මග පෙන්වීම, එතුමා බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් කරන දායකත්වය, කැප කිරීම අපේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම සඳහා ලබා දෙන දායකත්වයත් ඒ සියල්ල පිළිබඳව මම අල්හාජ් අලවි මව්ලානා ආණ්ඩුකාරතුමාට ආණ්ඩු පක්ෂයේ ප්‍රසාදය, ගෞරවය පිරිනමමින් මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට මගේ ප්‍රණාමය පළ කරමින් මාගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සියලු දෙනාටම සුභ දිනයක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම විනාඩියක කාලයක් අරගන්නවා. බස්නාහිර පළාත් සභාවේ VI වන පළාත් සභාවේ මා නියෝජ්‍ය සභාපති ධූරය දක්වා ගෙන ඒමට විශාල කැප කිරීමක් කරපු හොරණ සහ කළුතර දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවට මගේ ගෞරවය ප්‍රණාමය මම මේ අවස්ථාවේදී මුලින්ම පිරිනමනවා. ඒ වාගේම මේ අවස්ථාවට මග පෙන් වූ නායකත්වය දුන් අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාවත් පක්ෂයේ ලේකම්තුමා ඇතුළු සියලුම නායකයන් සිහිපත් කරමින් ගරු ආණ්ඩුකාරතුමා දුන් සහයෝගය ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, මගේ ගරු සභාපතිතුමා, ගරු අමාත්‍යවරු, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දැක් වූ සහයෝගය පිළිබඳව මම නැවත නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේදී මේ සභාවේ වැඩ කටයුතු කරගෙන යන්නට මේ දුන් සහයෝගයම ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින්, න්‍යායපත්‍රයානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 11.47]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, 2009 ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිය පළ කිරීමේ යෝජනාවට. එහි මුලින්ම සඳහන් වෙනවා,

*"ජනතා විශ්වාසයට ගරු කරමින් ජාති, ආගම්, කුලමල භේදවලින් තොරව සියලුම දේශපාලන පක්ෂවල සාධාරණ සහ ඵලදායී දේශපාලන අදහස්වලට ගරු කරමින් ......."* කියන ටික සඳහන් වෙනවා.

මීට වඩා මම ඒක කියවන්න යන්නේ නැහැ. දැන් පසුගිය අවුරුදු පහ තුළ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කියපු ආකාරයෙන් කිසිම දෙයක් සිදු වුණාද කියන එක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ඒකේ ඉතුරු ටික කිව්වේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක මට කියන්න අවශ්‍ය නැහැ. ඔබතුමාට අවශ්‍ය නම් ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකත් කිව්වොත් තමයි තේරෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ ආගම්, කුලමළ භේද - ගිය අවුරුදු 05 තුළම සිද්ධ වුණේ මේවා නොවෙයිද කියලා මම අහන්නේ. ගිය අවුරුදු 05 තුළම සිදු වුණේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආගම්, කුලමළ භේද අවුස්සන එක නොවෙයිද? තමන්ගේ රජයේ පැවැත්ම සඳහා සහ පළාත් සභාවේ ජය තහවුරු කර ගැනීම සඳහා මේක නොවෙයිද වුණේ කියන එක තමයි මම අහන්නේ. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මෙවර ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

*"නිදහසට පසු අප රට සංවර්ධනය කිරීම සඳහා විවිධ රජයන් විසින් හඳුන්වා දුන්නා ජාතික ඉලක්ක සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක් කරා ගෙන ඒමට ඒ රජයන්ට නොහැකි විය"* කියලා.

ඒ කියන්නේ, ඊට පහළින් තිබෙනවා, *"1977 සිට 2005 දක්වා වකවානුව තුළ ආර්ථික සංවර්ධනයේ දක්නට ලැබෙන පැහැදිලි ලක්ෂණයක් වූයේ එය විශාල වශයෙන් ග්‍රාමීය ප්‍රදේශ මග හැර"* - නාගරික ප්‍රදේශවල පමණක් සංවර්ධනයට යොමු වුණා කියන එක තමයි ඒකෙන් කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1977 සිට 2005 වනකල් වුණු සංවර්ධනය ගැන අපි නැවත වරක් පැහැදිලි කරලා දෙන්න ඕනෑ නැහැ. නමුත් මේ යෝජනාවේ සඳහන් වන ආකාරයට මේ කාල වකවානු තුළ තිබෙන සංවර්ධනය ගැන කථා කළොත් අද පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාවක් එනවා. කුඩු සම්බන්ධයෙන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔන්න මැක්කාගේ කථාවට එන්න යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කුඩු සම්බන්ධයෙන් අද පාර්ලිමේන්තුවට යෝජනාවක් එද්දී මහින්ද චින්තනයේ කියනවා, ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආශ්චර්ය කියලා. පසුගිය කාල වකවානුව තුළ ගත්තාම මේ රට තුළ නැගී එන ආශ්චර්ය මොකක්ද? නැගී එන ආශ්චර්ය වුණේ මිනී මැරුම්, මංකොල්ලකෑම් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔයගොල්ලන්ගේ එක්කෙනෙක් හිරේ නේද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පහරදීම් -

[සභාවේ ඝෝෂා]

පහරදීම්. කුඩු සම්බන්ධයෙන් මේ රට තුළ ආශ්චර්යක් ඇති වෙලා තිබෙනවා. ඒ ආශ්චර්යට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආශ්චර්යයට වග කියන්න ඕනෑ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු. මේ ආශ්චර්යයට මේ රට පාලනය කරන ඉහළම පුටුවේ ඉන්නේ කෙනාගේ ඉඳලා ගමේ ඉන්න මේ අයගේ හෙංචයියලාත් ඒකට වගකියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එහෙම කියන්නේ, ඊයේ පෙරෙයිදාත් ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පාරේදී ඔළුවට වෙඩි තියලා නාගරික මන්ත්‍රීවරයෙකු මැරුවා. මීට පෙරත් ඡන්දය කාලයේදී මන්ත්‍රීවරයෙකුව ඝාතනය කළා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ව. (බාධා කිරීම්) හැබැයි මේවා කරන කිසිම කෙනෙකුව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නීතියේ රැහැනට ගෙනැල්ලා නැහැ. තවම නීතියේ රැහැනට අරගෙන නැහැ. මෙන්න මේක තමයි මේ කියන ආශ්චර්යය. මේ කියන ආශ්චර්යය මෙන්න මේක තමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

89 ගැන දැන් කථා කරලා වැඩක් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒත් එක්කම කියනවා, රටේ ජනතාවට අභිමානයෙන් යුත් ජීවිතයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් රටේ ජනතාවට අභිමානයෙන් යුත් ජීවිතයක් තිබෙනවාලු. මේ රටේ දේශපාලනය කරන අයට අභිමානයෙන් යුක්තව ජීවත් වෙන්න පුළුවන්. රටේ සාමාන්‍ය ජනතාවට පුළුවන්ද? අඩු ගාණේ තුන් වේලවත් කන්න පුළුවන්ද? දෙවේල කන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඡන්දය කාලයේ නම් පොඩ්ඩක් කෑවා. මොකද, මෙතුමන්ලා ගිහිල්ලා දිගට හරහාට බෙදුවා. ඒ බෙදපු නිසා ජනතාවට සුමනා දෙක තුනක් බඩ පිරෙන්න කෑවා. හැබැයි ඊළඟ අවුරුදු පහ ජනතාවට බඩගින්නේ තමයි ඉන්න වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒත් එක්කම තිබෙනවා, සම්ප්‍රදායන්ට ගරු කරන සැබෑ ශ්‍රී ලාංකික සංස්කෘතියක්. කැසිනෝ සංස්කෘතිය. මේක තමයි මේ කථා කරන සංස්කෘතිය.

[සභාවේ ඝෝෂා]

අද කැසිනෝ සංස්කෘතිය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා ඉන්න කාලේ නේ ගෙනාවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ තාත්තා අත ඉස්සුවේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කාලේ කරපුවා දන්නේ නැත්නම් තාත්තාගෙන් අහගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ රජයේ කඩිනම් - (බාධා කිරීම්) මම කියන්නේ මෙන්න මේකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කාලේ කරපුවා දන්නේ නැත්නම් තාත්තාගෙන් අහගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට කථා කරන්න දෙන්නේ නැහැ නේ? සභාව පාලනය කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාලය ඉවරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි, මමත් කැගහනවා මෙතුමන්ලා කථා කරද්දී.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑ නම් එහෙම කරමු. නැත්නම් මගේ කාලය ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවසන් කරන්න ඉඩ දෙන්නේ නැහැ නේ? මතවාදයට භයයි. මේකේ මතවාදය ගැන කථා කරනවා. දේශපාලන මතවාදය ගැන කථා කරනවා. මේ භයේ කැගහනවා. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජයේ කඩිනම් ආර්ථික සංවර්ධනය කියන්නේ කැසිනෝ ව්‍යාපාරයත්. කුඩු ව්‍යාපාරයත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙකම පටන් ගත්තේ තාත්තලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දේශපාලන බලධාරීන්ගේ සාක්කු පුරෝ ගන්න ව්‍යාපාරයක් තමයි කඩිනම් සංවර්ධන ව්‍යාපාරය කියලා හඳුන්වලා දෙන්නේ. ජනතාවට ඵලදායී සංවර්ධනයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික්‍රෆෝනය පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පසුගිය වසර දහය තුළ මේ ජනතාවට ලැබිලා නැහැයි කියන එක ඔබතුමාට මතක් කරමින් මගේ කථාවට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

[පූ.භා. 11.55]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ ස්තුති යෝජනාව සාකච්ඡා කරන මේ වෙලාවේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම මම සතුටු වෙනවා, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ, VI වැනි පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා විධියට ප්‍රථමයෙන්ම මූලාසනයේ වාඩි වුණු වෙලාවේ, විශේෂයෙන්ම අපේ කණ්ඩායමේ, අපේ රූහේ හිටපු කෙනෙක් නියෝජ්‍ය සභාපති පුටුවේ වාඩි වෙලා ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම පිළිබඳව සතුටු වන ගමන්ම මම ඔබතුමාට සුබ පතනවා. මේ වේලාව ලබා දීම පිළිබඳවත් ස්තූතිවන්ත වෙනවා.

මම විශ්වාස කරනවා, ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සාකච්ඡා කරන්න ඉස්සෙල්ලා අපි ස්තූතිවන්ත විය යුතු කාරණාවක් තිබෙනවා. මේ මහජන සභාවේ අපට හිට

[ගරු මහේෂ් අල්මේදා]

ගන්න පුළුවන් අවස්ථාව ලැබුණේ විශේෂයෙන්ම අවිස්සාවේල්ල ආසනයේ සීතාවක ජනතාව, පොළොවේ පය තියාගෙන ඉන්න අව්‍යාජ මිනිස්සු ඉතාම නිවැරැදිව විනිවිධභාවයකින් යුතුව ඡන්දය පාවිච්චි කරලා - අවිස්සාවේල්ල ආසනයේ මන්ත්‍රීවරු ගණනාවක් හිටියා. ආසනයේ ප්‍රධාන සංවිධායකතුමාට, විශේෂයෙන්ම අමාත්‍යවරුන්ගේ විශාල සහයෝගයක් ලැබුණු අවස්ථාවක. ඒ වාගේම ආසනයේ ඇමැතිවරුන් දෙදෙනෙකුගේ සහයෝගය ලැබුණු තවත් අපේක්ෂකයෙක් සිටියදී, ඒ සියලු දෙනා අභිබවමින් ඉතිහාසයේ කිසිම අපේක්ෂකයෙක් ලබා නොගත්තු මනාප ඡන්ද ප්‍රමාණයක් ලබා දීලා අවිස්සාවේල්ල ආසනයේ පළමුවැනියාට ගෙනැල්ලා මාව මේ සභාවට එවන්න කටයුතු කරපු අවිස්සාවේල්ල ආසනයේ සීතාවක ජනතාවට මගේ ගෞරවය පුද කරන ගමන් තමයි මම මේ අදහස් ප්‍රකාශ කරන්නේ කියන කාරණය ප්‍රථමයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රතිපත්ති ප්‍රකාශය කියවාගෙන යද්දී ඒකේ ඉතාම පැහැදිලිව පෙනෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ එකතු වෙලා ගොනු වෙලා තිබෙන්නේ, අවසාන වශයෙන් එකම එකම අරමුණක් වෙනුවෙන්. ඒ අරමුණ තමයි මේ පළාතේ ජීවත් වන සියලු ජනයාට ඉතාම සුවදායක වූ ජන ජීවිතයක් උදා කිරීම සඳහා වූ පහසුකම් සැලසීම. එය මේ සභාවේ ප්‍රතිපත්තිය විය යුතුයි කියන කාරණය මේ ප්‍රතිපත්ති ප්‍රකාශය පුරාම තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේදී මතු වන ප්‍රශ්නය තමයි අපි සභාවල් හැම එකකම මතු කළා. මහජනයා විසින් බස්නාහිර පළාතේ විවිධාකාර වූ මත සංයුතියක් එක්ක තමයි මේ මහජන සභාව පත් කරනු ලබන්නේ. මේ සභාව ගැන කල්පනා කළාමත් මේ සභාවේ මහජන නියෝජිතයන්ගේ තුලනය ඇති වෙලා තිබෙන්නේ විවිධ අදහස්, මත ගැටුම් එක්ක. මෙහිදී අපි දන්නවා, අපේ රටේ ප්‍රධාන පක්ෂ දෙකටම මේ පළාත් සභාව ඇතුළේ 50% ක සංඛ්‍යාව දිනා ගැනීමට අපහසුවකින් තමයි මේ සභාව මහජනයා විසින් පත් කරලා තිබෙන්නේ. දේශපාලන පක්ෂ 11ක් මේ සභාව නියෝජනය කරනවා. මේ පක්ෂ 11 ට විවිධ මතයන් තිබෙනවා. ඔබතුමා දන්නවා අද අපි ජීවත් වන්නේ පළාත් සභාවේ නව යොවුන් කාලය තුළ. පළාත් සභාව පිහිටුවලා අවුරුදු 26 ක් ගත වෙලා තිබෙනවා. මේ පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත වුණේ රෝස මල් යහනාවක නොවෙයි කියන කාරණය මේ රටේ දේශපාලනය හදාරන සියලු දෙනා දන්නවා. ඔබතුමා දන්නවා මේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න යන කොට පළාත් සභාවට ඡන්දය දීපු අය මරණවා කියලා කිව්වා. පළාත් සභාවට වැඩ කරන අයව මරණවා කියලා කිව්වා. පළාත් සභාවට තරග කරන අපේක්ෂකයෝ මරණවා කියලා කිව්වා. ඒ විතරක් නොවෙයි. පළාත් සභා මැතිවරණය වෙනුවෙන් ඡන්ද පොළේ රාජකාරියට ගිය රාජ්‍ය නිලධාරීන් මරා දමනවා කියලා කිව්වා. ඒ මරා දමනවා කියපු දේශපාලන පක්ෂ අද මේ මහජන සභාව නියෝජනය කරනු ලබනවා. ඒ වාගේම මම දැක්කා පෙරෙයිදා මහ සමුළුවක් තියලා කියනවා, උතුරේ පළාත් සභා හදපු එවුන් මේ රටේ අනාගත ප්‍රශ්නවලට වග කියපල්ලා කියලා. එහෙම කෑගහන සමුළු මේ රටේ තිබුණා. ඒ නිසා පළාත් සභා ක්‍රමයට අභියෝගයක් අද දවසේ තියෙද්දී තමයි ආණ්ඩුකාරතුමා මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ.

හැබැයි, අපි ඉතා පැහැදිලිව කියන්නට ඕනෑ. මේ රටේ තව අවුරුදු දහසක් ජාතීන් අතර අසමගියක් ගොඩ නැගෙන්නේ නැත්නම් ඒකට ප්‍රධාන පරිසරය, භූමිකාව නිර්මාණය කරන්නේ, අපි ස්ථාපිත කරපු පළාත් සභා ක්‍රමය තුළයි. එහෙම නැත්නම් බලය බෙදීමේ මේ න්‍යායයි කියන කාරණය බව අපි නැවත නැවත මතක් කරන්න ඕනෑ. මේ පළාත් සභාව නිර්මාණය කරන්න, මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න ගුටි කාගෙන, වෙඩි කාගෙන ජීවිත පූජා කර ගෙන මේ රටේ මැදිහත් වුණු දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් විධියට අපි මහ ආඩම්බරයෙන් මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අදහස් ප්‍රකාශ කරනවා කියන කාරණය මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දිගින් දිගටම කියලා තිබෙන්නේ, එක එක ආයතන හරහා මේ පළාතේ ජීවත් වන ජනයාගේ ජීවිත සුඛිත මුදිත කරන ආකාරය පිළිබඳවයි. මේකේදී අපි කියන්න ඕනෑ. මේ හැම දේකදීම අපට වගකීමක් තිබෙනවා. විශේෂයෙන්ම, ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රධාන මේ පළාත් සභාව මෙහෙයවන අමාත්‍ය මණ්ඩලයට වගකීමක් තිබෙනවා. ජනතාව මත යම් බරක් පටවන්නේ නැති ක්‍රමෝපායන් පාවිච්චි කරමින්, මේ පළාත් සභා ක්‍රමයේ වාසිය ජනතාවට දිනා දීමේ කටයුත්ත ඉස්සරහාට කරගෙන යන්න. විශේෂයෙන්ම අපි දැක්කා ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති

ප්‍රකාශයේ කියලා තිබෙනවා පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියේ යෙදෙනවා කියලා. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියේදී පළාත් පාලන ආයතන අනුගමනය කරන ප්‍රධානම කාර්ය තමයි ඒ අයගේ බදු වැඩි කරන එක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නට ඕනෑ, මේ හැම බද්දකින්ම පීඩා විඳින්නේ මේ රටේ මහජනතාව. ඒ නිසා ජනතාව තලා පෙලන්නේ නැතුව සංවර්ධනය ක්‍රියාත්මක කරන්නේ කෙලෙසද කියන ආදර්ශය මේ රටට කියා දීමේ අවස්ථාව මේ පළාත් සභාව දිනා ගත යුතුයි කියන කාරණය අපි මතක් කර දෙන්නට ඕනෑ. ඒ වාගේම අනෙක් ක්ෂේත්‍රවලත් එහෙමයි. හැම ක්ෂේත්‍රයකම අපි මුදල් උපයන්න යන්නේ. මුදල් ඉපයීමකින් තොරව මේ පළාත් සභාව ඇතුළේ ක්‍රියාත්මක වන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරන්න බැහැ. හැබැයි, ඒ හැම ක්‍රියාදාමයක්ම අපි කරන්නට යන්නේ ජනතාව තලා පෙලා දැමීමෙන් නම් මේ පළාත් සභා ක්‍රමය, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මූලික අරමුණ සිදී බිඳී යනවා කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා එහෙම නොකර මේ පළාත් සභාවෙන් ජනතාවට සේවාව ලබා දෙන්නට මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩ කිරීමේ මහ අභියෝගය මේ පළාත් සභාවට තිබෙනවා. අපි විශ්වාස කරනවා. ඒ අභියෝගය ජය ගන්න පුළුවන් හැකියාව මේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට, අමාත්‍ය මණ්ඩලයට තිබෙනවයි කියන කාරණය.

ඒ වාගේම අවසාන වශයෙන් කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය ඇති කරපු ඉතිහාසය පුරා සුවිශේෂ අවස්ථාවක් අපි දිනාගෙන තිබෙනවා. මේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා තෝරා ගැනීමේදී මේ රටේ සහෝදර ජාතිය නියෝජනය කරන කෙනෙක් ආණ්ඩුකාරවරයා බවට පත් කිරීමේ න්‍යාය අනුගමනය කරලා තිබෙනවා. මේක ඉතාම වැදගත් කාරණයක්. මේ රටේ ජාතික සමගිය ගැන කථා කරන සියලු දෙනාට සතුටු විය හැකි කාරණයක්. අපි විශ්වාස කරනවා, උතුරේ පළාත් සභාව හැදුවාට පස්සේ බොහෝ අය කියනවා උතුරේ පළාත් පළාත් සභාව හැදීම තුළ මේ රට බෙදිලා කැඩිලා යන්න තිබුණු අවස්ථාව වැඩි වුණාය කියලා. අපි නැවත නැවත කියනවා. උතුරේ පළාත් සභාව නිර්මාණය කිරීම තුළ තමයි මේ රටේ සියලු ජාතීන්ට එක රටක් ඇතුළේ එක ජාතියක් විධියට ජීවත් වෙන්න පුළුවන් අවස්ථාව නිර්මාණය වුණේ කියලා. පළාත් සභාවට සහෝදර ජාතියක් නියෝජනය කරන ආණ්ඩුකාරවරයෙක් නිර්මාණය කිරීම ඇතුළේ ඒ ආදර්ශයම මේ පළාත තුළ ක්‍රියාත්මක කිරීමක් හැටියට තමයි අපි එය දකින්නේ. ඒ නිසා අපි දන්නවා අලවි මව්ලාන ගරු ආණ්ඩුකාරතුමා මේ රටේ දුක් විඳින, පීඩිත ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරමින්, ගුඩ් බැට කමින් තමන්ගේ දේශපාලන ජීවිතයම ගෙවා දමපු ඉතාම පරිණත දේශපාලඥයෙක්. එතුමාගේ පරිණත බව පාවිච්චි කරලා තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අවශ්‍ය මූලෝපායන් එතුමා නිර්මාණය කර ගන්නේ. ඒ නිසා එවැනි ආණ්ඩුකාරවරයෙක් මේ පළාත තුළ සිටීමම, මේ පළාතේ සියලු ජනයාට කරපු ගෞරවයක් විධියටයි අපි දකින්නේ. ඒ නිසා ඒ ගෞරවය හරහා එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා අපට පුළුවන් එතුමා දරන ස්ථාවරය යථාර්ථයක් කරලා මේ පළාත ඇතුළේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිත සුඛිත මුදිත කරන්න. ඒ නිසා එවැනි ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම ගැන නැවත නැවතත් එතුමාට ස්තුතිය ගෞරවය පුද කරමින් අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.03]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. කථාව ආරම්භ කරන්න පෙර ඇත්තටම මමත් විනාඩියක කාලයක් ලබා ගන්නවා. මෙවර මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට සහයෝගය ලබා දුන්නු ඒ වාගේම ඡන්දය ප්‍රකාශය කරපු කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවටත්, ඒ වාගේම බස්නාහිර පළාතේ සියලුම ජනතාවටත් මගේ ස්තුතිය පුද කරන්නත්, ඒ වාගේම මට පෞද්ගලිකවත්, එක්සත් ජාතික පක්ෂයට දක්වපු සහයෝගයට එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, කරු ජයසූරිය මැතිතුමා ප්‍රමුඛ නායකත්ව මණ්ඩලයේ සියලුම අයටත්, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තිස්ස අත්තනායක මැතිතුමාටත්, මගේ නායකතුමා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ප්‍රමුඛ කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන්ටත්, කොළඹ මහ නගර සභාවේ නගරාධිපති ඒ.ජේ.එම්. මුසම්මිල් මැතිතුමා ඇතුළු මා සමග සේවය කළ සියලුම නාගරික මන්ත්‍රීවරුන්ටත් මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම

[ගරු අනුරාධ විමලරත්න]

පළාත් සභාවේ සභාපති ධුරයට පත්ව සිටින අපේ සභාපතිතුමාටත්, නියෝජ්‍ය සභාපති ධුරයට පත් වූ ඔබතුමාටත් සුභ පැතුම් එකතු කිරීමටත් මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාටත්, ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාටත්, සියලුම ගරු ඇමැතිවරුන්ටත්, සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් මාගේ සුභාශිංසන එකතු කරනවා. ඒ වාගේම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සජිත්.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් ස්තූතිවන්ත වෙන්න ඕනෑ, දකුණේ කට්ටිය. අපට උදව් කරන්න කොළඹ ආවේ නැහැ. මම හිතන්නේ, ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන යමක් කථා කරනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් ඇත්තටම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන සතුටු වෙන්නේ නැහැ. මොකද, මේ ප්‍රතිපත්ති ප්‍රකාශය කියවාගෙන යනකොට මේකේ හරය හැටියට ගත්තාම තිබෙන්නේ මෙම රජය ගෙන යන මහින්ද චින්තනය කියන බංකොලොත් න්‍යායම -

[සභාවේ ඝෝෂා]

ක්‍රියාත්මක කරන්න බස්නාහිර පළාතේ අපටත් පොඩ්ඩක් ලබා දීලා තිබෙනවා කියන එකයි. මොකද, මේකේ හරය ගත්තොත් ඇත්තටම තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි යටිතල පහසුකම් ටික හදලා, පාරට ගල් ටික අල්ලලා ආයෝජන ලැබෙන කල්, ජනතාවගේ ජීවන මට්ටම වැඩි වනකල් අපි බලාගෙන ඉන්නවා කියන න්‍යාය තමයි මම හිතන්නේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන්නේ. මම හිතන්නේ, මේ ක්‍රමය හම්බන්තොටදී ක්‍රියාවට නංවලා තිබෙනවා. වරායවල් හදලා තිබෙනවා. හැබැයි, නැව් ඇවිල්ලා නැහැ. තවමත් බලාගෙන ඉන්නවා. ගුවන් තොටුපළවල් හදලා තිබෙනවා. තවම දියුණුවක් නැහැ. සම්මන්ත්‍රණ ශාලා හදලා තිබෙනවා. ගල් ටිකක් අල්ලලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජනතාවගේ දියුණුවක් වෙලා නැහැ. ඒ වාගේම මම හිතන්නේ පිටරටින් ආයෝජන එනකොටත් ඒ පළාත්වලත් ජනතාවට දැනෙන කිසිම සංවර්ධනයක්, ජනතාවගේ සාක්කුවට කියක් හරි යන සංවර්ධනයක් වෙලාත් නැහැ. මොකද, ආයෝජකයෙක් එන්න බැලුවාම එහෙම නැත්නම් ඔය ගුවන් තොටුපළට ඇවිල්ලා බැලුවාම දකින්නට ලැබෙන්නේ, මේ රටේම ඉන්න ජනතා නියෝජිතයන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පවා තුවක්කු අරගෙන ගිහිල්ලා දික් කරන ක්‍රමයක් තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන්නේ කියලා. වෙන කවුරුත් නොවෙයි. ඒ පළාත්වල නගරාධිපතිවරු. ඒ විතරක් නොවෙයි. සංචාරක ව්‍යාපාරය ගැන ගොඩක් කථා කරනවා. දැන් බලන්න දකුණු පළාතට සංචාරකයෙක් එනවා නම් එන්නේ, වෙන කිසිම දෙයකට නොවෙයි. තමන්ගේ භාර්යාව හරි පෙම්වතියව හරි දූෂණය කර ගන්න අවස්ථාවක් තිබෙනවා නම්, එහෙම නැත්නම් ගුටි බැට ලබා ගන්න අවශ්‍යතාවයක් තිබෙනවා නම් තමයි ඒ පළාත්වලට එන්නේ. දැන් ඒ න්‍යායම බස්නාහිර පළාත් සභාවේත් අපි ක්‍රියාත්මක කරන්න ගියොත් - ඔබතුමා දන්නවා අද තියෙන්නේ මොකක්ද කියලා. ඔව්, කොළඹ පාරටවල් ටික හදලා තිබෙනවා. ගල් කැට ටික අල්ලලා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආයෝජකයෙක් හරි කවුරු මේ රටට එන්න බලන කොට ඉස්සෙල්ලාම මේ රටේ දකින්නේ මොකකද? මේ රටේ ජනතා නියෝජිතයන්ව පාරවල්වල මරලා දාන සංස්කෘතියක් බස්නාහිර පළාතේ තිබෙන්නේ. පසුගිය සතියේත් ඒක වුණා. මැතිවරණ කාලය පුරා ඒක දිගටම වුණා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ පාතාලේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

ඒ විතරක් නොවෙයි. කුඩු, අරක්කු කියන එක වසංගතයක් වෙලා. ජනතාව හැමදාම පාරේ. එක එක දේවල්වලට විරුද්ධව සටන් කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ නිදහස. ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

ශිෂ්‍යයන්ට ප්‍රශ්න තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රශ්න තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

UNP එකට ප්‍රශ්න තියෙනවා.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

පොලීසිය ගත්තොත් ජනතාව මර්දනය කිරීම මම හිතන්නේ, අති දරුණු විධියට සිද්ධ වෙනවා. අපේ ජනතාවටම මේ රජයේ ආරක්ෂක අංශ විසින් වෙඩි තියනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දැන් ටයර් දාන්නේ නැහැ නේ?

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

රතුපස්වල එහෙම මතක ඇති නේද ඔය මන්ත්‍රීතුමන්ලාට. ඒ වාගේ දේවල් මේ පළාත්වල වෙනවා. (බාධා කිරීමක්) පළාත්වල වෙන්නේ ඒවයි. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව දෙයක් ගැන අපි කථා කරන්න ඕනෑ. බස්නාහිර පළාතේ තිබෙන ඉතාම භයානකම වාතාවරණයක් තමයි අද පාරවල්වලට බැහැලා ජාති ආගම් ඇතුළේ කුළල් කාගන්න පටන් අරගෙන තිබීම. සංඝයා වහන්සේ විතරක් නොවෙයි. මම හිතන්නේ අනෙක් ආගම් නියෝජනය කරන කට්ටියත් අද පාරවල්වලට බැහැලා තියෙනවා. පාරවල්වල වීදි සටන් පටන් අරගෙන තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ මේ පවත්වාගෙන යන (බාධා කිරීමක්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බාධා කරන්න එපා නවක මන්ත්‍රීතුමාට.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බොරු කියනවා නේ?

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

ඉතින් මම හිතන්නේ, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට එහා ගිය වෙනසක් අපි ඇති කරන්න ඕනෑ වෙනවා. ඒ කියන්නේ, අපේ බස්නාහිර පළාතේ තිබෙන වංචාව, දූෂණය අඩු කරලා, පිටරට ආයෝජකයෙක්ට මේ රටට එන්න පුළුවන් - අපට මුළු රටම හදන්න බැහැ. නමුත් බස්නාහිර පළාත අපට හදා ගන්න පුළුවන්. යමක් කරන්න මේ රටට එනවා නම් මේකේ ඉන්න මැති ඇමැතිවරුන්ට කොමිස් දෙන්න ඕනෑ නැති ක්‍රමයක් හදන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සංචාරකයෙක් මේ රටට එනවා නම්, සංචාරකයන්ට මේ රටට ඇවිල්ලා කැසිනෝ යන්න විතරක් නොවෙයි. ගණිකා පහස ලබන්න විතරක් නොවෙයි. එතැනින් ඔබ්බට ගිය යමක් අපි ලබා දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේ බස්නාහිර පළාත තුළවත් ජනතා නියෝජිතයන්ගේ ආරක්ෂව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

බොහොම ස්තූතියි. එන පුද්ගලයින්ගේ ආරක්ෂාව සැලැස්වීමට අපි බලන්න ඕනෑ. මම හිතන්නේ, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයට එහා ගිය වගකීමක් ඒ වාගේම ක්‍රියාවක් ආණ්ඩු පක්ෂය හැටියට ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රමුඛ ඇමැති මණ්ඩලයටත්, ඔබතුමන්ලාටත් තිබෙනවා. ඒ වගකීම ඔබතුමන්ලාට එනවා. ඉතින් මම හිතන්නේ ඒ දේ කරන්න. මේ ප්‍රතිපත්ති ප්‍රකාශය නොවෙයි. ජාතීන් අතර සමගිය ඇති කරලා, ඒ වාගේම ආයෝජකයන්ට, සංචාරකයන්ට මේ රටට එන්න පුළුවන්, විශේෂයෙන්ම බස්නාහිර පළාතට එන්න පුළුවන්. නීතියේ ආධිපත්‍යය හරියට ක්‍රියාත්මක වන ක්‍රමයක් මේ බස්නාහිර පළාතේ ඇති කර ගන්න ලැබුණොත් මම හිතන්නේ, අපේ සේවය අපි ජනතාවට ඉෂ්ට කළා කියලා. එදාට මේ ජනතාව කියයි. අවසාන වශයෙන් මම කියන්න ඕනෑ. මම හිතන්නේ මේක අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ දෙවැනි ධූර කාලය. එතුමාත් තීරණය කරන්න ඕනෑ, එතුමාගේ Legacy එක. එතුමා ඉතිහාසයට තම පාලන කාලය එක් කරන්නේ කොහොමද කියලා. මේ රජය ලබා දීලා තිබෙන ඒ ක්‍රියා මාර්ගයේම ගිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Wimalarathne

තත්පර තිහක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ මාර්ගයේම ගිය පුද්ගලයින්ට එහෙම නැත්නම් මේ බස්නාහිර පළාත් සභාවට, පළාතට සැබෑ සාධනීය වෙනසක් එක් කරපු, මේ බස්නාහිර පළාත් සභාව අලුත් මාර්ගයකට ගෙන ගිය මහ ඇමැතිවරයෙක් වශයෙන් එතුමාගේ ඉතිහාසයේ සලකුණ තියනවාද කියන එක එතුමා තීරණය කරන්න ඕනෑ. ඉතින් ඒ දේ කරන්න අවශ්‍ය කරන ශක්තිය, ධෛර්ය එතුමාටත් ඇමැති මණ්ඩලයටත්, මේ පළාත් සභාවේ සියලු දෙනාටමත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

[අ.භා. 12.11]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම මමත් ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම දෙවැනි වරටත් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වීමට මැද කොළඹ ඇතුළු කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව මට ඡන්දය ලබා දීම ගැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුකාර අල්හාජ් අලවි මව්ලානා මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ සාකච්ඡාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා පසුගිය කාලය පුරාම මේ පළාත් සභා ක්‍රමය ගැන අපට මේ රටේ ආන්දෝලනාත්මක ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා ගියවර පළාත් සභාවේ ප්‍රධාන ඇමැති වෙලා ඉන්න කාලයේ එතුමා විසින්ම යෝජනා කිහිපයක් මේ පළාත් සභාවට ගෙනැල්ලා මේ පළාත් සභාවේ තිබෙන යම් යම් බලතල මහ ආණ්ඩුව පවරා ගත්තා. මම හිතනවා අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළා. මේ පළාත් සභාව බලය විමධ්‍යගත කිරීම, ජනවාර්ගික අර්බුදයට විසඳුමක් හැටියට ගෙන ආවත් අද එතුමාටත් අමතක වෙලා තිබෙනවා, මේ පළාත් සභාවල තිබෙන බලතල ආණ්ඩුව ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් අඩු කරගෙන අද මේක මධ්‍යම ආණ්ඩුව යටතට ගැනීමේ ආයතනයක් හැටියට පවත්වාගෙන යන බව. ගිය අවුරුදු පහ තුළම අපි දැක්කා ආණ්ඩුව පනත් කිහිපයක් ගෙනැල්ලා පළාත් සභාවට තිබෙන විෂයයන්, ඒ වාගේම බලය ඒ සියලු දේවල් මධ්‍යම ආණ්ඩුවට පවරා ගන්නවා. අද වනකොට මේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළත් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ විෂයයක් හැටියට, පළාත් සභාවේ විෂයයක් හැටියට තිබෙන නීතිය හා සාමය පිළිබඳව මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ කිසිම තැනක සඳහන් වෙන්නේ නැහැ. මම දන්නේ නැහැ බස්නාහිර පළාතේ නීතිය හා සාමය නැති නිසාද මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒ ගැන සාකච්ඡා වෙන්නේ නැත්තේ. එහෙම නැත්නම් ඒ නීතිය හා සාමය පිළිබඳ විෂයයත් මධ්‍යම ආණ්ඩුව පවරා ගත්තාද? මේ පළාත් සභාව යටතේ තිබෙන මේ විෂයයන් අද අපට අදාළ නැද්ද කියන ප්‍රශ්නය මම මේ සභාව ඉදිරියේ, තමුන්නාන්සේලා ඉදිරියේ තබනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ අපි පසුගිය අවුරුදු පහ තුළත්, ඉදිරි කාලය දිහා බැලුවත් අපට එහෙම සන්තෝෂ වෙන්න පුළුවන් විශේෂ දේවල් මේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නැහැ. මම එහෙම කියන්නේ, අද අපි නීතිය හා සාමය පිළිබඳව පළාත් සභාව තුළ අරගෙන බැලුවත් ඒ නීතිය හා සාමය විශාල වශයෙන් කඩා වැටීමක් තිබෙනවා. අද නීතියේ ආධිපත්‍යය බිඳ වැටිලා තිබෙනවා. අපි දැක්කා මිනී මැරුම් ගණනාවක්. ඒ විතරක් නොවෙයි, ජාතීන් අතර ඇණ කොට ගන්න තත්ත්වයක් යම් යම් සංවිධාන මේ රටේ නීතිය අතට අරගෙන ක්‍රියා කරන විට මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඔබතුමා දන්නවා. අද තමුන්නාන්සේ නියෝජනය කරන දිස්ත්‍රික්කයේ අලුත්ගම ප්‍රදේශයේ වෙළඳ සැලක් ඉතා සංවිධානාත්මකව ගිනි තියලා දැම්මා. අද වනකල් කාවවත් අත්අඩංගුවට ගත්තේ නැහැ. නමුත් ආණ්ඩුවට අවශ්‍ය වුණා නම්, මේ රටේ ඉතාම දරුණු අපරාධ කරලාත් බේරෙන්න බැහැ. ආණ්ඩුව වහාම අත්අඩංගුවට ගන්නවා. කුරුණෑගලදී ඇති වුණු සිද්ධියේදී පොලිස් නිලධාරියා ඝාතනය කරපු සිද්ධියේදී සැකකරුවා සති ගණනකින් අත්අඩංගුවට ගත්තා කියන එක අපි දැක්කා. නමුත් යම් යම් කාරණා මේ රටේ සිද්ධ වනකොට, යම් යම් දේපළ විනාශ වනකොට, මේ රටේ ජාතීන් අතර ප්‍රශ්න ඇති කරන කොට, යම් යම් සංවිධාන නීතිය තමන්ගේ අතට අරගෙන ක්‍රියාත්මක වන කොට ආණ්ඩුව නිකම් බලාගෙන ඉන්නවා. ආණ්ඩුව නිශ්ශබ්දව ඉන්නවා. නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. අද බස්නාහිර පළාත් සභාව තුළ මේ වාගේ තත්ත්වයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා පසුගිය කාලයේත් තිබුණා. අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් කිහිප වතාවක් ඉල්ලා සිටියා. වහාම ඔබතුමාට තිබෙන බලතල අනුව මේ පළාත් සභාව තුළ නීතිය හා සාමය ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීම අපි කළා. ඊළඟට අපි දැක්කා මේකේ තිබෙනවා නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධනය, ඉඩම් පවරා ගැනීම හා ඒ පිළිබඳව තිබෙන පරිච්ඡේදය. ඒ පිළිබඳව තිබෙන දේවල් ගැන. ඒ විෂයයන් අරගෙන බැලුවත් අපි දැක්කා පසුගිය කාලයේ ආණ්ඩුව කොහොමද ක්‍රියාත්මක වුණේ කියලා. විශේෂයෙන්ම මේ කොළඹ නගරයේ ජීවත් වන දුප්පත් ජනතාවගේ ඉඩම් ටික ආරක්ෂක අමාත්‍යාංශය යටතට බලහත්කාරයෙන් පවරාගෙන ඒ ගෙවල්වල හිටපු මිනිස්සු එළියට දැම්මා. අවුරුදු ගණනාවක් සිටිය මිනිස්සු. මම කියනවා, මැණික් ෆාම්වලටත් වඩා අන්තයි. මෝදර, මට්ටක්කුළියට ගිහිල්ලා බැලුවාම මැණික් ෆාම්වලට වඩා අන්ත විධියට තමයි ඒ ජනතාව අද ජීවත් වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒවාට විසඳුම් දීලා නැහැ. එතකොට මේ ප්‍රතිපත්ති ප්‍රකාශවල තිබෙන දේවල් ඉතාම සුරංගනා කථා විතරයි. මේවා ක්‍රියාවට නැගෙන්නේ නැහැ. අද අපි එකක් මතක තියාගන්න ඕනෑ. ආණ්ඩුවට විරුද්ධව හැම පැත්තකින්ම හැම බලවේගයක්ම නැගිටලා ඇවිල්ලා තිබෙනවා. ශිෂ්‍යයෝ, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය, මේ රටේ රාජ්‍ය සේවය සියලු දෙනාම අද මේ ආණ්ඩුවට විරුද්ධව විශාල බලවේගයක් විධියට ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා ඒකේ වගකීම ප්‍රධාන විපක්ෂය හැටියට ඒ බලවේගවලට දේශපාලන නායකත්වය දෙමින් මේ රටේ ජීවත් වන ජනතාවගේ සුභසාධන හා ඔවුන්ගේ අයිතිය වෙනුවෙන් අපි පෙනී හිටිනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.17]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, VI වන පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව ස්තුති යෝජනාව ගෙන එන අවස්ථාවේ වචන ස්වල්පයකින් ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා, නියෝජ්‍ය සභාපති ධූරයේ මුලසුන අරගෙන ඉන්න වෙලාවේ මගේ කථාව කරන්න ලැබීම පිළිබඳව. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ සගයෙක්, අපේ හිතවතෙක්, අපේ වරිගයේ කෙනෙක් හැටියට ඔබතුමා ඔය අසුනට ඒම ගැන ඉතාමත් සතුටු වෙනවා කියන කාරණය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම සම්ප්‍රදායානුකූලව මේ පළාත් සභාවට පත් වන ඕනෑම කෙනෙක් තමාව ඒ තත්ත්වයට ගෙන ආපු අයට ස්තුති කිරීම සම්ප්‍රදායක්. ඒ වාගේම කෘතවේදීත්වය දන්නා කෙනෙකුගේ යුතුකමක්. ඒ අනුව මමත්, VI වන පළාත් සභාවට මාව නැවතත් තෝරා පත් කරලා එවපු කඩුවෙල ආසනය ප්‍රධාන කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවට හිස නමා එහෙම නැත්නම් සිරස නමා ගරු කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ පිළිබඳව හැඳන්වීමක් කරනවා නම් එදා 1991 කඩුවෙල ප්‍රාදේශීය සභාවේ පළමුවැනි සභාපතිවරයා හැටියට පත් වෙලා, 1993 දෙවැනි පළාත් සභාව නියෝජනය කරමින් නොකඩවා මේ දක්වා මාව ඔසවා තබපු ඒ ජනතාවට ස්තුති කිරීම මම සුවිශේෂ යුතුකමක් හැටියට මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා දෙවැනි පළාත් සභාවේ සිට මේ දක්වාම නොකඩවාම නියෝජනය කරපු අය ඉන්නවා නම් ඉන්නේ තුන් දෙනයි. මම නිවැරැදි නම් ප්‍රධාන අමාත්‍ය ධූරය දරන ප්‍රසන්න රණතුංග මැතිතුමා, ඒ වාගේම මගේ වම්පස ඉන්න හිටපු සෞඛ්‍ය අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමාත්, මේ කථා කරන මමත්, අපි තිදෙනා තමයි එදා ඉඳන් මෙදා වනකල් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ලයනල් ජයසිංහ

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ලයනල්ලා කැඩුණා නේ? මම කියන්නේ නොකඩවාම -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සුනිල් විජේරත්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔව්. සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා වාගේ - මම කිව්වේ නිවැරදි නම් කියලා. කිහිප දෙනයි ඉන්නේ. ඉතින් මම ඒක සඳහන් කළේ එවැනි ජනතාවක් අපව අත් නොහැරීම පිළිබඳව මේ වාගේම ප්‍රතිපත්ති ප්‍රකාශයක් සම්බන්ධව කථා කරන වෙලාවකදී මතක් කිරීම යුක්ති සහගතයි කියන එක ප්‍රකාශ කරන්නයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අල්හාජ් අලවි මව්ලානා ආණ්ඩුකාරතුමා මා දකින්නේ අසිරිමත් සුවිශේෂී පුද්ගලයෙක් හැටියටයි. අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා කියන්නේ රටක ජනාධිපතිවරයා විසින් පත් කරන ආණ්ඩුකාරවරයෙක්. එතුමා ජනාධිපතිතුමාගේ නියෝජිතයා හැටියටයි කටයුතු කරන්නේ කියන කාරණාම මම මේ වෙලාවේ ඔබතුමන්ලාගේ සැලකිල්ලට ගෙනහැර පාන්න අවස්ථාවක් කර ගන්නවා. අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා අර අනෙක් මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ නොයෙක්, විවිධ කාරණා තුළදී මේ රටේ ජනතාවගේ සිත් සතන් තුළ පැළපදියම් වුණු අපූරු චරිතයක්. වෘත්තීය සමිති නායකයෙක් හැටියට දේශපාලනයේ විවිධ තනතුරු දරලා එවකට ජනාධිපතිනියගේ, මෙවකට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගෞරවයට, ආදරයට, ප්‍රශංසාවට පත් වෙලා නියමාකාරයෙන් දේශපාලනය කරලා, නියමාකාරයෙන් ආණ්ඩුකාරවරයෙක් හැටියට පත් වුණු කෙනෙක් හැටියට මා දකිනවා. එතුමා මේ VI වැනි පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. ඇතැම් අය සමච්චලයට ලක් කළත් මම දකින්නේ, මෙය නිකම්ම නිකම් ප්‍රතිපත්ති ප්‍රකාශයක් හැටියට නොවෙයි.

අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා ඉදිරිපත් කරපු අයවැය දිහා බලන කොට ඊට සාපේක්ෂව එහි අන්තර්ගතයන් ක්‍රියාත්මක කරන්න කරුණු කාරණා හරියට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශයක් කියන කාරණාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඊටත් එහා ගිහිල්ලා කථා කරනවා නම් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නීත්‍යානුකූල, නීත්‍ය නියෝජිතයා හැටියට තමයි ඕනෑම පළාත් සභාවක ආණ්ඩුකාරවරයෙක් පත් වෙන්නේ. ඒ කාරණය හරියට අකුරටම ඉෂ්ට සිද්ධ කරමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය සහ මහින්ද චින්තන ඉදිරි දැක්ම කියන ලියවිලි දෙකේම කරුණු කාරණා සාධනීයව ඉදිරිපත් කරලා තිබෙනවා. මට මතකයි අපේ ලාබාල මන්ත්‍රීතුමා ශ්‍රීනාත් පෙරේරා මැතිතුමා, එතුමාගේ තාත්තා නම් හිටපු කථානායකවරයෙක්. තාත්තාට ගරු කිරීම පුත්‍ර රත්නයේ වගකීම. නමුත් ඒවා හරියට වුණාද කියන කාරණාව අපටත් ප්‍රශ්නයක්. ගරු ආණ්ඩුකාරතුමා මෙන්න මේ විධියට කියනවා.

*"ජනවරමින් මෙම ගරු සභාවට තේරී පත් වූ ඔබ සැමට මගේ සුභ පැතුම් පුද කරන අතර, බස්නාහිර පළාතේ හය වැනි පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම අතිශයින්ම සතුටට පත් වෙමි."*

එතුමා සියලුම මන්ත්‍රීවරුන්ට සුභ පතමින් තමයි ඒක කියන්නේ. ඊළඟට එතුමා මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා.

*"ඔබ සියලු දෙනාගේම ඒකායන බලාපොරොත්තුව බස්නාහිර පළාතේ ජනතාවගේ දියුණුව සැලසීම යන්න බව මාගේ විශ්වාසයයි."*

ඒ සඳහා එතුමා කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා මම හිතන්නේ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු - හැමෝම නොවෙයි, ඇතැම් මන්ත්‍රීවරු කියවලා නැහැයි කියන කාරණාව තමයි මට මේ අවස්ථාවේදී ප්‍රකාශ වෙන්නේ. ඒ වාගේම එතුමා ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රකාශ කරනවා,

*"ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් ¼ කටත් වඩා ජනතාවක් වෙසෙන බස්නාහිර පළාත රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ පෙරගමන්කරු ලෙස හඳුන්වා දිය හැකිය."*

එතුමා ඒක තේරුම් අරගෙන තිබෙනවා. තමුන්නාන්සේලා තේරුම් නොගත්තාට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි තේරුම් අරන් තියෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

*"එහි දී ජාතික සංවර්ධන ඉලක්ක අතර ප්‍රමුඛ වන ඒකපුද්ගල ආදායම වසර 2016 වන විට ඇ.ඩො. 4470 දක්වාත්, 2020 වන විට ඇ.ඩො. 8500 දක්වාත් වර්ධනය කිරීම. සාක්ෂරතා අනුපාතය 2016 දී 98% මට්ටමට ඉහළ නැංවීම සහ 2020 වන විට 100% දක්වා වර්ධනය කිරීම, උපතේදී ආයු අපේක්ෂණය 2020 දී පිරිමි අවුරුදු 86 හා ගැහැණු අවුරුදු 80 ක් දක්වා වර්ධනය කිරීම"* කියන කාරණාව.

මෙයින් පිළිබිඹු වෙන්නේ මොකක්ද? ගරු ආණ්ඩුකාරතුමා ප්‍රතිපත්තියක් හැටියට එතුමාගේ කාල සීමාවේ විතරක් නොවෙයි, 2020 දක්වාම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් කරන කොට ඒ ශ්‍රී ලංකාව එහෙම වෙන්න මෙතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය දැනටම ඉලක්කයක් හැටියට තිබෙනවා. මෙන්න මේකයි වැදගත් කාරණාව. ඉතින් මම මේ අවස්ථාවේදී සතුටු වෙනවා. එදා අප්‍රේල් මාසේ 30 වැනිදා මගේ හිතවත් කල්‍යාණ මිත්‍රයා ගාමිණී තිලකසිරි හිටපු අමාත්‍යතුමාගේ ස්ථිරත්වයෙන් මගේ යෝජනාවෙන් එදා එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අද දින විවාදයට ගෙන ඒමට පුළුවන් වීමට පිළිබඳව මම සතුටු වෙනවා.

මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම ඔබතුමන්ලා හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා ආණ්ඩුකාරතුමා කියන්නේ මේ රටේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා කියලා මම නැවත නැවත පුන පුනා කියනවා. එහෙම නම් අතිගරු ජනාධිපති මහින්ද රජපක්ෂ මැතිතුමා කල්පනා කරන්නේ, මේ ශ්‍රී ලංකාවේ උතුර, දකුණ, නැගෙනහිර, බස්නාහිර මේ සතර දිග්භාගයේ ඉන්න සියලු ජනතාවට සුභ සෙත ඇති කර දීමටයි. ඒ සඳහා තමයි එතුමා වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙන්නේ. තිස් අවුරුද්දක් තිස්සේ තිබුණු යුද්ධය සදහටම නිම කළා. ඊයේ පෙරේදා වනකොට අවුරුදු 05 ක් ගෙවිලා අවසන්. ඒ අවුරුදු 05 නිම කරලා, ඒ පිළිබඳව උත්සවත්ශ්‍රියෙන් මේ රටේ සමස්ත ජනතාවගේ මතකයන් අවදි කරන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රූපවාහිනිය දිහා බලාගෙන හිටියා. අද හුඟක් දෙනාට මේවා අමතකයි. එදා යුද්ධය තිබුණු හැටි. එදා පක්ෂ විපක්ෂ අපි සියලු දෙනාම බැට කෑවා. ගාමිණී දිසානායකලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අදත් මැරුම් කනවා කුඩුවලදී.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මෙතුමන්ලාට මතක නැහැ, මෙතුමන්ලා ජීවත් වෙලා ඉන්න නිසා. ගාමිණී දිසානායක මැතිතුමා මැරුම් කෑවා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මැරුම් කෑවා. ඒ කාලකණ්ණි යුද්ධය නිසා. වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමා මැරුම් කෑවා. ඒ කාලකණ්ණි ත්‍රස්තවාදය නිසා අපේ මිනිස්සු, අපේ නායකයෝ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයෝ මැරුම් කෑවා. ඒ යුද්ධය, ඒ කාලකණ්ණි ත්‍රස්තවාදය නිට්ටාවටම සුව කරපු සුව කිරිල්ල -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තවත් විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ නිසා ප්‍රාථමික දේශපාලනය කරන, ප්‍රාථමික දේශපාලනය තුළ ළඳ බොළඳ කථා කියන තමුන්නාන්සේලා මීට වඩා විචක්ෂණව, බුද්ධියෙන් කථා කරන්න. බුද්ධියෙන් දකින්න කියන කාරණය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. එසේ ප්‍රකාශ කරමින් ඉතාමත්ම හරවත් ප්‍රතිපත්ති ප්‍රකාශයක් මහින්ද චින්තනයට අනුගතව ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු අල්හාජ් අලව් මව්ලානා ආණ්ඩුකාරතුමාට මගේ ප්‍රණාමය පුද කරමින්, එතුමා වෙනුවෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරමින් ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.26]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තූතියි. මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම මාව දෙවැනි වරටත් පළාත් සභාවට තෝරා පත් කරන්න විශාල දායකත්වයක් ලබා දුන්නු ගම්පහ දිස්ත්‍රික් ජනතාවට මගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම මහනායක

[ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ස්වාමීන් වහන්සේලා ඇතුළු සංඝරත්නයටත්, සියලුම අන්‍යාගමික පූජකවරුන්ටත් මේ අවස්ථාවේදී මගේ ස්තූතිය පුද කරමින් අපේ ගරු සභාපතිතුමාටත්, නියෝජ්‍ය සභාපතිතුමා වන ඔබතුමාටත්, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත්, මෙම පළාත් සභාවට තෝරී පත් වූ සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තූතිය පුද කරනවා. විශේෂයෙන්ම මේ පළාත් සභාවේ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන වචනයක් කථා කරන කොට අපි පසුගිය පළාත් සභාවේත් ඒ වාගේම මෙම පළාත් සභාවේත් ප්‍රතිපත්ති ප්‍රකාශ දෙකම සංසන්දනය කරන කොට මට නම් ලොකු වෙනසක් පෙනෙන්නේ නැහැ. පසුගිය පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශයත් මේ දෙකත් වචන කිහිපයකට සීමා වුණු ප්‍රතිපත්ති ප්‍රකාශ දෙකක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා, මේ බලය විමධ්‍යගත කරන්න කොපමණ සටනක් මේ රට තුළ ඇති වුණාද කියන එක. කොපමණ ජීවිත ප්‍රමාණයක් අහිමි වුණාද කියන එක. නමුත් පසුගිය පළාත් සභාවේත්, මේ පළාත් සභාවේදීත් අපට අන්තිමට ඉතුරු වෙලා තිබෙන්නේ පළාත් සභාවේ ගොඩනැගිල්ලයි, සම්පත් කිහිපයක් පමණයි. නමුත් අපි ලබා ගත්තු ඒ බලය විමධ්‍යගත කිරීම කියන ප්‍රමුඛ, මුඛ්‍ය අරමුණ අද අපට අහිමි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ බලය එක පුද්ගලයෙකුට, එක පවුලකට, එක පිරිසකට පමණක් සීමා වෙලා. අද අපේ ආණ්ඩුකාරතුමාටත් වෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ ඉන්න ඇමැතිවරුන්ට වෙලා තිබෙන තත්ත්වයමයි. ඒ මොකද, අද ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි මේ බලය සියල්ලම එක පුද්ගලයෙකුට, එක පිරිසකට සීමා වෙලා. අද ඒ අය කියන දේවල් තමයි අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාටත්, ඇමැතිවරුන්ටත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම ඇමැතිවරුන්ටත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට අපි බලාපොරොත්තු වන බලය විමධ්‍යගත කිරීමට නම් නැවතත් අපට අරගලයක් සිදු කරන්න වෙයිදෝ කියන සැකයත් මතු වෙනවා. දැන් මෙතැනදී නොයෙකුත් මාතෘකා යටතේ කථා කරනවා. දැන් විශේෂයෙන්ම අධ්‍යාපනය ගත්තාම මේ අය කොපමණ සුන්දර විධියට අධ්‍යාපනය ගැන කථා කළත් අද ළමයෙක් ඉස්කෝලයකට දාගන්න තිබෙන ප්‍රශ්නය තමයි දෙමව්පියෙකුට තිබෙන ලොකුම ප්‍රශ්නය. අද ළමයෙක් ඉස්කෝලයකට දාගන්න බැහැ. අද විශ්ව විද්‍යාල ටික නතර වෙලා තිබෙනවා. අද විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරු, ඒ වාගේම සිසු සිසුවියන් සියලු දෙනාම මහ පාරට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ ආර්ථිකය ගැන කථා කරනකොට, ආර්ථික සංවර්ධනය කරන්න අද අපි නැවතත් බලාපොරොත්තු වෙන්නේ කැසිනෝ, එතනෝල් ගෙනැල්ලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කැසිනෝ ගෙනාවේ කවුද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

සෞඛ්‍ය ඇමැතිතුමා කථා කරනවා -

[සභාවේ ඝෝෂා]

අද ලෝක සෞඛ්‍ය සංගමයේ උප සභාපති තනතුරක් ලැබෙනවා කියලා. ඒ වාගේම නඩු තීන්දුවක් ගෙනැල්ලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංවිධායකතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නඩු තීන්දුවක් ගෙනැල්ලා දුම්වැටි ගැන කථා කරනවා. නමුත් කවුද මේවා ගේන්නේ? අද රජයේ ඇමැතිවරුන් නේ මේ රටේ අරක්කු නිෂ්පාදනයේ මූලිකත්වය අරගෙන කථා කරන්නේ. අපි පත්තරවලට කථා කරලා කියනවා. (බාධා කිරීම්) අද ඇති වෙලා තිබෙන තත්ත්වය මේකයි. රජයේ අනුග්‍රහය දක්වලා රජයේ සියලුම පහසුකම් ඇතුව තමයි අද මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. අද රජයේ ඇමැතිවරු මේ වාගේ ව්‍යාපාර කරන්න කල්පනා කරනවා. කැසිනෝ විතරක් නොවෙයි. එතනෝල් ගෙන එන්නේ ඒ සියල්ලම කවුරුන්ද කරන්නේ කියලා ඔබ අපි කවුරුත් හොඳින් දන්නවා. ඒ වාගේම තමයි මෙතැන කථා කරනවා යටිතල පහසුකම් ලබා දෙනවා කියන එක. මේ යටිතල පහසුකම් ලබා දෙනවා කියලා කථා කරනකොට ජීවත්

වෙන්න වතුර ටිකක් ඉල්ලපු ජනතාවට, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මමත් නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ රතුපස්වල ජනතාව පිරිසිදු වතුර ටිකක් ඉල්ලනකොට එදා ඇති වුණු තත්ත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. මොකක්ද වුණේ කියලා දන්නවා. ඉතින් අද අපි මේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශයට කථා කරනවා නම්, අද මේ බස්නාහිර පළාත් සභාව අනෙක් පළාත් සභා එක්ක සන්සන්දනය කරනකොට ඊට වඩා ඉහළ තත්ත්වයේ සිටිය යුතුයි. ඒ විතරක් නොවෙයි. අපි ආයෝජකයින් ගැන කථා කරනවා. අපි අනෙක් පළාත් සභාවලට වඩා වැඩි ආයෝජකයින් ප්‍රමාණයක් මේ පළාත් සභාවට ගෙන එන්න අවශ්‍ය නම් ඒ මොනවාද කියන එක මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ නැහැ. අපි සියලු දෙනා මේ රටේ සංචාරකයින් ගෙන එන්න, විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවට සංචාරකයින් වැඩි ප්‍රමාණයක් ගෙන එන්න ඕනෑ කොහොමද කියන එක මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ නැහැ. එහෙම නම් ඔබ සියලු දෙනාටම නැවතත් මම කියන්නේ මේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය වචන කිහිපයකට පමණක් සීමා නොකර මේ ප්‍රදේශය, මේ පළාත් කොළඹ, ගම්පහ, කළුතර කියන මේ දිස්ත්‍රික්ක තුන දියුණු කරන්න පුළුවන් ප්‍රතිපත්තියක් නැවතත් අපට ලබා දෙන්න. එක්සත් ජාතික පක්ෂයටම පළාත් සභාවේ බලය ලබා ගන්න හැකි වෙයි කියන එකේ මට සැකයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හීනයක් දැක්කාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කෙසේ වෙතත් මම ගරු කරන පුද්ගලයෙක් තමයි අපේ ගරු ආණ්ඩුකාර අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා. ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් හැටියට මේ රටට විශාල සේවාවක් ඉටු කරලා තිබෙනවා. එතුමාට මාගේ සුභාශිංසන එක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 12.33]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුව විනාඩියක කාලයක් ලබා ගන්නවා. සියලුම මන්ත්‍රීවරු වාගේම අභිනවයෙන් පත් වුණු මට බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල මැතිවරණ කොට්ඨාශයෙන් මන්ත්‍රීවරයෙක් හැටියට පත් වීමට මනාප ලබා දී, කළුතර දිස්ත්‍රික්කයේ දෙවැනි තැනට ගෙන ඒමට කටයුතු කළ සමස්ත කළුතර දිස්ත්‍රික්කයේ සහ බේරුවල ජනතාවටත් මම මගේ ස්තුතියත් ප්‍රණාමයත් මුලින්ම පුද කරනවා. එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු නායකත්ව මණ්ඩලයේ සියලුම නිලධාරීන්ටත්, පක්ෂයේ නියෝජිතයින්ටත් මගේ ගෞරවනීය ස්තුතියත් ප්‍රණාමයත් පුද කරනවා. ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව කථා කිරීමේදී අප්‍රේල් මාසේ 30 වැනිදා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් වුණු බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක්වීමේ රැස්වීම මම නම් දකින්නේ, විශාල මුදල් නාස්තියක් හැටියට. එදා එම ප්‍රතිපත්ති ප්‍රකාශයේදී බස්නාහිර පළාත් සභාවට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්නට සිද්ධ වුණාය කියලා මම හිතනවා. බස්නාහිර පළාත් සභාවේ අප්‍රේල් මාසේ 22 වැනිදා පැවැති දිවුරුම් දීමේ උත්සවයෙන් අනතුරුව ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක් වූවා නම් මම විශ්වාස කරනවා, මේ රටේ මහජනතාවගේ මුදල් නාස්ති නොකර ඉතුරු කර ගන්නට අවස්ථාවක් උදා වෙනවා කියලා. මම හිතන්නේ මේ රටේ රණතුංගලාට ඉතිහාසයක් තිබෙනවා. නාස්තිය දූෂණය ගැන කථා කිරීම වෙනුවෙන්. ඒ නිසා මම විශ්වාස කරනවා අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාත් ඒ නාස්තියට, දූෂණයට විරුද්ධව අනාගතයේදී මුදල් නාස්ති නොකර මේ පළාත් සභාවේ මුදල් වියදම් කිරීම ගැන පරීක්ෂාවෙන් කටයුතු කරාවි කියලා. ඒ වාගේම ප්‍රතිපත්ති ප්‍රකාශයේ මහින්ද චින්තනයෙන් ලබපු දෙයක් තමයි - මම හිතන්නේ, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. හරිත පරිසරයක් සහ ශීඝ්‍ර සංවර්ධනයෙන් යුතු ආර්ථිකයක් සහිතව රටේ ජනතාවට අභිමානයෙන් යුතු ජීවිතයක්, මහින්ද චින්තනයේ සඳහන් වෙනවා කියලා තමයි ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සවිස්තර වාර්තාවේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා හැටියට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට හොඳ හරිත පරිසරයක් මේ රට තුළ නිර්මාණය වෙලා නැහැ. බේරුවල පළාතේ ව්‍යාපාරිකයින්ට ආයෝජනය කරන්න

[ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

බියක් ඇති වෙලා තිබෙනවා. ඒකට හොඳ උදාහරණයක් තමයි අලුත්ගම නගරයේ සිද්ධ වුණු ප්‍රශ්නය අපි මතක් කළ යුතු වෙනවා.

ඒ වාගේම දවස් තුන හතරකට උඩදී සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල නගරයේත් ඒවැනි ආකාරයටම කණ්ඩායමක් සම්බන්ධ වෙලා ව්‍යාපාරික ස්ථානයක් අළු කරලා සුන්නත්දූවිලි කළා. මේවා ගැන බස්නාහිර පළාත ඇත්තටම රටේ මූල්‍ය ආර්ථිකයේ සංවර්ධනය ගලන සභාවක් හැටියට, මේ රටේ ආණ්ඩුවට දෙවැනි වුණු පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාව තුළ මෙලෙස ව්‍යාපාරිකයින්ට සංවිධානාත්මක කල්ලියක් විසින් අඩන්තේට්ටම් කරනවා නම්, ප්‍රශ්න ඇති වෙනවා නම් - ඒ සම්බන්ධයෙන් සංවිධානාත්මක කල්ලි ගැන පරීක්ෂණයක් පවත්වන්නට කිසිම පොලිස් නිලධාරියෙක් සමත් වෙලා නැහැයි කියන එක අපට කනගාටුවෙන් හරි ජනතාව දැනුවත් කරන්න වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ, මේ රටේ සියලුම ජාතීන්ට එක හා සමානව ජීවත් වෙන්නට මහින්ද චින්තනයේ තිබුණාට රජපක්ෂ චින්තනයේ නැති බව අපි සඳහන් කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ, බස්නාහිර පළාත් සභාවේ සියලුම ජාතීන් ජීවත් වෙනවා. ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ඔබතුමාට ඡන්දය දීපු ජනතාව ජීවත් වන බේරුවල මැතිවරණ කොට්ඨාශය සියලුම ජාතීන් නියෝජනය කරන කොට්ඨාශයක් හැටියට සමස්ත කළුතර දිස්ත්‍රික්කයත්, සමස්ත රටේ ජනතාව නියෝජනය කරන සියලුම ජාතීන්ගේ ආරක්ෂාව අද ප්‍රශ්නයකට මුල් වෙලා තිබෙන මොහොතක තමයි අපි අද මේ සභාවේ කථා කරන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, මෙවැනි ප්‍රශ්නවලදී මහජන නියෝජිතයෝ හැටියට අපට ගිහිල්ලා කථා කරලා දැනුවත් කරන්නවත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. පොලීසියකටවත් ගිහිල්ලා කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මේවා ගැන අපි කථා කළ යුතු වෙනවා. මහජන ප්‍රශ්න පිළිබඳව අපි දැනුවත් කළ යුතු වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මේ අවස්ථාවේදී එම ඉල්ලීම යොමු කරමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන මම ස්තූතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවනීය ස්තූතියත්, ප්‍රණාමයත් මේ අවස්ථාවේදී පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා. 12.39]

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මා කැමැතියි මේ අවස්ථාවේදී ස්තූතිය පුද කරන්න, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මා ඇතුළු නියෝජිතයින් නව දෙනෙක් මේ පළාත් සභාවට තෝරා පත් කරපු කොළඹ දිස්ත්‍රික්කයේ සහ බස්නාහිර පළාතේ ජනතාවට. ඒ වාගේම දේශපාලනික වශයෙන් අපව මෙතැනට ඔසවා තබන්න, මෙතැනට ගෙන එන්න දැඩි උනන්දුවක් සහ කැපවීමක් කළ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක, හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාටත් කෘතවේදීත්වය පළ කරන්න අවස්ථාවක් කර ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ VI වැනි පළාත් සභාවට ඉදිරිපත් කළ ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අපේ පක්ෂයේ සහ මගේ කණ්ඩායමේ මෙන්ම මාගේත් සුභාශිංසන පිරිනමන්න කැමැතියි. ඒ වාගේම මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු කරුණු ජනතාවාදී වැඩ පිළිවෙළක් කරන්නේ කොහොමද කියන අභියෝගය අපි ඉදිරියේ තිබෙනවා කියන එක මා මේ අවස්ථාවේදී සිහිපත් කරන්න කැමැතියි. මොකද, බස්නාහිර පළාතේ ජනතාව අපව මේ පළාත් සභාවට පත් කරනු ලැබුවේ, ජනතාවාදී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරවන්න. අපි දැක්කා පසුගිය මැතිවරණ ප්‍රතිඵලවලදී ජනතාව විශාල වශයෙන් ඡන්දය දාන්න ගියේ නැහැ. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියා. ඒ වාගේම අපි දැක්කා පසුගිය වාරයේ පළාත් සභාව මෙහෙයවපු කණ්ඩායමේ බොහෝ දෙනෙක් ජනතාව ප්‍රතික්ෂේප කරපු විධිය. ඒකෙන් ගම්‍ය වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමයෙන් ජනතාව බලාපොරොත්තු වන ප්‍රතිලාභ, පහසුකම් තමන්ට ලැබිලා නැහැයි කියන එක. ජනතාවට ඒ ගැන සැකයක් තිබෙනවා. ඔවුන් හිතනවා, මේ පළාත් සභා ක්‍රමයෙන් තමන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමට, තමන්ගේ පහසුකම් ලබා ගැනීමට ප්‍රමාණවත් පිටිවහලක් ලැබෙන්නේ නැහැයි

කියලා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි ඉදිරියේ තිබෙන අභියෝගය වන්නේ, නිකම්ම කොළයකට සීමා වුණු ප්‍රතිපත්ති ප්‍රකාශයකට වඩා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු කරුණු ක්‍රියාකාරී සැලැස්මක් බවට පරිවර්තනය කරන්න, ජනහිතවාදී වැඩ පිළිවෙළක් බවට පරිවර්තනය කරන්න ඕනෑය කියන එක. ඒ අභියෝගය ඉදිරියට ගෙන යන්න නම් අපට පසුගිය පළාත් සභාවේදී අපි අතින් ගිලිහී ගිය කාරාණා පිළිබඳව වැඩි සැලකිල්ලක් යොමු කරන්න වෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම පසුගිය පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය දිහාත් මෙවර පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය දිහාත්, බැලුවාම පේන්නේ සුළු සුළු වචන හරඹයක් හැරෙන්නට එය ක්‍රියාකාරී සැලැස්මක් ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා නැහැයි කියන එක. ඒ නිසා ප්‍රගතිශීලී, නිර්මාණශීලී, ඒ වාගේම පරාර්ථකාමී වැඩ පිළිවෙළක් ක්‍රියාත්ම කළ යුතුයි. මා කැමැතියි මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ එක් තැනක සඳහන් කාරණයක් පිළිබඳව අවධානය යොමු කරන්න.

සිය බල ප්‍රදේශවල ජනිත වන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස ක්‍රියා කිරීමට ඇති ගැටළුව එක් බරපතළ ගැටළුවක් ලෙස මේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ජීවත් වෙන්නේ කොලොන්නාවේ. මගේ උපන් ගම කොලොන්නාව. හැමදාම උදේට ගෙදරින් එළියට එනකොට දැනෙන්නේ කුණු ගඳ. අහම්බෙන් වාගේ කුණු කන්ද තිබෙන පැත්ත බැලෙනවා. අර උදේට සමනල කන්ද දකිනවා වාගේ අපට කුණු කන්ද පේනවාද කියලා. මොකද, මේක එන්න එන්න ඉහළ යනවා. මීට සති දෙකකට කලිනුත් මේ කුණු කන්ද පාමුල ඉන්න පවුල් විසි ගණනක් පාසලකට ගිහිල්ලා ඇරලෙව්වා. මේ කුණු කන්දේ ප්‍රශ්නයට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 20 ක් වයසයි. අපේ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමිය ඉන්නෙත් ඒ කුණු කන්ද පාමුල. එතුමිය ඕනෑ නම් ඒ ගැන සත්‍ය හෙළි කරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 20 ක් ගත වෙලාත් මේ පළාත් සභාව කුණු ගැන උනන්දුවක් දක්වනවා නම් මේ ප්‍රශ්නය විසඳන්න තිබුණා. අද ඒක බරපතළ අර්බුදයක් බවට පත් වෙලා. ඒක නිසා මේ ප්‍රතිපත්ති ප්‍රකාශවල අඩංගු කාරණා පිළිබඳව යළිත් අවධානය යොමු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා මේකෙන් පෙනෙන්නේ මේ ක්‍රමය ක්‍රියාකාරී යාන්ත්‍රණයක් බවට පසුගිය අවුරුදු 26 ක පමණ කාලය තුළ සිද්ධ වෙලා නැහැ. ඇයි මේ පළාත් සභා ක්‍රමය ගෙන එන්නේ? අපි දන්නවා දැන් උතුරේ පළාත් සභාවක් හදලා තිබෙනවා. නමුත් මේ උතුරේ පළාත් සභාව හදපු ඒ බලාධිකාරිය දරන අය අද නහයෙන් අඬන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට තිබෙන බලතලවත් ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒක ගැන වඩාත් විස්තරාත්මකව කථා කරන්න ගියොත් අපට වෙනත් දේශපාලන කාරණා කථා කරන්න වෙනවා. අපි දන්නවා, මහින්ද චින්තන ඉදිරි වැඩ පිළිවෙළේ ඒ ගැන විශේෂයෙන් සඳහන් කරලා තිබෙනවා. මේකේ සඳහන් කරලා තිබෙනවා මේ වැඩ පිළිවෙළ ගැන ප්‍රශ්න තිබෙනවා නම් ඒක සංවාදයට ලක් කළ යුතුයි. මේකේ අනවශ්‍ය දේවල් අයින් කරලා අවශ්‍ය දේවල් තව තිබෙනවා නම්, ඒවා ඇතුළත් කරලා මෙය ක්‍රියාකාරී වැඩ පිළිවෙළක් බවට ගෙනෙන්න ඕනෑය කියලා. නමුත් මා මෙම සභාව ඉදිරියේ කියනවා, මෙහි සඳහන් කරුණු මෙතෙක් ඉටු වෙලා නැහැයි කියලා. එහෙම නම් මේ පිළිබඳව තවත් කාරණා ගණනාවක් පසුගිය කාලයේදී කථා බහට ලක් වුණා. ඒ තමයි උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් වාර්තාවේ අඩංගු නිර්දේශ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි එක තැනක කියනවා,

*"බලය බෙදා හැරීම අනිවාර්යයෙන්ම මහජන කේන්ද්‍රීය ස්වභාවයක් ගත යුතුය."*

ඒකේ තවත් කාරණා ගණනාවක් මතු කරලා පෙන්වනවා. මම කැමැතියි, එක කාරණයක්, දෙකක් මතු කරන්න.

*"රජය විවිධ ස්ථානවලදී සියලු ප්‍රජාවන්ට අයත් ජනයාට බලය පැවරෙන බව සහතික කිරීමට අවධානය යොමු විය යුතුය. බලය බෙදා හැරීම කවර හෝ ජනවාර්ගික ප්‍රජාවකට වරප්‍රසාදයක් හෝ අවාසියක් හෝ නොවිය යුතු අතර මේ අර්ථයෙන් ගත් විට රට තුළ සිටින කවර හෝ ජනවාර්ගික ප්‍රජාවකට අයත් ජනයා ඔවුන්ගේ ජාති හෝ ආගම නිසා වෙනස්කම්වලට භාජනය නොවිය යුතු අතර එලෙස සිදුවන බව නොපෙනෙන ලෙස කටයුතු කළ යුතුය."*

ඒ වාගේම එහි සඳහන් වෙනවා,

*"පළාත් සභා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය තුළ තිබෙන අඩුපාඩුකම්වලින් උගත් පාඩම් සැලකිල්ලට ගැනීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි."*

[ගරු ඇස්.කේ. කිදෙල්පිටිය]

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත්වල දේශපාලන නායකත්වය හා මහජනතාව අතර විශ්වාසය ඇති විය යුතුයි. එහෙම විශ්වාසයක් ජනිත කරන්න මේ පළාත් සභා ක්‍රමය පසුගිය කාලයේ සමත් වෙලා නැහැ. මම මේ සභාව ඉදිරියේ මතු කරලා පෙන්වන්න හදන්නේ මේ පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමේ මූලික හරය වූ ඒ හරයන්, ඒ බලාපොරොත්තු, ඒ අරමුණු මෙතෙක් ඉටු වෙලා නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේ පළාත් සභාව ක්‍රියාකාරී පළාත් සභාවක් බවට පත් කරලා, ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පළාත් සභාවක් බවට පත් කරලා එය ඉදිරියට ගෙන ගෙන යෑමේ වගකීමක් මේ පළාත් සභාවට තිබෙනවයි කියන එකයි. අපි ඔබ තමුන්නාන්සේලාට තිබෙනවා කියන එකයි. ඒ නිසා මේ දෘශ්‍යමාන ප්‍රගතියක් අත් කර ගැනීමේ ගමන අපි ඉදිරියට යා යුතුමයි. අපි නිර්මාණශීලී විය යුතුමයි. අපේ රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා මතු කළා. මම උදාහරණයක් හැටියට මේ කියන්නේ. අර දුම්වැටි පැකට්ටුවේ සඳහන් වන පණිවුඩය පිළිබඳව. අපි දුම්වැටි ගැන කථා කරනවා. දුම්වැටිය නිසා අපට ලැබෙන ප්‍රතිලාභ ගැන කථා කරනවා. අපට ලැබෙන බද්ද ගැන කථා කරනවා. එයින් ලැබෙන සෞඛ්‍ය හානිය ගැනත් මෙතුමන්ලා කථා කරනවා. නමුත් ඊට වඩා බරපතළ තත්ත්වයකට අපි මුහුණ දීලා ඉන්නවා. අපේ ගම් නියම් ගම් සියල්ල අද මත්ද්‍රව්‍යවලින් වෙලාගෙන ඉවරයි. අපි දන්නවා, කවුද මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාර කරන්නේ කියලා. මේවාට වග කියන්න ඕනෑ කවුද කියලා අපි දන්නවා. ඒ නිසා කරුණාකරලා (බාධා කිරීමක්) -

වෙස්ට් මිනිස්ටර් සම්ප්‍රදාය ගරු කරන අය. පාර්ලිමේන්තු සම්ප්‍රදාය. ඒ නිසා යම් මන්ත්‍රීවරයෙක් තමන්ගේ පළමුවැනි කථාව කරන කොට සම්ප්‍රදායක් තිබෙනවා, පොඩ්ඩක් නිහඬව අහගෙන ඉන්න. කරුණාකරලා ඒකට උදව් කරන්න. අපි කියන්නේ, මෙය නැති කිරීම සඳහා අපේ ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ නීතිය හා සාමය රැකීමේ වගකීමක් තිබෙනවා, අපේ ගරු ප්‍රධාන අමාත්‍යවරයාට. අපි මේ සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේ නීතිය ක්‍රියාත්මක නොවෙන තැන්වල කරුණාකරලා මේ වාගේ විනාශකාරී දේවල් නැති කරන්න. අඩුම වශයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ නිසා අවසාන වශයෙන් මම කැමැතියි මාටිං ලූතර් කිං වරක් කළ ප්‍රකාශයක් මේ සභාව ඉදිරියේ තබන්න. මෙය ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් වුණු අවස්ථාවක් නිසා.

*"තමන් ගමන් කළ යුත්තේ නිර්මාණාත්මක පරාර්ථකාමී භාවයේ අලෝකය තුළින්ද, නැතිනම් විනාශකාරී ආත්මාර්ථකාමී භාවයේ අඳුර තුළින්ද යන්න සෑම මිනිසෙකු විසින්ම තීරණය කළ යුතුය."*

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.50]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුලින්ම ස්තූතියක් කරන්න බලාපොරොත්තු වෙනවා. අගලවත්ත ආසනයේ ජනතාවටත්, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවටත්. දෙවන වතාවටත් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට අපව පත් කරන්න ලබා දීපු ශක්තිය සහ සහයෝගයට විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙන්න ඕනෑ. ඒ අයට ආචාරය පුද කරන්න මෙය අවස්ථාවක් කරගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඔබතුමන් අපේ නියෝජ්‍ය සභාපතිතුමා හැටියට පත්වීමත් අපට ගෞරවයක් හැටියට විශ්වාස කරනවා. මගේ ගමේම, මම ජීවත්වන ප්‍රදේශයේම උපන් කෙනෙකු හැටියට ඔබතුමා අද නියෝජ්‍ය සභාපතිවරයා හැටියට මූලාසනයේ ප්‍රථම වතාවට කටයුතු කරන අවස්ථාවේ මේ සභාව ආමන්ත්‍රණය කරන්න ලැබීමත් අපි සතුටට පත් වෙනවා වාගේම ඔබතුමන්ගේ සියලු කටයුතුවලට සුභාශිංසනය ගෙන එන්නත් මෙය අවස්ථාව කරගන්නවා කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම අද බස්නාහිර පළාත් සභාවේ රාජාසන කථාව විවාදයට භාජනය කරන අවස්ථාවේ විශේෂයෙන්ම අපේ ගරු ආණ්ඩුකාරතුමන් පිළිබඳව වචනයක් සඳහන් කිරීම අපේ යුතුකමක් හැටියට අපි සලකනවා. එතුමා මේ රටේ

කම්කරු පන්ති ව්‍යාපාරයේ නායකයෙකු හැටියට දීර්ඝ කාලයක් කටයුතු කරලා අත්දැකීම් ලබපු කෙනෙක් හැටියට, අද මේ පළාත් සභාවට නායකත්වයක් දෙන්න කටයුතු කරන කෙනෙක් හැටියට අපි එතුමාට අපේ ගෞරවය විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ජාතීන් අතරේ සහෝදරත්වය, ඒකාග්‍රතාවය අගය කරන මුස්ලිම් ජන කොට්ඨාශය නියෝජනය කරන කෙනෙක් හැටියට එතුමන් අපේ ආණ්ඩුකාර ධූරයට පත් වී තවදුරටත් කටයුතු කිරීම මම හිතනවා ජාතීන් අතරේ සහෝදරත්වය තවත් ශක්තිමත් වෙන්න එය විශේෂ කාරණාවක් වේවිය කියලා. ඒ වාගේම පළාත් සභා ක්‍රමය මේ රටේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් හැටියට යෝජනා වුණු ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙනවා. අද කොපමණ දුරට මෙම ක්‍රියාවලිය, බලය බෙදීමේ මෙම ක්‍රියාවලිය මෙම ප්‍රශ්නයට විසඳුමක් හැටියට ශක්තිමත් භාවයකට පත් වෙලා තිබෙනවාද කියන එක අපට නැවත ආවර්ජනය කරන්න අවස්ථාවක් හැටියට යොදා ගැනීම වඩාත් වැදගත් වෙනවා කියන එකයි අපි කල්පනා කරන්නේ. බස්නාහිර පළාත් සභාව හැටියට අපට පුළුවන්කමක් තිබෙන්න වෙනවා, යම් ප්‍රමාණයකට හෝ ස්වාධීනත්වයක් ඇතිව අපටම ආවේණික වුණු, අපට ගැළපෙන්නා වූ කරුණු පිළිබඳව වඩාත් විශේෂත්වයක් කරලා, බස්නාහිර පළාතේ ජනතාවට වඩාත් වැඩි සේවයක් කරන, වඩාත් ජනතාවදී ආයතනයක් බවට, ශක්තිමත් ආයතනයක් බවට බස්නාහිර පළාත් සභාව පත් කර ගෙන, ක්‍රියා කිරීම අද අවශ්‍ය වෙනවා කියන එකයි අපේ අදහස වෙන්නේ.

අපේ අසල්වැසි රටක් වුණු ඉන්දියාව දිහා අපි සැලකිල්ලෙන් බැලුවොත් සමස්ත ඉන්දියාවේ බොහෝ ප්‍රාන්තවලට පුළුවන්කම ඇති වෙලා තිබෙනවා වඩා හොඳ ආර්ථික තත්ත්වයක්, වඩා හොඳ සමාජ තත්ත්වයන් තමන්ගේ පළාත තුළ, තමන්ගේ ප්‍රදේශය තුළ ගොඩ නංවාගෙන ඉදිරියට යන්න. ඒ ශක්තිය ඇති වෙලා තිබෙන්නේ, ඒ අය ප්‍රාන්තයක් හැටියට කල්පනා කරමින් ඒ ප්‍රාන්තය දියුණු කරන්නේ කොහොමද? ඒ ප්‍රාන්තයේ ජනතාවට වඩාත් හොඳ සේවයක් කරන්නේ කොහොමද? කියන කාරණය පිළිබඳව යම් ස්වාධීනත්වයකින් කටයුතු කිරීම තුළයි කියන එකයි අපට පෙනෙන්න තිබෙන්නේ. මේ රටේ දළ දේශීය නිෂ්පාදිත ආර්ථිකය දිහා බැලුවොත් එයින් භාගයකට පමණ වගකීමක් දරණ පළාත හැටියට බස්නාහිර පළාත බවයි අපට කියන්න තිබෙන්නේ. ඉතින් මෙවැනි අතිවිශාල ආර්ථිකයකට කොටස්කාරයෙක් වන අපේ පළාත් සභාවට, අපේ පළාත් සභාව තුළ ජීවත් වන ජනතාව වඩාත් හොඳ ජීවන මට්ටමකට ගෙන එන්න, බස්නාහිර පළාත් සභාව හැටියට අපි කටයුතු කිරීමත්, මන්ත්‍රීවරු හැටියට පත් වෙලා ඉන්න අපගේත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේත් වගකීම බවට පත් වෙනවා කියන එකයි අපේ අදහස වෙන්නේ කියන එක ගරු නියෝජ්‍ය සභාපතිතුමාට විශේෂයෙන්ම සඳහන් කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම පළාත තුළ කථා කරන කොට වඩාත් වැදගත් ක්ෂේත්‍රයක් හැටියට අපට අධ්‍යාපනය සලකන්න පුළුවන් වෙනවා. අපේ පළාත තුළ අධ්‍යාපනයේදී ප්‍රධාන පාසල්වල හොඳ ප්‍රතිඵල ලබා දෙන්න පුළුවන් වුණත් ග්‍රාමීය පාසල්වලට ගියාම ඒ ප්‍රතිඵල ඒ ආකාරයට ලබා ගන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. සාමාන්‍ය පෙළ විභාගය වෙන්න පුළුවන්. උසස් පෙළ විභාගය වෙන්න පුළුවන්. සමත් වෙන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ පාසල් වඩාත් දියුණු කරන්න, ඒ පාසල් වඩාත් ශක්තිමත් කරන්න එම ග්‍රාමීය පාසල්වලට අවශ්‍ය කරන පහසුකම් තවත් වැඩි කරලා අපේ පළාත තුළ අධ්‍යාපනය සමතුලිත තත්ත්වයකට ගෙන ඒමේ අවශ්‍යතාවය අද විශේෂයෙන්ම ඉස්මතු වෙලා තිබෙනවා කියන එක විශේෂයෙන්ම රාජාසන කථාව තුළත්, ප්‍රතිපත්ති ප්‍රකාශය තුළත් සඳහන් කරලා තිබෙන දේ යථාර්ථයක් බවට පත් කරන්න උත්සාහ ගැනීම අද අපේ වගකීමයි කියන එකයි අපේ විශ්වාසය වෙන්නේ.

ඒ වාගේම අපි අපේ ආර්ථිකය වඩාත් ශක්තිමත් කරන්න, අපේ ආදායම් මාර්ගයන් වඩාත් දියුණු කර ගත්තොත් තමයි අපට පළාත හැටියට ශක්තිමත් විධියට කටයුතු කරන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම අපේ ග්‍රාමීය ප්‍රදේශ තුළ තේ කර්මාන්තය ඉතා හොඳින් කෙරෙනවා. ඒ වාගේම රබර් වගාව හොඳින් කෙරෙනවා. ඒ වාගේම ඇඟලුම් කර්මාන්තය අපේ ප්‍රදේශය තුළ තිබෙනවා. මේ කර්මාන්තවලට විද්‍යාව හා තාක්ෂණය වඩාත් උපයෝගී කර ගෙන අලුත් තාක්ෂණයන් යොදාගෙන අපි නිෂ්පාදනය කරන භාණ්ඩවලට වඩාත් වැඩි අගයක් එකතු කරන තැනකට අපට යන්න පුළුවන් වුණොත් එය අපේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නට, අපේ පළාත තුළ ජනතාවට වඩා යහපතක් වෙන්න අවස්ථාව ඇති කර ගන්න අපට ඉඩ ලැබෙයි කියලා විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒක නිසා අපි විශේෂයෙන්ම එම කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නය කියන කාරණාව තමයි මේ අවස්ථාවේ මතක් කරන්න බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන් නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට පළාත් සභාවේ නියෝජිතයෙක් හැටියට අපේ ගම් පෙදෙස්වල ජනතාව මුහුණ දෙන මූලික ප්‍රශ්නයක් බවට ඉඩම් පිළිබඳ ප්‍රශ්නය පත් වෙලා තිබෙනවා. බොහෝ දෙනාට රජයේ ඉඩම් තිබුණත් ඒ ඉඩම්වලට තවමත් බලපත්‍රයක්, ඔප්පුවක් නිරවුල් භාවයක් නොතිබීම ඔවුන් මහත් ව්‍යසනයකට පත් වෙන්න හේතු වෙලා තිබෙනවා. ඒක නිසා මෙම ඉඩම් ගැටලුව පිළිබඳව මේ පළාත් සභා කාලසීමාව තුළ අවසන් විසඳුමකට යන්න ඉඩකඩ අවස්ථාව ඇති කර ගනියි කියන බලාපොරොත්තුව විශේෂයෙන්ම සඳහන් කරමින් අද අපි සියලුදෙනා එකට එකතු වෙලා අපේ රටේ සංස්කෘතිය හා ඒ වාගේම දේශීයත්වය ආරක්ෂා වන විධියට සමාජ පරිසරයක් ගොඩනඟන්න මෙම බස්නාහිර පළාත් සභා කාලය තුළදී අවස්ථාව ඉඩකඩ ලැබේවායි කියන ප්‍රාර්ථනයත් එක්ක මෙම අවස්ථාවේ අපට අදහස් ප්‍රකාශ කරන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමන් ඉඩකඩ ලබා දීම පිළිබඳව එතුමන්ට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.00]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම කැමැතියි මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරන්න. විශේෂයෙන් මෙහි තුන් වැනි පිටුවේ සඳහන් කරනවා අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙහෙම.

*බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කරමින්, භෞතික හා මානව සම්පත් සැපයීම තුළින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීමට බලාපොරොත්තු වෙමි.*

නමුත් මම කැමැතියි, බස්නාහිර පළාතේ අධ්‍යාපනයේ කෙබඳු තත්ත්වයක්ද තිබෙන්නේ කියන කාරණය සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය යොමු කරන්න. විශේෂයෙන් බස්නාහිර පළාත තුළ පාසල් එක් දහස් තුන්සියයකට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. නමුත් මේ පාසල්වලින් සාතිශය බහුතරයක අද වැඩ බලන විදුහල්පතිවරු තමයි කටයුතු කරමින් තිබෙන්නේ. සුදුසුකම් නැති, ඒ ඒ පාසල්වලට අදාළ සුදුසුකම් සපුරලා නැති, දේශපාලන හිතවත්කම් මත පත්වීම් ලැබූ බහුතරයක් තමයි මේ පාසල් තුළ කටයුතු කරමින් තිබෙන්නේ. ඒ නිසා අද ප්‍රදේශයේ පාසල් විශාල ප්‍රමාණයක් බරපතළ කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. මෑත උදාහරණ අපට ඇති තරම් පෙන්වන්න පුළුවන්කම තිබෙනවා. මෑතම උදාහරණය තමයි කොළඹ අසෝක විද්‍යාලය. කොළඹ අසෝක විද්‍යාලයේ විදුහල්පති තනතුරට අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙක් අවශ්‍යයි. නමුත් දෙකයි එක විදුහල්පති සේවයේ විදුහල්පතිවරයෙක්ව දැම්මා, තමන්ගේ දේශපාලන උවමනාව ඉටු කරගන්න. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද ඒ පාසලේ ගුරුවරු 09 දෙනෙක්ව මාරු කරලා තිබෙනවා, මේ විදුහල්පතිවරයාට එකඟ නැති නිසා. ඒ විතරක් නොවෙයි. මේ විදුහල්පතිවරයාට එරෙහිව උද්ඝෝෂණය කරන්න කටයුතු කළා කියලා, දෙමව්පියන් සහ ගුරුවරු එකතු වෙලා උද්ඝෝෂණය කළා කියලා ගුරුවරු නව දෙනෙක් මාරු කරලා තිබෙනවා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වනකොට මේ වතාවේ සාමාන්‍ය පෙළ විභාගයට වාඩි වෙන්න ඉන්න දරුවෝ බරපතළ අසරණතාවයකට පත් වෙලා තිබෙනවා. ඇයි? වෙන කිසිවක් නිසා නොවෙයි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය

පෙළට උගන්වපු ගුරුවරුන්ව අත්තනෝමතික විධියට ස්ථාන මාරු කරලා තිබෙනවා. මේක තමයි අද පළාතේ තත්ත්වය. මේ එක පාසලක්. මේ විතරක් නොවෙයි.

දැන් එක මන්ත්‍රීවරයෙක් කථා කරද්දී කිව්වා ප්‍රධාන පාසල්වල හොඳ ප්‍රතිඵල දීලා තිබෙනවාලු. අද මීනුවන්ගොඩ ජාපාලවත්ත මහ විද්‍යාලයට සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? මීනුවන්ගොඩ ජාපාලවත්ත මහ විද්‍යාලය හැඳින් වූයේ පුංචි රාගම කියලා. ඇයි? මීට පෙර ඒ පාසලෙන් වෛද්‍ය විද්‍යාලයට අවුරුද්දකට 15 ක්, 20 ක්, 25 ක් ගියා. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද ඒ පාසල සම්පූර්ණයෙන්ම කඩන් වැටිලා තිබෙනවා. මේක තමයි පළාතේ අධ්‍යාපනයට අත් වෙලා තිබෙන ඉරණම. මේ විධියට ද භෞතික සම්පත් දීලා, මානව සම්පත් දීලා මේ පළාතේ අධ්‍යාපනය නඟා සිටුවන්නේ? ඒ විතරක් නොවෙයි. අද පළාත් අධ්‍යාපනයේ ඉහළම නිලධාරීන් කොහොමද කටයුතු කරමින් ඉන්නේ. අද පළාතේ ඉන්නවා, අධ්‍යාපනයට වගකියන අමාත්‍යාංශ ලේකම්වරයා. මම වගකීමෙන් කියනවා. පසුගිය අප්‍රේල් මාසේ 24 වැනිදා මම ගියා, ලංකා ගුරු සේවා සංගමයේ ලේකම්වරයා විධියට අසෝක විද්‍යාලයේ ගුරුවරුන් ටිකත් එක්ක ඒ ප්‍රශ්නය සාකච්ඡා කරන්න. කොහොමද ඔහු උත්තර දුන්නේ? එතුමා උත්තර දුන්නේ ඒ පුටුවට, ඒ තනතුරට ගරුත්වය තියලා නොවෙයි. අඩුම තරමින් පළාතට වගකියන අමාත්‍යාංශ ලේකම්වරයා විධියට කොහොමද කටයුතු කළේ? ගුරුවරුන්ට කිව්වා, මම පුද්ගලයින්ව මරන්නේ ටික ටික කියලා. මම ඉස්සරහා කිව්වේ. අවශ්‍ය තරම් සාක්ෂි තිබෙනවා. ඒ ගුරුවරු ටික අවශ්‍ය නම් අවශ්‍ය තැනකට කැඳවන්න පුළුවන්. එහෙම තමයි ඔහු කටයුතු කළේ. එහෙම තමයි ඔහු උත්තර දුන්නේ. ලැජ්ජයි. මෙහෙමද පළාතේ අධ්‍යාපනයට වගකියන ප්‍රධාන නිලධාරීන් කටයුතු කරන්නේ?

ඒ විතරක් නොවෙයි. අද පළාතේ අධ්‍යාපනයට වගකියන ප්‍රධාන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා කවුද? කවුද අධ්‍යක්ෂකවරයා? ගුරු කුලෙන් ගහලා පන්නපු, තර්ස්ටන් විද්‍යාලයෙන් ගහලා පන්නපු, තව පාසල් ගණනාවකින් ගහලා එළවපු, හූ කියලා එළවපු කෙනෙක් තමයි අද පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක විධියට කටයුතු කරන්නේ. හිටපු අධ්‍යක්ෂකතුමා අද ඉන්නවා අධ්‍යාපන අමාත්‍යාංශයේ. ඇයි? පළාත් සභාව විසුරුවා තිබෙද්දී 1 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරන්න එතුමාට 450 ක ලැයිස්තුවක් ආවා. එතුමා මේක භාර ගත්තේ නැහැ. එතුමා ඉල්ලුවා කලාප අධ්‍යක්ෂකවරුන්ගෙන් ඒ සම්බන්ධයෙන් වාර්තාවක්. මේ දරුවන් සම්මුඛ පරීක්ෂණවලට ඇවිල්ලා තිබෙනවාද? මේ දරුවෝ කොපමණ ලකුණු අරන් තිබෙනවාද? ඒ පාසලේ ලකුණු කීයද? අන්තිමට මොකක්ද සිද්ධ වුණේ? ආණ්ඩුකාරවරයා බල කළා. ඒ අදාළ නිලධාරීන්ට බල කළා, දේශපාලකයින් බල කළා. නැහැ, මේ ලැයිස්තුව අනිවාර්යයෙන් ගන්න ඕනෑ. ඊට පස්සේ එතුමා ඒක ප්‍රතික්ෂේප කළා. අන්තිමට කිව්වා බදාදා දවසක, රාජකාරි දවසක සවස දෙක වනකොට නියෝගය ක්‍රියාත්මක නොකිරීමට එරෙහිව උත්තර බඳින්න ඕනෑ. නැත්නම් හකුලන් යන්න ඕනෑ. අන්න අධ්‍යාපනයට අද අත් වෙලා තිබෙන ඉරණම. අද ඒක තමයි පළාතේ අධ්‍යාපනයට අත්වෙලා තිබෙන ඉරණම. ඒ නිසා අපි කියනවා රටක අධ්‍යාපනය තමයි වැදගත්ම. අනාගතය තීරණය කරන්නේ, අනාගතය කුමන දිහාවටද යන්නේ, අනාගත ඉලක්ක, අරමුණු තීරණය කරන්නේ අධ්‍යාපනය. ඒ නිසා බස්නාහිර පළාතේ අධ්‍යාපනයට අද එවැනි ඉරණමක් අත් වෙලා තිබෙනවා. අපි කියනවා. අපි මේ සභාවේ අවධානය යොමු කරනවා. මේ තත්ත්වය වහාම වෙනස් විය යුතුයි. පාසල්වලට සුදුසුකම් සහිත විදුහල්පතිවරු පත් කළ යුතුයි. අධ්‍යාපන තනතුරුවලට සුදුසුකම් සහිත නිලධාරීන් පත් කළ යුතුයි. ඒ විතරක් නොවෙයි. පළාතේ තිබෙනවා, කලාප එකොළහක්. වැඩ බලන අධ්‍යක්ෂකවරු කීයක ඉන්නවාද? සුදුසුකම් නැති කීදෙනෙක් ඉන්නවාද? කලාප එකොළහෙන් කීයක ඉන්නවාද? සුදුසුකම් සහිත අධ්‍යක්ෂකවරු පත් කරන්න කටයුතු කරලා නැහැ. එවැනි වටපිටාවක් තමයි පළාතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. මතුගම ශාන්ත මේරි විද්‍යාලය පසුගිය දවස්වල ඉල්ලුවා සපිරි පාසල්වට ඇතුළත් කරන්නය කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ පාසල් විරුද්ධ වුණා. අන්තිමට පාසලේ වහළයක් කැඩුණාට පස්සේ මොකක්ද දීපු උත්තරය. ඔබේ පාසල සපිරි පාසලක් කරන්න එකඟ වුණේ නැහැ. ඒ නිසා වහළය හදා ගන්න. එක ඕගොල්ලෝ කරන්න. වහළය කඩා වැටිලා දරුවන් අනතුරට පත් වුණොත් ඒකේ වගකීම විදුහල්පති දරන්න. මේක තමයි අද බස්නාහිර පළාතේ අධ්‍යාපනයට අත් වෙලා තිබෙන ඉරණම. ඒ විතරක් නොවෙයි, කල්පනා කරලා බලන්න. දැන් පරිසරය ගත්තත් - දැන් අපේ ගරු මන්ත්‍රීවරයෙක් අවධානය කළා, කොලොන්නාවේ කුණු කන්ද පිළිබඳව.

[ගරු මහින්ද ජයසිංහ ]

කොලොන්නාවේ නොවෙයි. පැලියගොඩට ගියත්, ජා - ඇළට ගියත්, වත්තලට ගියත්, කොච්චිකඩේට ගියත් මේ හැම තැනකම කුණු කඳු ගොඩ ගහලා. ප්‍රසන්න පුරවරයක් කරනවා කියලා කිව්වේ. හැබැයි අද පළාතේ යන්න බැහැ. අප්‍රසන්න පුරවරයක් වෙලා තිබෙනවා. ගඳ ගහනවා. නහය වහගෙන තමයි යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එවැනි වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ විතරක් නොවෙයි. අද සෞඛ්‍ය ගැන කථා කරනවා. මම පසුගිය ඉරිදා ගියා, බැස්ටියාවත්තේ, තලාහේනේ, මීගමුව ආසනයේ අවුරුදු 70 ක මාතෘ නිවාසයක් තිබෙනවා ගරා වැටිලා. වටිනා සම්පතක්. වටිනා ඉඩමක්. අක්කර දෙකකට වැඩිය භූමිය තිබෙනවා. වෛද්‍ය නිවාසය ගරා වැටිලා. හෙදියන්ට තිබුණු නිවාසය ගරා වැටිලා. සම්පූර්ණයෙන්ම අභාවයට ගිහිල්ලා. එහෙමද පළාතේ සෞඛ්‍ය නංවන්නේ. පනස් දාහකට ආසන්න ජනතාවක්, පවුල් පන්දාහක් විතර සේවය ලබපු මාතෘ නිවාසය අද ගරාගෙන වැටිලා තිබෙනවා. මෙහෙමද සෞඛ්‍ය නංවන්නේ? ඒ නිසා අපි දකිනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශය හුදු වචන මාලාවක් විතරයි. මේ වචන ක්‍රියාවට නඟන්න පසුගිය කාලය පුරාම කටයුතු කරලා නැහැ. ඒ නිසා අපි අවධාරණය කරනවා. ඉදිරියේදී මේ වචන ඇත්ත යථාර්ථයක් බවට පත් කරන්න. මේ වචන, වචනවලට සීමා නොවී මේවා පළාතේ ජනතාවට සේවය සලසන ආයතන බවට පත් කරන්න අවශ්‍ය කරන අරගලය, සටන කරනවාය කියන කාරණය අවධාරණය කරමින්, විශේෂයෙන්ම අධ්‍යාපනයට මේ තත්ත්වය වෙනස් කරන්න අපට කරන්න පුළුවන් උපරිම අරගලය - මොකද, අපි විශ්වාස කරනවා, පළාත් සභාවට විශේෂයෙන්ම තිබෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය තමයි වැදගත්ම. වැඩිම ආයතන ප්‍රමාණයක් තිබෙන්නේ අධ්‍යාපනයේ. පාසල්. ඒ නිසා පළාතේ අධ්‍යාපනය අතිශය වැදගත්. අන්න ඒ වෙනුවෙන් කරන්න ඕනෑ අරගලය කරනවා කියන කාරණය අවධාරණය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.09]

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

ගරු සභාපතිතුමනි, මේ VI වැනි පළාත් සභාවේ අපේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කිරීමේ යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වෙනවා. මට පෙර කථා කරපු විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වැදගත් කරුණු ටිකක් ඉදිරිපත් කළා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සභාවේ මේ අවස්ථාවේ මෙතැන නැහැ. බලය බෙදීම ගැන, බලය බෙදා යවන මේ සංකල්පය ගැන කථා කළා. අපි සන්තෝෂ වෙනවා. මම ඇහුවා අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට ඒක ඇහුණද කියලා. එතුමා ඇහුණා කියලා කිව්වා. සන්තෝෂ වෙනවා. ඒ වාගේම අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් කථා කරනකොට LLRC වාර්තාව සඳහන් කරලා, වාර්තාවේ කුමන ආකාරයෙන්ද මේ බලය බෙදීම ගැන, නැත්නම් පළාත් සභා ක්‍රමය ගැන, නැත්නම් මේ සංකල්පය ගැන සඳහන් වෙලා තිබෙන එක ගැනත් එතුමා සඳහන් කළා. එතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ අවස්ථාවේදී කවුරු මොනවා කීවත්, අර මම මගේ පළමුවැනි කථාවේදී කිව්ව පරිදි යුද්ධයෙන් පසුව, අවුරුදු 05 ක් ගත වෙලා තිබෙනවා කියලා කියනවා. අපේ රටේ දැන් ඉතිරිවෙලා තිබෙන පළමුවැනි කාර්යභාරය මොකක්ද කියනවා නම් ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන එක තමයි. අනික් හැම ප්‍රශ්නයම ලැයිස්තුවේ පල්ලෙහාට තමයි එන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙනවා නම්, අවංකභාවයක් තිබෙනවා නම් මේ සම්බන්ධව අපට ක්‍රියාත්මක වෙන්න තිබෙන එකම මාර්ගය මේ පළාත් සභාව තමයි. මේ පළාත් සභාව ආරක්ෂා කර ගනිමු. පළාත් සභාවේ බලය - ඇතැම් බලතල ගිය සැරේ මේ සභාවත් මධ්‍යම ආණ්ඩුව ලබා ගත්තා. අපි දන්නවා. ඒ ගැන අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. එතුමා කිව්වා අපේ මහ ඇමැතිතුමාම යෝජනා ඉදිරිපත් කරලා බලය ආපසු මධ්‍යම ආණ්ඩුවට ලබා දුන්නාය කියලා. කෙසේ වෙතත් මම කියන්නේ මේ සභාව ආරක්ෂා කර ගනිමු. නීතිය යටතේ තිබෙන බලය අපි ක්‍රියාත්මක කරමු කියලා

කියනවා. අපි දන්නවා, පළාත් සභාවට 13 වැනි සංශෝධනය හරහා පොලිස් බලය තිබෙනවා. නීතිය හා සාමය බලය තිබෙනවා. දැන් ගරු මහ ඇමැතිතුමාගේ විෂයය ගැන අපි සොයා බලන කොට ලේබල් එකේ තිබෙනවා. නීතිය හා සාමය බලය මහ ඇමැතිතුමාට තිබෙනවා. රට පුරාම ඉන්න හැම පළාත් සභාවකම මහ ඇමැතිවරුන්ට තිබෙනවා. නමුත් දේශපාලනික වශයෙන් ඔබතුමන්ලා ඒ බලය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ, සන්ධානයේ ප්‍රතිපත්ති නිසා ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ ගැන මම කථා කරන්නේ නැහැ. ඒක වෙන අවස්ථාවක කථා කරමු. මම දන්නේ නැහැ, මම කොපමණ දවසක් මේ පළාත් සභාවේ ඉන්නවාද කියලා. නමුත් අනාගතයේ දවසක් දාගෙන අපි ඒ ගැන සාකච්ඡා කරමුයි කියලා මම කියනවා. කෙසේ වුණත් ගරු සභාපතිතුමනි, මම හිතනවා පොලිස් බලය, නැත්නම් නීතිය හා සාමය පිළිබඳ බලය පාවිච්චි නොකරත් ඒ සම්බන්ධව, නීතිය හා සාමය ගැන අපට වගකීමක් තිබෙනවා. මම හිතනවා, ගරු මහ ඇමැතිතුමා ඒක පිළිගන්නවා කියලා. වගකීමක් තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාව තුළ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක තුන තුළ නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීමේ වගකීම අපට තිබෙනවා. ඒකෙන් අපට ලිස්සලා යන්න බැහැ. බලය පාවිච්චි කරන්නේ නැති එක වෙන දෙයක්. නමුත් වගකීම තිබෙනවා.

දැන් බලන්න. මම සඳහන් කරන්න කැමැතියි. මේ VI වැනි පළාත් සභාව පිහිටෙව්වාට පස්සේ මේ මාසයේ 10 වැනිදා, මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරු සඳහන් කළා. අලුත්ගම නගරයේ අවාසනාවන්ත සිදුවීමක් සිදු වුණා. කවුරුත් දන්නවා නේ? කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හොඳටම දන්නවා. බස්නාහිර පළාතේත් දන්නවා. මොකද වුණේ කියලත් දන්නවා. එතැන අලුත්ගම ව්‍යාපාරික ආයතනයක් ගිනි තියලා විනාශ කළා. මම හිතන්නේ කෝටි හතරක්, පහක් විතර පාඩුයි කියලා මම දන්නවා. ඒ අයිතිකරු මහත්මයා මුස්ලිම් මහත්මයෙක්. අපි හංගන්න ඕනෑ නැහැ නේ? මුස්ලිම් මහත්මයෙක්. එතුමා මම පෞද්ගලිකව දන්නේ නැහැ. නමුත් මම දන්නවා, එතුමා මහ පාරේ සිට වෙළඳාම කරලා තමුන්ගේ දක්ෂකම නිසා, හැකියාව නිසා දියුණු වෙලා ලොකු ව්‍යාපාර ආයතනයක් හදලා තම ව්‍යාපාරය කරමින් සිටියා. වටේ ඉන්න හුඟාක් අය එතුමා ගැන විශාල විධියට ඉරිසියාවක් තිබුණු බව දන්නවා. ඉරිසියා වෙලා ඒ ආයතනය විනාශ කරන්න ඕනෑය කියලා අවස්ථා බල බලා සිටියා. එතකොට මේ ආයතනයට පාරිභෝගිකයෙක් හැටියට බඩු ගන්න ගිය පිරිසකට ඒ ආයතනයේ ඉන්න, ආයතනයේ අයිතිකරුගේ ඥාතියෙක් කියන එක පුද්ගලයෙක් වැරැදි විධියට හැසිරුණා කියලා චෝදනාවක් එල්ල වුණා. පොලිසියට ගියා. අධිකරණයට ගියා. ඒක පොලිසියේ වැඩක්. ඒක පොලිසියේ රාජකාරියක්. ඒකට අපට ඇඟිලි ගහන්න බැහැ. පසුව සමහර අය ඒක පදනම් කරගෙන පෙළපාළි ඇවිල්ලා තර්ජනය කරලා තිබෙනවා. අපි දන්නවා ඒක වුණා. ගරු සභාපතිතුමනි, මේ වුණ අපරාධය නම් ඒ ආපු අය ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා. අද අපි ගිනි තියනවා කියලා.

**ගරු ප්‍රසන්න සංජීව**
Hon. Prasanna Sanjeewa

ඔබතුමාට ඇහුණද?

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

අපි ගිනි තියනවා කියලා තිබෙනවා. එහෙම කියලා ගිනි තියලා තිබෙනවා. ඒ පළාතේ මන්ත්‍රීවරයා. දැන් මන්ත්‍රීවරයාගේ පක්ෂය ආණ්ඩු පක්ෂයේ කොටස්කාර පක්ෂයක්. මුස්ලිම් කොංග්‍රස් පක්ෂය. මන්ත්‍රීවරයා ඒ පළාත භාරව ඉන්න ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන් පෙරේරා මහත්මාට කථා කරලා,මෙන්න බලන්න අපට තර්ජනය කරනවා. ඔන්න අහගන්න. ගිනි තියනවා කියලා කියනවා. අපට ආරක්ෂාව දෙන්න කියලා කියල තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්‍රකාශය ඉදිරිපත් කරන්න පුළුවන්ද දන්නේ නැහැ.

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

කිව්වාට පස්සේ එදා රෑ ගිනි තියලා විනාශ කළා.

**ගරු ප්‍රසන්න සංජීව**
Hon. Prasanna Sanjeewa

අපචාර කරලා, තමුන්නාන්සේ ළමා අපචාර ගැන කථා කරනවා. ඒවා ගැනත් කියන්න කෝ.

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

ගිනි තියලා විනාශ කළා. ඉතින් මොනවද? ගරු සභාපතිතුමනි, මේක ඇවිල්ලා කියලා කරලා තිබෙන අපරාධයක්. ඉතින් ඒ නිසා මේ වාගේ අපරාධ සිදු වෙනවා නම්, මේ වාගේ සිදුවීම් සිදු වෙනවා නම් මේවාට අපට ඉඩ දෙන්න බැහැ. නීතිය හා සාමය බලය ඔබතුමන්ලා පාවිච්චි කරන්න. ඒක අපට තේරෙනවා. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

මේ වාගේ නීතිය හා සාමය කඩ කිරීම සම්බන්ධව වගකීම අපට තිබෙනවා. ඒකට ඉඩ දෙන්න බැහැ. එහෙම වුණා නම් ගරු සභාපතිතුමනි, මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වෙලා තිබෙන මෙන්න මේ ආර්ථික ඉලක්කය අපට ලබා ගන්න බැහැ. ලබා ගන්න බැහැ අපට. මොනවත් ලබා ගන්න බැහැ.

**ගරු ප්‍රසන්න සංජීව**
Hon. Prasanna Sanjeewa

මේ සිද්ධිය ගැන පොඩ්ඩක් කියන්න.

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

ඒ නිසා ආර්ථික ඉලක්ක ලබා ගන්න ඕනෑ නම්, සංවර්ධනය ඇති වෙන්න ඕනෑ නම් - නීතිය හා සාමය කඩා වැටිලා තිබෙනවා නම් සංවර්ධනය කවදාවත් අපට ලබා ගන්න බැහැ. සංවර්ධන ඉලක්ක ලබා ගන්න බැහැ. මේ ඒ පරීක්ෂණය කරන්න බැහැ. ඒක කවුරුත් දන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකරලා මේ පළාත් සභාවේ, අපේ අතීතය අතහැරලා දමමු. දැන් මේ සභාවේ අපි නීතිය හා සාමය බලය පාවිච්චි නොකළොත් - ඒ ගැන අපට තිබෙන වගකීම අපේ බලාපොරොත්තුව, අපේ ඕනෑකම, මම ගරු මහ ඇමැතිතුමාට කියනවා. අපේ දුක මේ රටේ නීතිය හා සාමය, පොලිස් බලය ක්‍රියාත්මක කරන ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න ඉහළ නායකවරුන්ට ඒ ගැන සඳහන් කරන්න. සභාවේ අපේ දුක, අපේ බලාපොරොත්තුව, මේ වුණ සිදුවීම ගැන අපට තිබෙන තරහව සඳහන් කරන්න. මේක වැරදියි. මේක කරන්න බැහැ. මේ රටේ සිංහල ජනතාව, දෙමළ ජනතාව, මුස්ලිම් ජනතා, හින්දු ජනතාව, ඉස්ලාම් ජනතාව, බෞද්ධ ජනතාව, කතෝලික ජනතාව එක්සත්ව එක පවුලක් හැටියට ජීවත් වෙනවා. එහෙම වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමගේ කාලය අවසන්.

**ගරු මනෝ ගනේෂන්**
Hon. Mano Ganeshan

නමුත් මේ වාගේ අවාසනාවන්ත සිදු වීම් නිසා තමුන්ගේ ජාතිවාදය අවුස්සලා, ආගම් වාදය අවුස්සලා, අන්තවාදය අවුස්සලා තමුන්ගේ පෞද්ගලික උවමනාව ඉෂ්ට කරනවා නම් ඒකට ඉඩ දෙන්න බැහැ. එහෙමනම් මේ සභාවේ අපි ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරලත්, මොනවා කථා කරලත් වැඩක් වෙන්නේ නැහැයි කියමින් මම නවතිනවා. ස්තුතියි. නන්රි.

**ගරු ප්‍රසන්න සංජීව**
Hon. Prasanna Sanjeewa

බේරුවල ආසනයේ ජාතිවාදය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.16]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා VI වන පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ ප්‍රකාශය සම්බන්ධව මේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. කොහොම වුණත් VI වැනි පළාත් සභාවේ නිල වශයෙන් අපේ වැඩ කටයුතු ආරම්භ කරන මොහොතේදී මේ අවස්ථාවේ එක පැත්තකින් සතුටක් තිබෙනවා මේ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන. ඒ වාගේම දුකක් තිබෙනවා මෙවැනි විහිළුකාර ලියවිල්ලක් සම්බන්ධයෙන් විවාදයකට සම්බන්ධ වෙන්න ලැබීම ගැන. මොකද, මේක විහිළුකාර ලියවිල්ලක් කියලා කියන්නේ,

මීට කලින් ගරු ආණ්ඩුකාරතුමා වර්ෂ 2009 දීත් ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළා. දැන් මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන කරුණුවලින් කීයක් සම්පූර්ණ කරලා තිබෙනවාද? මේක නිකන් සුරංගනා කථාවක්, හිස් ලියවිල්ලක්, පුස් දෙඩවිල්ලක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒකයි මම කිව්වේ මට තේරෙන්නේ නැහැ මේ විහිළුකාර ප්‍රකාශයට ස්තුති යෝජනාව ඉදිරිපත් කරන්න ඇයි මේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාව තෝර ගත්තේ කියලා. එතුමා මේ සභාවේ ඉන්න ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. මම දන්න හැටියට ඇමැතිකමේ හොඳට කටයුතු කරපු කෙනෙක්. කීර්තිමත් ඉතිහාසයක් තිබෙන දේශපාලඥයෙක් කියලා අපි විශ්වාස කරනවා. මේ පසුගිය පළාත් සභා ඡන්දයේදී රජ පවුලේ අනුග්‍රහයෙන් තොරව පළාත් සභාවට පත් වුණු කෙනෙක්. තමන්ගේ ස්වශක්තියෙන්. ඉතින් එහෙම කෙනෙකුට මේ යෝජනාව ලියලා දීලා ඇයි එතුමාත් විහිළුකාරයෙක් බවට පත් කළේ කියලා මට දෙගඩියාවක් තිබෙන්නේ. සමහරවිට ඉදිරියේදී අර පොදු අපේක්ෂයා පිළිබඳ කථාබහ කරනකොට එතුමා චන්ද්‍රිකා නෝනාගේ පැත්තේ හිටගනීවි කියලා සැකයක්, අවිශ්වාසයක් ආණ්ඩුව පැත්තට තිබෙනවාද දන්නේ නැහැ. දැන් මේ යෝජනාව බලන්න. මේක Expire වෙලා තිබෙන්නේ.

*ජනවරමින් නැවතත් තහවුරු කළ අපරිමිත ජනතා විශ්වාසයට ගරු කරමින්,*

මේ යෝජනා ඉදිරිපත් කරන්නේ එහෙමයි. අපරිමිත ජනතා විශ්වාසයට ගරු කරමින්, ගරු සභාපතිතුමනි, 2009 දී සන්ධානය ඡන්ද අරන් තිබෙනවා, පහළොස් ලක්ෂ හයදාහක්. දළ වශයෙන්. මේ අවුරුදු හතරහමාර ඉවර වෙලා එනකොට දහතුන් ලක්ෂ හැට තුන් දාහයි. එක් ලක්ෂ හතලිස් දෙදාහක් අඩුයි. අපරිමිත ජනතා විශ්වාසය. ඡන්ද එක් ලක්ෂ හතලිස් දෙදාහක් අඩුයි. ප්‍රතිශතයෙන් 64.7 බැහැලා 53.3 ට. අපරිමිත ජනතා විශ්වාසය. ආසන ගණන. මන්ත්‍රී ධූර ගණන 68 සිට 56 දක්වා බැහැලා. 12 ක් අඩු වෙලා. අපරිමිත ජනතා විශ්වාසය. කොළඹ දිස්ත්‍රික්කයේ 45% යි. අපරිමිත ජනතා විශ්වාසය. අපි දන්නේ නැහැ මේ කොහෙන් ආපු වචනද කියලා. ඔන්න ආණ්ඩුවට තිබෙන අපරිමිත ජනතා විශ්වාසය. අපි හිතන්නේ, මේ රටේ ජනතාවට, පාසල් ශිෂ්‍යයන්ට විශේෂයෙන් තේරුම් ගන්න පුළුවන්, ආදර්ශයක් ගන්න පුළුවන් ආණ්ඩුවෙන්. මොකක්ද? ඡන්ද අඩු වෙලා, ප්‍රතිශතය අඩුවෙලා, ආසන ගණන අඩු වෙලා කොහොමද දිනුවා වාගේ ඉන්නේ කියලා. දැක්කද අර *ගිය ගමනත් නොගිය ලෙසින් දැක්කද මං ආවා* කියන්නේ. ඒ වාගේ ඡන්ද අඩු වුණාට පස්සේ, ඒත් කොහොමද නිකන් ගට තියාගෙන, අපරිමිත විශ්වාසය තියාගෙන ඉන්නේ කියලා ආදර්ශයක් ගන්න පුළුවන් නම් මේන් ආණ්ඩුව. එතකොට දැන් කියනවා, පසුගිය කාලයේදී මේ යෝජනාවෙදී එතුමා කියනවා. එතුමා ලියලා දීපු යෝජනාවේ ද සාධාරණ හා ඵලදායි දේශපාලන අදහස්වලට ඉඩ දුන්නාය කියලා. අපි දැක්කා නේ? පසුගිය පළාත් සභාවේ මේ රටේ පාසල් සහ විශ්ව විද්‍යාල අධ්‍යාපනයට 6% ක් වෙන් කරන්න කියලා මධ්‍යම රජයට යෝජනා කරමුයි කියන යෝජනාව සභාවට ආවාට පස්සේ මොකද වුණේ? අධ්‍යාපනය ගැන කිඹුල් කඳුළු හෙලන පොඩි පොඩි පක්ෂ ඇතුළු ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා ඒක පරාජය කළා. ඉඩ දුන්නාද? ඒවාට ඉඩ නැහැ. ඒවාට තමන්ගේ තුනෙන් දෙකේ බලය ඒ කාලේ පාවිච්චි කළා. එහෙම තමයි මේක ගියේ. ඒ විතරක් නොවෙයි. මේක විහිළුකාර ප්‍රකාශයක් කියලා කියන්නේ, මම මේ ගිය සැරේ හැන්සාඩ් එක ගෙනාවා. ඒක මම පෙරළාගෙන යනකොට අහුවුණා, මේ විවාදයට සම්බන්ධ වෙලා තිබුණා අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා. හරිද? එතකොට එතුමාට සමූපකාර අමාත්‍යාංශය තිබුණා. සමූපකාර අමාත්‍යාංශය දියුණු කරන හැටි ආණ්ඩුකාරතුමා කියපු දේවල් ගැන එතුමා හරි හොඳට කියනවා මෙහෙම.

"*ආණ්ඩුකාරතුමාගේ ප්‍රකාශය අනුව සමූපකාර ක්‍රමය අර මීයා,* කවුද? (බාධා කිරීමක්) නැහැ. *හිටපු සමූපකාර ඌරු මීයා, හික් මීයා, මී පැටව්, හිටපු සමූපකාරය අපි වෙනස් කරලා බෙන්ස් කාර් එකේ යන අපේ ලිප්ස්ටික් නෝනව උගත් බුද්ධිමත් පාරිභෝගිකයාව සමූපකාරයට ඇතුල් කරන්න අපි කටයුතු කරනවා.*"

අර මීයව අයින් කරලා ලිප්ස්ටික් නෝනව සමූපකාරයට ඇතුල් කරන්න ක්‍රමයක් හදනවාලු. දැන් සමූපකාරයෙන් අයින් වුණේ නෝනද? මීයද? දැන් මීයා එළියේ. එතුමාට සමූපකාර ඇමැතිකමත් නැති වුණා, මේකෙන් පස්සේ. ඔන්න එතුමා විවාදයට සම්බන්ධ වෙලා කියපු කාරණාව. දැන් මේ කොහෙද කරලා තිබෙන්නේ? දැන් මේ ආණ්ඩුවේ මහින්ද චින්තනය ගත්තත් මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගත්තත් දේශීයත්වය ගැන, අධිරාජ්‍ය විරෝධය ගැන, දේශප්‍රේමීත්වය ගැන, ඒ තවරාගෙන හැම තිස්සේම ඒවා කථා කරන

[ගරු නලින්ද ජයතිස්ස]

ආණ්ඩුවක් නේ? දැන් අපි අහන්නේ පසුගිය කාලයේ තමුන්නාන්සේලා ඉදිරිපත් කළා මෙහෙම. බස්නාහිර පළාතේ සංස්කෘතික හා කලා කටයුතු -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

සමූපකාර අයින් කරලා මහා මාර්ග දුන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක හොඳයි නේද? ඒක තමයි. වෙලාවට සංස්කෘතික දුන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හොඳ වේලාවට පාර මීයෝ කන්නේ නැත්තේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

*"බස්නාහිර පළාතේ අංගසම්පූර්ණ සෞන්දර්යය නිකේතන තුනක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත."*

හරිද? මේ තිබෙන්නේ නාඩා එක දියුණු කරනවා. රොජර් ගරු මන්ත්‍රීතුමා නැහැ නේ නේද?

*"නාඩා එක දියුණු කරනවා. බස්නාහිර පළාතේ අංගසම්පූර්ණ සෞන්දර්ය නිකේතන තුනක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත."*

සෞන්දර්ය නිකේතන කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, දැන් ඔන්න බස්නාහිර පළාතේ හදනවා - එන්න ඕනෑ, හරි නම් මෙවර ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් විය යුතු අත්‍යවශ්‍ය දෙයක් තිබෙනවා, ආණ්ඩුව පැත්තෙන්. මොකක්ද? ආණ්ඩුවේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගය වුණු අර කැසිනෝ ශාලා තුන ඉදි කිරීම ගැනත් දාන්න ඕනෑ. ඇයි? ආණ්ඩුවේ ආර්ථික සංවර්ධන උපාය මාර්ග ඒක. තෙල් ගොඩ ගැනීම නොවෙයි. ඛනිජ සම්පත්වලින් රට ගොඩනැඟීම නොවෙයි. අපේ මුහුදේ සම්පත් ගොඩගැනීම නොවෙයි. කැසිනෝ ශාලා හදන එක. මේ බස්නාහිර පළාත් සභාවට අයිති කොළඹ නගරයට ප්‍රවිශ්ට වෙන -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න. ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා, එතුමාට තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කෑ ගැහුවොත් මම අහනවා ගුරුළුගෝමීන් ගැන. හරිද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කොඩිකාර ගරු ඇමැතිතුමාට බැංකොක් යන්න ඕනැත් නැහැ කැසිනෝ ආවාට පස්සේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

බේරේ වැව ඉස්මත්තේ අක්කර හතරක් දුන්නා. රවී විජේරත්නගේ අක්කර හතර. ඒ හතරේ හදනවා කැසිනෝ ශාලාව. දැන් මේ බස්නාහිර පළාතේ තිබෙන හොඳම ඉඩකඩම් ටික කැසිනෝකාරයින්ට දීලා ඕන් කැසිනෝ ශාලා හදනවා. ඒක නේ? අර හෙළ උරුමයේ අතුරලියේ රතන හාමුදුරුවෝ, චම්පික රණවක ගරු ඇමැතිවරයා විරුද්ධ වුණේ. අනේ බොහොම ස්තුතියි එහෙම විරුද්ධ වුණාට. දැන් මේ කැසිනෝ එක ගේනවා කියලා හරි පැහැදිලියි. ඒ නිසා අපි කියන්නේ, ආණ්ඩුවට හොර බොරු කරන්න ඕනෑ නැහැ. කොළේ වහන්න ඕනෑ

නැහැ. ලෝකයට පරකාසේ ගෙදරට මරගාතේ ආණ්ඩුව. දාන්න මේකට කැසිනෝ ශාලා හදනවා කියලා. ඔය, හරියට වැඩේ කෙරෙනවා නිසා තමයි එතුමා දුවගෙන ආවේ. කැසිනෝ ශාලා හදනවා කියලා දාන්න. මේක තමයි මේ ආණ්ඩුවේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේවා ඇවිල්ලා නිකන් හිස් වචන ගොඩක් විතරයි. මේවා කරන දේවල් නොවෙයි. මේවා ගත්තොත් එහෙම නිකන් වචන ටිකක් දාලා - මෙතුමන්ලා දන්නේ නැහැ මේ රටේ මොකක්ද වෙන්නේ කියලා. ආර්ථිකයට මොකක්ද වෙන්නේ කියලා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළා, පළාත් සභා ක්‍රමය ගැන. අපි අහන්නේ අවුරුදු 26 ක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභා ක්‍රමයට අවුරුදු 26 ක් වෙනවා. අවුරුදු 26 ක් පළාත් සභා ක්‍රමය ඇවිල්ලා. හැබැයි රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 45% ක් තවම උපයන්නේ බස්නාහිර පළාත් සභාව. අපි අහන්නේ 45% ක් උපයන්න දායක වන මේ කළුතර, කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල ජනතාවට හරියන විධියේ සෞඛ්‍ය පහසුකම් ටිකක් දීලා තිබෙනවාද? දැන් මේ සැරෙත් ඉලක්කය වෙලා තිබෙන්නේ මොකක්ද? ජනතාවගෙන් 1000 ට එක වෛද්‍යවරයෙක්. ජනතාවගෙන් 1000 ට එක වෛද්‍යවරයෙක්. බස්නාහිර පළාතේ තමයි වැඩිපුරම වෛද්‍යවරු ඉන්නේ. ජනතාවගෙන් 1000 ට - අඩු තරමින් 500 ට එකක්වත් තිබුණා නම් පිළිගන්න තිබුණා. සෞඛ්‍ය වැටිලා. අධ්‍යාපනය වැටිලා. ඒ නිසා මේ ඉදිරිපත් කරලා තිබෙන පුස් ලියවිල්ලක්. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාගේ කරේ ගහලා, එතුමාවත් අපහසුතාවයට පත් කරලා තිබෙන්නේ. මෙතුමා අහුවෙලා තිබෙන්නේ. ඒ නිසා මට කනගාටුයි. මේ වේලාවේදී මේ ලියවිල්ල නොවෙයි. මේ රටේ සැබෑ ආර්ථික සංවර්ධනයක්, ජනතාවට ලැබෙන සැබෑ ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගන්න හැමදෙනාත් එක්කම එකතු වෙලා වැඩ කරන්න ඕනෑය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.26]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මා අතිශයින් ස්තුතිවන්ත වෙනවා VI වැනි පළාත් සභාව වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළ මොහොතේ එතුමාගේ ස්තුති යෝජනාවට වචනයක් ප්‍රකාශ කරන්න ලබා දීපු අවස්ථාව පිළිබඳව. ඒ වාගේම මම අපේ සහෝදර අනෙකුත් ගරු මන්ත්‍රීවරු වාගේම පසුගිය පළාත් සභා මැතිවරණයේදී අඛණ්ඩව මේ පළාත් සභාවේ නියෝජිතයෙක් හැටියට මට එන්න අවස්ථාව සලසා දීපු පානදුර ආසනය ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ සහෝදර ජනතාවට මගේ ගෞරවය, ප්‍රණාමය පුද කරන්න මම මෙය අවස්ථාවක් කොට ගන්නවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, පසුගිය පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය ඇතුළු විෂයයන් ගණනාවක අමාත්‍යාංශ වගකීම් පවරලා මට ඒ තුළින් පළාතට සේවාවක් කරන්න අවස්ථාවක් ලබා දුන්නු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා. ඉතාමත් අවංකව මගේ ජීවිතයේ මා විශ්වාස කරන ආගම අනුව මගේ මතු ආත්මයට යහපත් ප්‍රවේශයක් ඇති කරගන්න ඒ ලබා දුන්නු අවස්ථාව පිළිබඳව -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට ආරංචියි බැන්නා කියලා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

වචනයකින්වත් බැන්නේ නැහැ. ඒ වාගේම ඒ පළාත් සභාවේදී මගේ කටයුත්ත, මගේ කාර්ය භාරය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමැතිකම අයින් කරලාත් කියනවා, රාජපක්ෂ සරණං ගච්ඡාමි ලු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රංජිත් සෝමවංශට දීලා තියෙන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

රංජිත් සෝමවංශ කියන්නේත් 93 මාත් එක්කම පළාත් සභාවට ආපු මගේ ගරු මන්ත්‍රීවරයෙක්. එතුමාට ඒ අවස්ථාව මගේ දිස්ත්‍රික්කයෙන් ලැබීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂය වාගේ කිසිම කුහකත්වයක් මගේ හදවතේ නැහැ. ඒ පිළිබඳව කළබල වෙන්න කිසිම කාරණාවක් ඇත්තේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපි එකිනෙකාට ඇණකොටා ගන්න සූදානමකුත් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙන මොනවා කරන්නද ඉතින්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

බොරු කියන්න එපා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමාව මගේ දිස්ත්‍රික්කයෙන් මම යෝජනා කළේ. ඒ නිසා මෙතුමාටත් තනතුරු පිළිබඳව වේදනාවක් පවතිනවා ගරු සභාපතිතුමනි. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. කෙසේ වෙතත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් සමාවෙන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කාලය දීර්ඝ කළ යුතු වෙනවා. කාලය දීර්ඝ කරන ලෙස මම යෝජනා කරනවා.

# රීති අංක 09 යටතේ යෝජනාව
# MOTION UNDER RULE NO. 09

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, "*අද දින න්‍යාය පත්‍රයේ අංක 04 යෝජනාවේ වැඩ කටයුතු අවසන් වනතුරු මෙම සභාවේ කාලය පැය භාගයකින් දීර්ඝ කළ යුතු යැයි*"යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙකම දාන්න ගරු ඇමැතිතුමා. අංක 04 යෝජනාවයි. අංක 31 'අ' යෝජනාවත්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, "*අද දින න්‍යාය පත්‍රයේ අංක 04 යෝජනාව සහ 31 'අ' යෝජනාවේ වැඩ කටයුතු අවසන් වනතුරු මෙම සභාවේ කාලය පැය භාගයකින් දීර්ඝ කළ යුතු යැයි* " යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැය භාගයක් කියන්න බැහැ. වැඩ කටයුතු අවසන් වනතුරු

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

හොඳයි. හොඳයි. මම ආපසු යෝජනාව ඉදිරිපත් කරනවා, පැහැදිලි වීම සඳහා.

*"න්‍යාය පත්‍රයේ අංක 04 හා 31(අ) යටතේ ඉදිරිපත් කළ යෝජනාවේ විෂය පිළිබඳ වැඩ කටයුතු අංක 8(5) හා 8(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යුතු යැයි යෝජනා කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, පසුගිය පළාත් සභා කාලය තුළ මට මේ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යෑම සඳහා සහයෝගය දක්වපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, එවකට හිටපු මගේ අමාත්‍ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට,

ඒ වාගේම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේදී මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම ගරු ආණ්ඩුකාර අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා විටෙක ආදරණීය තාත්තා කෙනෙක් වාගේ. විටෙක ආදරණීය මිත්‍රයෙක් වාගේ. ඉතාමත් සහෝදරාත්මකව, යම් යම් ගැටලු මතු වුණු අවස්ථාවලදී, එතුමාගේ උපදෙස් ප්‍රාර්ථනා කරපු හැම අවස්ථාවකම අප වෙත දක්වන ලද ඉතාමත් ලෙංගතුභාවය සහ උදව් උපකාර පිළිබඳව මා ඉතාමත් ගෞරවයෙන් මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. එතුමා අද වයෝවෘද්ධභාවයට පත් වෙලා සිටියත් ඉතාමත් අත්දැකීම් බහුල දේශපාලඥයෙක් හැටියටත්, ඉතාමත් අත්දැකීම් බහුල ආණ්ඩුකාරවයෙක් හැටියටත් ලංකාවේ අතිවිශිෂ්ට, ඉතාමත් පුළුල් වැදගත් පළාත් සභාව වන බස්නාහිර පළාත් සභාවට දෙන ලද නායකත්වය පිළිබඳවත් අපි අතිශයින්ම සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලු මන්ත්‍රීවරුන්ගේත් වරප්‍රසාද ආරක්ෂා කර දෙමින් අනික් පළාත් සභා සමගත් සංසන්දනාත්මකව බලද්දී ප්‍රධාන අමාත්‍යවරයාට සහ අමාත්‍ය මණ්ඩලයට තමන්ගේ රාජකාරි කරගෙන යැමට අවශ්‍ය නිසි සහයෝගය ලබා දෙමින් එතුමා කරන කාර්ය භාරය සමස්ත පළාත් සභා පද්ධතියට දැවැන්ත ආදර්ශයක් බව මා ඉතා නිහතමානීව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ එතුමා පැහැදිලිව කරුණු 09 ක් පෙන්නුම් කරමින් දර්ශක සහිතව පළාත් සභාව පස් අවුරුදු සැලැස්මක් යටතේ ඉදිරියට රැගෙන යාමට ක්‍රියා කරන ආකාරය පිළිබඳව මේ පොත් පිංච තුළ පැහැදිලි කිරීම් කොට තිබෙනවා. ඒ නිසා ඒවා අපි පුන පුනා නැවත සිහිපත් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් රුපියල් බිලියන 2905 ක් මේ වනකොට අපේ ආදයම. එය 50% කින්, රටේ මුළු ආදායමෙන් 50% ක් පමණ වෙනවා. ඒ කියන්නේ සමස්තයක් වශයෙන් ලසු කර ගත්තාම මුළු ලංකාවටම පූර්වාදර්ශයක් දිය යුතු පළාත් සභාව, මේ පළාත් සභාව බව අපි අවිවාදාත්මකව පිළිගන්නා කාරණාවක්. ඒ නිසා මේ තුළ ක්‍රියාත්මක වන සියලු දෑ සමස්ත රට තුළ පැහැදිලිවම දර්ශනය කර ගන්නා අතරතුරම ඔවුන් ඒ පිළිබඳව යම්කිසි අත්දැකීමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටිනවා කියන එක මගේ විශ්වාසය. මම පැහැදිලිව වැඩ කරපු මගේ සීමා සහිත කාලය තුළ, මම ආදර්ශයෙන් දැන ගත්තු දෙයක් තමයි අපට බස්නාහිර පළාත තුළ මුළු රටටම නියාමක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා ඒවා ක්‍රියාත්මක කොට පැහැදිලි කිරීමටත් අනිකුත් පළාත් සභාවලටත් ඒ ආදර්ශය ගොනු කිරීමට හැකියාව සහ ශක්තිය අපට තිබෙනවා. ඒකට අවශ්‍ය කරන නෛතික රාමුව සකස් කිරීම, ඒ ඒ විෂයයන් බද්ධව ප්‍රඥප්ති සකස් කරලා ඒ ප්‍රඥප්ති, ඒ නීතිය සමස්ත රටට හඳුන්වා දෙන්න, රටේ ක්‍රමවේදයන් නියමානුකූලව ඉදිරියට ගෙන යන්න අවශ්‍ය කරන මඟ පෙන්වීම කරන්න හැකි පළාත් සභාවක් බවට බස්නාහිර පළාත් සභාව පත්ව තිබෙන බව අපි කවුරුත් දන්නා කාරණාවක්. ඒ නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ගම්‍ය වෙනවා රට දැන් පවතින තත්ත්වය, රටේ දළ දේශීය ආදායම් තත්ත්වයන් වාගේම මේ නිෂ්පාදන තත්ත්වයන්, ඒක පුද්ගල ආදායම වර්ධනය කළ යුතු ආකාරය පිළිබඳව, දැනට පවතින තත්ත්වයන් පිළිබඳව යථාවබෝධයෙන් යුතුව මේ පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්පාදනය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා දරා තිබෙන උත්සාහය පිළිබඳව අපගේ ගෞරවනීය ස්තුතිය එතුමාට පුද කිරීම අනිවාර්යයෙන්ම කළ යුත්තක්.

ගරු සභාපතිතුමනි, අපි මේ සියල්ලේ කේන්ද්‍රස්ථානය, මූලස්ථානය බවට පත් වෙන්නේ අනාගතයේ අධ්‍යාපනයෙන් පෝෂණය වන දරුවායි. ගෝලීය අධ්‍යාපනය දැනුම තුළින් දරුවන් සන්නද්ධ කරලා, 21 වැනි ශතවර්ෂයේ අභියෝගයන් ඉතාමත් විවෘතව භාර ගන්න පුළුවන්, අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන්, රටේ අනාගතය භාර ගන්න පුළුවන් දරු පරපුරක් නිර්මාණය කිරීමට පුරෝගාමී ක්‍රියාවලිය බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ වගකීමක් හැටියට රැඳී තිබෙන බව අපි කවුරුත් අවිවාදාත්මකව පිළිගත යුතු කාරණාවක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා දරන උත්සාහය, ගුරු හිඟය වළක්වා ගැනීම, ඒ වාගේම දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ පුරප්පාඩු පියවාලීම, අනාගත දරුවාට අවශ්‍ය කරන අධ්‍යාපනික පහසුකම් සම්පාදනය කිරීම මේ විෂයය ධාරව තුළ ගෙන යන මේ ක්‍රියාවලිය අපි පැසසුමට ලක් කළ යුතුයි. අපේ හිතවත් ගරු මන්ත්‍රීතුමා, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා අධ්‍යාපනයේ කඩා වැටිලා තිබෙන තැන් පිළිබඳව. ඒ වාගේම අර කොහේද සායන පිළිබඳව එතුමා කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම ඉතා පැහැදිලිව කනගාටු වෙනවා එක කාරණයක් පිළිබඳව. අඩුපාඩු පෙන්වා දීම සහ ඒවා නිවැරැදි කිරීමට සාධාරණ විවේචන ඉදිරිපත් කිරීම විපක්ෂයේ කාර්ය භාරය විය යුතුයි. නමුත් සාධනාත්මක වශයෙන් පළාත් සභාව තුළ විෂයය බද්ධව කර තිබෙන වැඩ කොටස්වල සාධාරණ විවේචනයක් කරනවා නම් එය ඉතාමත් සද්භාවයෙන් කරන්නක් බව කාටත් පැහැදිලි වෙනවා. මේ අගතිගාමීව, ආණ්ඩුව ප්‍රබල විවේචනයට ලක් කරලා තමන්ගේ දේශපාලන අරමුණු ඉෂ්ට කරගන්නවා වෙනුවට, යුක්තිය සහ සාධාරණය තුළ කරන විවේචන මේ සභාවට ඵලදායි වන බව ප්‍රකාශ කරමින්, අනාගතය තුළ එවැනි තත්ත්වයක් නිර්මාණය වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම ආරාධනා කරනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. ඔබතුමාට විනාඩි 15 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 01.37]

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, VI වැනි පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් එතුමාට ස්තුති යෝජනා ගෙන එන ලද මේ අවස්ථාවේ අදහස් කීපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන මගේ ස්තුතිය ඔබතුමාට පුද කරනවා. ගරු සභාපතිතුමනි, පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරලා පළමුවැනි පළාත් සභාව අනික් පළාත් සභා පහේම පාලන බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණට හෝ සන්ධානයට ලබා දෙන්න මේ බස්නාහිර පළාතේ ජනතාව කටයුතු කරලා තිබෙනවා. ඒ විශ්වාසය තුළ සෑම මැතිවරණයකින්ම ජයග්‍රහණය ලබන්න පුළුවන්කම ලැබුණා වාගේම ජනතාවගේ අපේක්ෂාවන් උපරිම ආකාරයෙන් ඉටු කරන්නත් මේ පළාත් සභාව කටයුතු කළාය කියන කාරණාව ඡන්ද ප්‍රතිඵලවලින් අපට දකින්න පුළුවන්කම ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා පහෙන් එක් අවස්ථාවකදී මන්ත්‍රී ධූරයේත්, අවස්ථා දෙකකදී අමාත්‍ය ධූරයේත්, ඒ වාගේම අවස්ථා දෙකකදී ප්‍රධාන අමාත්‍ය ධූරයේත් කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. ඒ වාගේම 1994 පළාත් සභාවට ඉදිරිපත් වුණු මට සෑම පළාත් සභා මැතිවරණයකදීම මගේ පෞද්ගලික ඡන්ද පදනම වැඩි කරලා අවසාන මැතිවරණයේදී ලක්ෂ දෙකහමාරකට ආසන්න මනාප ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්කම ලැබුණේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව මා කෙරෙහි තැබූ විශ්වාසය නිසයි. ඒ පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පළමුවෙන්ම ගම්පහ දිස්ත්‍රික් ජනතාවට පුද කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කියන්නේ සියලුම ජාතීන්, සියලුම ආගමික කණ්ඩායම් නියෝජනය වෙමින් තිබෙන පළාත් සභාවක්. සංකීර්ණ පළාත් සභාවක්. පසුගිය පළාත් සභාවල අපි කටයුතු කරද්දී මේ පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය උපදේශක කාරක සභා මට්ටමෙන් අපට ලබා දෙන්න කටයුතු කළා. ඒ සාධාරණ විවේචනවලට අපි ඇහුම්කන් දීලා, අපේ අතින් වැරැදි සිදු වුණා නම් ඒක නිවැරැදි කරගෙන ඉදිරියට යන්නත් අපට පුළුවන්කම ලැබුණා. ගරු සභාපතිතුමනි, 2009 - 2013 කාලසීමාව තුළ මේ පළාත් සභාවේ වෙනසක් ඇති කරන්න අපට පුළුවන්කම ලැබුණා. අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා 2009 පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලත්, 2014 පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලත් අරගෙන ඡන්ද අඩුවීම ගැන විග්‍රහයක් කරන්න කටයුතු කළා. මම හිතන්නේ ඒක වැරැදියි අර්ථකථනයක්. මොකද 2009 කියන්නේ යුද්ධය ආසන්නයේ, යුද්ධය ජයග්‍රහණය පෙනි පෙනී ජනතාව ලබා දීපු ශක්තිය ඒ මැතිවරණ ප්‍රතිඵලවලට ඉවහල් වුණා. හැබැයි, එතුමා සංසන්දනය කළේ නැහැ ඊට පස්සේ පවත්වපු පාර්ලිමේන්තු මැතිවරණයත් බස්නාහිර පළාතේ ප්‍රතිඵලත් සමග. එහෙම නැත්නම් පළාත් පාලන මැතිවරණයත්, පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලයත් සංසන්දනය කළේ නැහැ. එහෙම වුණා නම් එතුමා තේරුම් ගනියි අපේ මන්ත්‍රී ධූර සංඛ්‍යාව අඩු වුණත් අපේ ඡන්ද පදනම රැක ගන්න පුළුවන්කම ලැබුණාය කියලා. නමුත් අපි සන්තෝෂ වෙනවා. කඩා වැටුණු ජනතා විමුක්ති පෙරමුණ අනුර කුමාර දිසානායක මැතිතුමාගේ නායකත්වය යටතේ යම් ප්‍රගතියක් ලබා ගන්න පුළුවන්කම ලැබීම පිළිබඳව.

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යූහය තුළ විරුද්ධ පක්ෂයක් ශක්තිමත් වනකොට අද තරගය තිබෙන්නේ අපට නොවෙයි. මේ එක්සත් ජාතික පක්ෂය එක්කවත්, එහෙම නැත්නම් සරත් ෆොන්සේකා මහත්මයාගේ පක්ෂය එක්කවත් තරගයක් අපට නැහැ. මේ මැතිවරණ ප්‍රතිඵලයත් එක්ක අද තරගය ඇති වෙලා තිබෙන්නේ ඒ ඒ පක්ෂ තුළමයි. අපට ඒක අභියෝගයකට ලක් වෙලා නැහැ. අභියෝගය - අද එක්සත් ජාතික පක්ෂය රැකගන්න බලන්නේ, ජනතා විමුක්ති පෙරමුණට ගියොත් ඒක කොහොමද ගන්නේ කියලා. එහෙම නැත්නම් සරත් ෆොන්සේකා මහත්මයාගේ පක්ෂයට ගිය ටික ගන්නේ කොහොමද කියලා ඒ අය හිතනවා. ඒ අය රැක ගන්න බලන්න තමන්ගේ පක්ෂ පදනම. ඒක නිසා ඒ විග්‍රහය තුළත් අපි මේ පළාත් සභාව ශක්තිමත් කරනවා. මම හිතන්නේ, ඌව ප්‍රතිඵලයත්, ඊළඟ ජනාධිපති මැතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය වනකොට මේ අවුල තව අපට පැහැදිලිව දකින්න පුළුවන් වෙයි. මොකද අර පොඩි අපේක්ෂකයා තෝරාගන්න අවස්ථාවේදී අපට ඒක දකින්න පුළුවන් වෙයි. මේ රටේ ජනතාව පොදු අපේක්ෂකයා හැටියට ජනාධිපතිතුමා තෝරා ගන්න කොට අද විරුද්ධ පක්ෂයට වෙලා තිබෙන්නේ පොඩි අපේක්ෂකයා තෝරා ගැනීමටයි. ඒ කියන්නේ කුඩා කණ්ඩායම් කිහිපයක් එකතු වෙලා - මම මේ විවේචනයක් කරනවා නොවෙයි. මම මේ යථාර්ථය පැහැදිලි කිරීමක් කළේ. එතුමාගේ විග්‍රහ පිළිබඳව නිවැරැදි කිරීමක් කරන්න වෙනවා.

මම ස්තුතිවන්ත වෙනවා. මොකද පසුගිය පළාත් සභාවේදී විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරු අපේ උපදේශක කමිටු හරහා අපට නොයෙකුත් පැහැදිලි කිරීම් කරලා ඉදිරිපත් කිරීම් කළා. අද ඒ ප්‍රතිඵලය ලබා ගන්න අපට පුළුවන් වුණා. අපි පසුගිය පළාත් සභා කාලසීමාවේදී ගුරුවරුන් 10,000 කට වැඩි ප්‍රමාණයක් බඳවා ගත්තා. මට මතකයි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී අධ්‍යාපනය ගැන කථා කළා. විශේෂ උනන්දුවකින්. එතුමන්ලා රූපවාහිනී විවාදයකට ගිහිල්ලා බස්නාහිර පළාතේ පුහුණු ගුරුවරු සම්බන්ධයෙන් කිව්වා. පුහුණු ගුරුවරු බස්නාහිර පළාතේ නැහැයි කියලා. ඒක ඇත්ත. ඒ අවස්ථාවේදී මම ඒක පිළිගත්තා. අපට සිටියේ 48% යි. අපට විද්‍යාපීඨ ගුරුවරුන් මධ්‍යම රජයෙන් ලබා දීලා තිබුණේ නැහැ. ජනාධිපතිතුමාට පිං සිද්ධ වෙන්න ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීමේ අවස්ථාවට ප්‍රතිපාදන අපේ අයවැයට අමතරව බස්නාහිර පළාත් සභාවට ලබා දෙන්න කටයුතු කළා. අද මම සන්තෝෂයෙන් කියන්න ඕනෑ. මේ බස්නාහිර පළාතේ ප්‍රාථමික පුහුණු ගුරුවරුන් 99% ක් අපට ඉන්නවා. එදා එතුමා 48% යි කියලා ඒ විවාදයේදී කිව්වා. හැබැයි කනගාටුව ගරු සභාපතිතුමනි. රූපවාහිනියට ගිහිල්ලා 48% න් කොහොමද අධ්‍යාපනය නඟා සිටුවන්නේ කියලා කථා කරපු උදවිය ප්‍රාථමික ගුරු පුහුණු පාඨමාලාව දාන්න යන කොට උද්ඝෝෂණ කළා. එතුමාත් එතැන සිටියා. හැබැයි උද්ඝෝෂණ කරපුවාම අපි කිව්වා කැමැති අය කරන්න. අකැමැති අය එපා කියලා. අවසානයේදී පුහුණුවට ගිය අය අපට කිව්වේ මොකක්ද? මා ළඟ පොත් තිබෙනවා. නිසඳැස් ලියලා එවලා තිබෙනවා. ප්‍රධාන ඇමැතිවරයාට බැණපු අපට - මගේ බඩ ගැන කියලා, මගේ ඇඟ ගැන කියලා මාව විවේචනය කරපු අය සමාව ඉල්ලලා ලියුම් දීපුවා තිබෙනවා. මම ඒකට මුහුණ දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බඩ ගැන කිව්ව එක ගැන වැරැදියි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉතින් මම ඇත්ත කියන්නේ. මගේ ස්වභාවය නේ මේ. ඒක ඇත්ත. ඒක නිසා එහෙම කථා කරලා අවසානයේදී ගුරුවරුන් තීන්දු කළා එය හොඳයි කියලා. ඒ වගේම මම විශ්වාස කරනවා බස්නාහිර පළාතේ ගුරුවරුන්ට සුභසාධන පැත්ත ගැන අවධානය යොමු කරන්න ඕනෑය කියලා. අපි ගුරු පවුර හරහා රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළා. ඒකත් විවේචනය කළා. අද ගියාම කියනවා සර් අපට ගන්න බැරි වුණා ඒ වේලාවේ. අපට බැරිද ආපසු මේක දෙන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉස්සෙල්ලා අග්‍රහාරය දීලා ඉන්න කෝ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකද රජයේ සියලුම සේවකයින්ට මම ඒක දෙනවා. අග්‍රහාරයත් දෙන්න ඕනෑ. තව දෙන්න පුළුවන් නම් ගුරුවරුන්ට මම ඊටත් වඩා දෙයක් දෙනවා. මොකද, ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අමතක කරන්න එපා. ඔබතුමා වෘත්තීය සමිති නායකයෙක් හැටියට ගුරුවරුන්ගේ

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

අවශ්‍යතාවය ඉටු කරන්න, සුභසාධන පැත්ත කරන්න ඔබතුමන්ලා කටයුතු කළේ නැහැ. ඔබ තමුන්නාන්සේලා කළේ හැම තිස්සේම දේශපාලන අරමුණු ඉටු කර ගැනීමක්. මම මේ ඊයේ පෙරෙයිදා අසෝක විද්‍යාලය ගැන ඉතාම වේදනාවෙන් කථා කළා. අසෝකයට අපි යසරත්න විදුහල්පතිතුමාව දැම්මා. ඒකේ වගකීම මම භාර ගන්නවා. මොකද, අසෝකය මගේ පාසල. මම මූලික අධ්‍යාපනය ලැබුවේ ඒ පාසලෙන්. ඒ පාසලට හොඳ විදුහල්පතිවරයෙක් තෝරන්න ඕනෑ වුණා. එතුමාම හොඳ උදාහරණ දෙකක් කිව්වා. අසෝකයයි, ජාපාලවත්තයි කියන දෙක. ජාපාලවත්තේ විදුහල්පතිවරයා තෝරද්දී පුවත්පත්වල දාලා, දැන්වීම් දාලා, සම්මුඛ පරීක්ෂණ තියලා තෝරලා විදුහල්පතිවරයාව පත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ගුරු සංගමයේ හිටපු ලේකම්තුමා ඒකට තේරුණා. අපි විරුද්ධ වුණේ නැහැ. අපි ඒ අවස්ථාව දුන්නා. අද එතුමා කියනවා, ඒ දාපු එක අසාර්ථක වුණා. ඒ විදුහල්පතිතුමා ප්‍රතිඵල කඩා වැට්ටුවා කියලා. මේ සම්මුඛ පරීක්ෂණ තියලා දාපු කෙනා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම කිව්වේ ඔබතුමන්ලා කලින් දාපු කෙනා ගැන.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න. මේ අද ගැන ඔබතුමන්ලා කථා කළේ. දැන් එතුමා අවුරුදු හතරක් ඒ පාසලේ ඉන්නවා. දැන් ඔබතුමා සොයලා බලලා මට කියන්න කෝ එහෙමනම්. ගරු සභාපතිතුමනි,

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

BC ගුරුවරයා විශ්‍රාම ගියාට පස්සේ කවුද දැම්මේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මට ඕනෑ වුණා අසෝකයට හොඳ ගුරුවරයෙක් දාන්න. ගුරුවරු 168 ක් පාලනය කරපු, ළමයි 4000 කට වැඩි ප්‍රමාණයක් පාලනය කරපු විදුහල්පතිවරයා. අදත් මේ මන්ත්‍රීවරු පිළිගන්නවා. කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිවරයා පිළිබඳව. හොඳම විදුහල්පතිවරයෙක් තෝරලා දැම්මේ.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ඕනෑම අභියෝගයකට මුහුණ දුන්නා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මුහුණ දුන්නා විතරක් නොවෙයි. හොඳ ප්‍රතිඵල දීපු විදුහල්පතිවරයෙක්. ඒ පාසලට දාලා කටයුතු කරනකොට ගුරුවරු 16 ක අතිරික්තයක් තිබුණා. ගුරු මාරු මණ්ඩලවල වාඩි වන වෘත්තීය සමිතිවල වගකීමක් ගුරුවරු මාරු කිරීම සම්බන්ධව කටයුතු කරන්න. ඒ අයගේ වගකීම ඉටු කරපු නැති නිසා වැඩි ගුරුවරුන් සම්බන්ධව කටයුතු කරනකොට ඉස්කෝලය තුළ අර්බුදකාරී තත්ත්වයක් ඇති වුණා. මම කනගාටු වෙනවා. ගුරුවරු තමන්ගේ දරුවන්ව පාසල තුළ රතිඤ්ඤා පත්තු කරන මට්ටමට ගත්තා. දරුවන්ගේ විනය ගැන කථා කරන ගුරුවරු ඒ දරුවන්ව පාවිච්චි කළේ තමුන්ගේ අරමුණට යන්න. එතුමා කිව්ව කථාව ඇත්ත. අපි මාරු කළා. ඒ දරුවෝ අවසානයේදී පරීක්ෂණය පවත්වද්දී අර ගුරුවරු ඇවිල්ලා පාවා දුන්නා අහවල් දරුවොයි මේක පත්තු කළේ කියලා. ඊට පස්සේ දෙවැනි උද්ඝෝෂණය කරන්න ගියා. මෙතුමාත් ගියා ඒ උද්ඝෝෂණයට. එතකොට පළාත් සභාව විසුරුවා හැරලා තිබුණේ. අපට ඒ කාලයේ සම්බන්ධ වෙන්න බැරි වුණා. අපි ආවයින් පස්සේ දෙවැනි උද්ඝෝෂණය කරන්න කටයුතු කළා. පාසලේ ශිෂ්‍ය නායකයා ඇවිල්ලා මෙතුමාට කිව්වා. අපි ටී.වී. එකෙන් දැක්කා. මෙතැන පාසලේ කීර්ති නාමයට හානි කරන්න එපා. එහාට ගිහිල්ලා උද්ඝෝෂණය කරන්න කියලා. නැද්ද? ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා අද -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ශිෂ්‍ය නායකයෝ එළියට එව්වේ කවුද? ඔබතුමාගේ ගෝලයෝ තමයි. ගේට්ටුවෙන් එළියට ශිෂ්‍ය නායකයෝ එව්වේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දේශපාලන උවමනාවන් ඉටු කර ගන්න අපි කටයුතු කළේ නැහැ. ඒ ශිෂ්‍ය නායකයෝ එළියට බැහැලා කථා කරනකොට මෙතුමාට සිද්ධ වුණා, එතැනින් යන්න. ආදර්ශයක් දුන්නා පාසලේ දරුවෝ. ඔබතුමන්ලා ඒක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දරුවෝ කවුද -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ ශිෂ්‍ය නායකයා මගේ කවුරුත් නොවෙයි. මම දන්නේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ටී.වී. එකේ පෙන්නුවා ඒවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දරුවෝ කවුද ගේට්ටුවෙන් එළියට එව්වේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දරුවෝ එළෙව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔයගොල්ලන්ව දරුවෝ එළෙව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමා ගුරුවරයෙක් හැටියට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනය රකින විධිය අපි දකිනවා. ඉස්කෝලේ කාල තිබෙන්නේ. අසෝකේ ඉවරයි. මෙතුමාගේ ඉස්කෝලේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම හිතන්නේ ගුරුවරුන්ගේ විනය පිළිබඳව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමා කිව්වා දැන් වගකීමෙන්, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මේ ප්‍රකාශය වෘත්තීය සමිති සාකච්ඡාවකදීත් කිව්වා. අසෝකේ වගකීම මම භාර ගන්නවා කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකුත් වෙලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරුවරු 17 දෙනෙක් මාරු කළා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

17 ක් නොවෙයි. අදත් අට දෙනෙක් යනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සැරේ O/L විභාගය ලියන -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගුරුවරුන් අපට ලබා දෙන්න පුළුවන්, ගරු සභාපතිතුමනි,

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පන්තිවල උගන්වපු ගුරුවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පාසල ගෙන යන්න නම් දරුවෙකුට උගන්වනවාට වඩා ගුරුවරයෙක් තුළ විනයක් ඇති වෙන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ වාගේ ගුරුවරුන්ව රැක ගැනීම - මම හිතන්නේ, ඒ තත්ත්වයට ගුරුවරුන්ව පත් කරන එක ගැන අපි කනගාටු වෙනවා. මේ අය අද කටයුතු කරන්නේ ඊළඟට තිබෙන මැතිවරණය, එහෙම නැත්නම් ජනාධිපතිවරණය හෝ පාර්ලිමේන්තු මැතිවරණයට පෙර අර්බුදකාරී තත්ත්වයක් පාසල් තුළ නිර්මාණය කරන්නයි. ඒ නිසා ගරු සභාපතිතුමනි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් යන විධියට ඒක නවත්වන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ඉල්ලීමක් කරනවා. කරුණාකරලා, පාසල් දරුවෝ පාවිච්චි කරන්න එපා. පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න කටයුතු කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගේ පළාත් අධ්‍යක්ෂ කවුද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

වාඩි වෙන්න කෝ ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩිවෙන්න ගරු මන්ත්‍රීතුමා. විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාලයේ ද්‍රවිඩ ගුරුවරු බඳවා ගැනීම් කටයුතු කළා. අපි පාසල්වල භෞතික සම්පත්, මානව සම්පත් සංවර්ධනය කරන්න කටයුතු කළා. ගුරු පුහුණුවීම් ලබා දුන්නා. ගුරු සුභසාධන පැත්ත පිළිබඳව කටයුතු කළා. අපට පළාත් සභාවක් හැටියට රජයේ විශ්වාසය තහවුරු කර ගන්න පුළුවන් වුණා. මම විවේචනය කරන්නේ නැහැ. නගර සභාවේ ඉඳලා ආපු අපේ ගරු මන්ත්‍රීතුමා අනුරාධ විමලරත්න මැතිතුමා කථා කළා. එතුමාන්ලා ප්‍රතිපත්ති ප්‍රකාශය කියවලා නැතුව තමන්ගේ දේශපාලන සාකච්ඡාවක් කළේ. කමක් නැහැ. ඒක එතුමන්ලාගේ කාර්ය භාරය. එතුමා නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට දන්නවා. ආරක්ෂක ලේකම්තුමා අද කොළඹ නගරයේ නගර අලංකරණය කරන හැටි. අද ගෙවල්වලින් එළියට දානකොට මාසයකට ඒ අයට කුලී ගෙවනවා, ඔබතුමන්ලාගේ නගර සභාව. අධිකාරිය. අපි ඒවා පිළිගන්නවා. රජයත් එක්ක එකට එකතු වෙලා වැඩ කරන නගර සභාවක්. ඒ තුළ අද නගරය අලංකාර වෙලා තිබෙනවා. ඒවා දකින්නේ නැතුව වැරදි දේවල් පෙන්වන්න උත්සාහ කිරීම තුළ, දේශපාලන අරමුණු ඉටු කර ගන්න හදන එක කනගාටුවට කාරණයක් ගරු සභාපතිතුමනි.

පළාත් සභාවක් හැටියට අපේ රාමුව තුළ, අපේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනතාවට උපරිම සේවාවක් ලබා දෙන්න අපි කටයුතු කළා විතරක් නොවෙයි, මේ පළාත් සභාවත් මහින්ද චින්තන වැඩ පිළිවෙළට, මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළට ශක්තියක් වෙන්න කටයුතු කරනවා කියන කාරණාවත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා මම මීට වැඩිය දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. පළාත් සභාවක් හැටියට ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරු, මන්ත්‍රීවරු සියලු දෙනාත් එක්ක පසුගිය කාලයේ ඉතාමත් සහයෝගයෙන් අපට වැඩ කරන්න පුළුවන්කම ලැබුණා. ඒ ජයග්‍රහණ මගේ පෞද්ගලික ජයග්‍රහණ හැටියට මම දකින්නේ නැහැ. ඒක අපි කණ්ඩායමක් හැටියට, පළාත් සභාවක් හැටියට ලබපු ජයග්‍රහණ. රටේ මිනිස් ජීවිතයක අවුරුදු 25 ක් 30 ක් කියන්නේ ලොකු කාලයක්. හැබැයි ආණ්ඩුවක, ව්‍යවස්ථාවක අවුරුදු 15 ක් කියන්නේ ඉතාමත් සුළු කාලයක්. අද මේ පළාත් සභා ක්‍රමය, මේ ගැන නැවත කථා කළ යුතු කාලය ඇවිල්ලා තිබෙනවා. අපි දන්නවා මේ සභාවේ පළාත් සභාවට විරුද්ධ අය ඉන්නවා. පළාත් සභාව විවේචනය කරන අය ඉන්නවා. ජනාධිපති ක්‍රමය සංශෝධනය විය යුතුයි කියනවා. සමහර අය කියනවා ජනාධිපති ක්‍රමය අහෝසි විය යුතුයි කියලා. තවත් අය

කියනවා ජනාධිපති ක්‍රමය අවශ්‍යයයි කියලා. මේ හැමෝගේම අදහස්. ජනතාවගේ අදහස් තමයි මෙතැන සාකච්ඡාවට ගන්නේ. ඒ සාකච්ඡාවලට අපි ගරු කරනවා. නමුත් අපි ඉල්ලීමක් කරනවා. හොඳ දේ හොඳ දේ හැටියට දකින්න පුළුවන් වෙන්න ඕනෑ. පළාත් සභාවක් හැටියට මේක ශක්තිමත් කරන්න අපි සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අවසානයේදී ගරු ආණ්ඩුකාරතුමා පසුගිය කාල සීමාවේදී මේ පළාත් සභාව මේ මට්ටමට ගෙන එන්න එතුමා ලබා දීපු ශක්තිය අපි අමතක කරන්නේ නැහැ. එතුමා මට පෞද්ගලිකවම විශාල ශක්තියක් වුණා. කවදාවත් අපි කියපු දෙයක් ප්‍රතික්ෂේප කරන්න එතුමා කටයුතු කළේ නැහැ. යම් දෙයක් අපට කර ගන්න ඕනෑ වුණාම, එතුමාට කිව්වාම ඒකට අවශ්‍ය පසුබිම නිර්මාණය කළා. ඒ නිසා එතුමාට මගේ විශේෂ ස්තූතියත් පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් වූ ස්තුති යෝජනාවේ විවාදය මේ අවස්ථාවේ අවසන් වෙනවා. මම ඒ පිළිබඳව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිනවා. විවාදයට සම්බන්ධ වෙමින් ඉතාමත් හරවත් දේශන පැවැත්වීම පිළිබඳව. එම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කාර්ය පටිපාටි රීති 31 (ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කිරීමට මා වෙත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එකී යෝජනාව ඉදිරිපත් කිරීමට ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 31(ආ) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 31(b)

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 31 (ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාත් පාසල් ගණනාවකට 2014 වර්ෂය සඳහා පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සම්පූර්ණ කර නැත. සම්මුඛ පරීක්ෂණ මගින් තෝරාගත් එක් පන්තියකට ළමුන් 33 බැගින් ඇතුළත් කර පන්තියේ තවදුරටත් පිරවිය හැකි පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම නිසා සම්මුඛ පරීක්ෂණවලින් ලකුණු අඩු වූ ළමුන් පාසලට ඇතුළත් වීමට නොහැකිව තවමත් නිවාසවල සිටී. ජනවාරි මාසයේ පාසලට යා යුතු ළමයින් ගෙදර තබාගෙන දෙමව්පියන්ද පීඩාකාරී ජීවිතයක් ගත කරයි. වගකිව යුත්තෙක් ද නැත. මෙම වසරේ පමණක් නොව පසුගිය කාලයේ සෑම වසරකම පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී මෙවැනි තත්ත්වයන් සිදු වී ඇත. අවසානයේ පුරප්පාඩු පිරවීමේදී කටයුතු සිදු වී ඇති ආකාරයද සාධාරණ නැත. මෙම අකාර්යක්ෂමතාවය වෙනස් කොට ලබාගත් ලකුණු පිළිවෙළට පුරප්පාඩු පුරවා පාසලකට ඇතුළත් විය යුතු දරුවන්ට පාසල් ඉඩ විවර කර දීමට වහාම පියවර ගත යුතු බවට යෝජනා කර සිටින්නීය."*

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධව පළාත් සභාව පිහිටවූවාට පස්සේ මේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධව මේ වනකොට විධිමත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් හැටියට ක්‍රියාන්විත සේවාවලින් බඳවා ගන්නා පාසල්වලට හැර අනෙක් පාසල්වලට 40 සීමාවට දරුවන් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් අලුත් පළාත් සභාව හරහා ලබා දුන්නා. ඒ වාගේම ක්‍රියාන්විත සේවාවේ පුරප්පාඩු සඳහා මේ වනකොට සංශෝධන ලැයිස්තු ලැබෙමින් පවතිනවා. එය අවසන් වුණාම අත්‍යවශ්‍ය සේවාවන්වලට අවශ්‍ය ප්‍රමාණය යොදා ගත්තාට පස්සේ ඉතුරු වන පුරප්පාඩු සම්බන්ධව අභියාචනා සලකා කටයුතු කරන්නත් තීන්දු කරලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි,

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

මේ දරුවන්ට පාසල් නොමැතිකම නොවෙයි තිබෙන්නේ. ජනප්‍රිය පාස්ලවලට ඉල්ලුම් කරන ප්‍රමාණය නිසා ඇති වන තත්ත්වයක්. ඒ වාගේම පාසල්වලට ඇතුළත් වෙන්න නොහැකි වුණු දරුවෝ ඉන්නවා නම්, ඒ අය ඉල්ලන ජනප්‍රිය පාසල්ම කේන්ද්‍ර කරගෙන අපට දෙන්න බැරි වෙයි. නමුත් අපට ඉදිරිපත් කළාම ඒ කලාපවලට අපි යොමු කරලා පුරප්පාඩු තිබෙන පාසල්වලට ඒ අය යොමු කරන්න කටයුතු කරලා තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. දැන් මේ ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ස්ථිර කරන්න අවස්ථාවක් දෙන්නේ නැතුව විවාදයට ගත්තා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, දෙනවා. එතුමා මූලාසනයෙන් ඉල්ලීමක් කළා එතුමාට පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මේ කථා කරන්න හදන්නේ, මේ යොජනාව ඔබතුමන්ලා ස්ථිර කළොත් සාකච්ඡාවට ගන්නවා. මම මේ පැහැදිලි කරන්න හදන්නේ ඒක අවශ්‍ය නැහැයි කියන කාරණාවයි. යෝජනාව අවශ්‍ය නොවන බවයි මගේ හැඟීම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම සම්ප්‍රදායක් තිබෙනවාද ගරු ප්‍රධාන ඇමැතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ඇමැතිවරයා වශයෙන් එතුමා අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා ස්ථිර කරන්න. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

කාර්ය පටිපාටි රීති යටතේ තමයි ගරු සභාපතිතුමනි, මේ කාරණය ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමා අදහස් ඉදිරිපත් කළා මේ සම්බන්ධව පවත්නා වර්තමාන තත්ත්වය පිළිබඳව. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කළා. එතුමා අදහස් ප්‍රකාශ කළා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව ගරු ප්‍රධාන ඇමැතිතුමා කරුණු ඉදිරිපත් කළා. විවාදයකට යෑමේදී සභාවේ එකඟතාවය -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ, එතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් මම සෑහීමකට පත් වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. එම යෝජනාව විවාදයට ගැනීමට සභාවේ එකඟතාවය විමසීමට සිද්ධ වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

න්‍යාය පත්‍රය -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කල් තැබීමේ යෝජනාව සාකච්ඡාවට ගත යුතුද නැද්ද කියලා සභාවෙන් විමසන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒකට කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව මට අවස්ථාව ලබා දෙන්න පුළුවන්. දෙපක්ෂයටම කාලය දෙන්න පුළුවන්. ගැටළුවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නම් මට දෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ මතය මොකක්ද කියලා මම දන්නේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සභාවේ එකඟතාවයක් නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආණ්ඩු පක්ෂයේ එකඟතාවයක් නැහැ. ආණ්ඩු පක්ෂය විරුද්ධයි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමා අරගෙන තිබෙන පියවර සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව කථා කිරීමට අවශ්‍යතාවයක් නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක තමයි යෝජනාවක් ඉදිරිපත් කළේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒ නිසා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විරුද්ධතාවය ප්‍රකාශ කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, 31 (ආ) රීතිය යටතේ පැහැදිලිව තිබෙනවා මන්ත්‍රීවරයෙකුට මේ යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ යෝජනාව සම්බන්ධව ඡන්ද විමසීමකට යන්න බැහැ. ඒක ස්ථිර වුණාට පස්සේ විවාදයට ගත යුතුයි කියලා. බොහොම පැහැදිලිව රීතිවල තිබෙනවා. ඡන්දයක් විමසීම දක්වා යන්න බැහැ. (බාධා කිරීමක්)

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

යෝජනාව ගන්නවාද කියලා. මොකක්ද රීතිය.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එම යෝජනාව විවාදයට ගත්තාට අපට ගැටළුවක් නැහැ. ඒක අවශ්‍ය නැහැයි කියන එකයි මම පැහැදිලි කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාව මට නියමිත වේලාවට භාර දී තිබෙනවා. ඒ අනුව අපි සුළු කාලයක් වෙන් කරගෙන විවාදයකට යමු.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, කාලය සීමා කරලා ප්‍රධාන ඇමැතිතුමාටම පිළිතුරු දෙන්න කිව්වාම ප්‍රශ්නය ඉවරයි. අපි ඔය ගැන දන්නේ නැහැ නේ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

දෙපැත්තටම පැය ½ ක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙපැත්තට විනාඩි 15 බැගින් වෙන් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

විනාඩි 10 බැගින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 15 බැගින් ලබා දෙනවා. ආණ්ඩු පක්ෂයට විනාඩි 15 යි. විපක්ෂයට විනාඩි 15 යි. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

[අ.භා. 02.02]

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ කාරණය සම්බන්ධව ප්‍රශ්නය මම ඉදිරිපත් කළේ අප්‍රේල් 29 වැනිදා. ඔබතුමාට Register තැපෑලෙන් මම ලියුමක් එව්වා. ඒ වාගේම Fax මගින් ඔබතුමාගේ කාර්යාලයට මේ සම්බන්ධව දැන්වීමක් කළා. අද වනකොට මාසයකට ආසන්න කාලයක්. ගරු සභාපතිතුමනි, මට මේ සම්බන්ධව අඩුම ගණනේ ඔබගේ ලිපිය ලැබුණා කියලාවත් මට පිළිතුරක් ඔබතුමාගේ කාර්යාලයෙන්වත්, ඔබතුමාගෙන්වත් ලැබුණේ නැහැ. ඒකේදී ගම්‍ය වන එක කාරණයක් තිබෙනවා. ඔබතුමා කොයි ආකාරයෙන් කිව්වත් මහජන නියෝජිතයෙක් - සාමාන්‍ය කෙනෙකුට නොවෙයි. මහජන නියෝජිතයෙකුටවත් යම් සාදාචාරාත්මක කාරණයක් තිබෙනවා ඒ ලිපිය ලැබුණා කියලා උත්තරයක් එවන්න. මම මේ යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ ඉදිරිපත් කරපු කාරණාව ලියලා මට ලියුමක් ලැබුණා නම්, අද සමහර වෙලාවට මෙහෙම යෝජනාවක් සභාවට එන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ පැත්තෙන් ලොකු පැහැර හැරීමක්. මම මේ යෝජනාව ගෙන එනවා වාගේම අකාර්යක්ෂමකමක් මේක ඇතුළේ තිබෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ලියුම එව්වේ කවදාද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

අප්‍රේල් 29 වැනිදා. Register තැපෑලෙන් එව්වේ. Fax මගිනුත් එව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ මැයි 20. දවස් 20 යි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

දවස් 20 ක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

Address එක කියන්න බලන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම (බාධා කිරීම්) -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පොඩ්ඩක් ඉවසලා ඉන්න. අහගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා ගරු මන්ත්‍රීතුමන්ලා. එතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මේකෙන් බොහොම පැහැදිලිව පෙනෙනවා. මේ යෝජනාව හරහා විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ලොකු අමාරුවක වැටෙනවා කියලා පෙනෙනවා. ඒක -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අපිව අමාරුවේ දාන්න ලෙහෙසි නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

හොඳටම පැහැදිලියි ලොකු අමාරුවක වැටෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කිසිම අමාරුවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක නිසා තමයි මේ තරම් කලබලයට පත් වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම ඒ ඉදිරිපත් කරපු

ලිපිය හරහා එතුමාට මම ප්‍රශ්න තුනක් ඉදිරිපත් කළා. එකක් තමයි අදාළ පාසල්වල පුරප්පාඩු පිරවීමට යොදා ගන්නා ක්‍රමවේදය කවරේද කියලා. ඇත්තටම ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඔන්න ඔය ක්‍රමවේදය පැහැදිලි වෙන්න ඕනෑ. ඒ කියන්නේ ඉතුරු ප්‍රමාණය කොහොමද? ඊට පස්සේ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒකනේ මහ ඇමැතිතුමා එක පාරක් කිව්වේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක තියෙනවා චක්‍රලේඛයේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඉන්න කෝ අයියෝ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක තියෙනවා චක්‍රලේඛයේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මම කියන එක හරි හරි, වැරැදි හරි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

චක්‍රලේඛය බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ක්‍රමවේදය තිබෙනවා චක්‍රලේඛයේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම මේ සභාවේදී අදහස් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට ලොකු බාධාවක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පළමුවන වසරේ චක්‍රලේඛයේ තිබෙනවා. ඒක කියවන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ බාධාව විශේෂයෙන්ම වෙන්නේ - මේ මයික්‍රොෆෝනය කථා කරන මන්ත්‍රීවරයාට නොවෙයි අනෙක් මන්ත්‍රීවරයාට විවෘත වෙනවා. මම දන්නේ නැහැ මොකක් හරි තාක්ෂණ ක්‍රමවේදයක් පාවිච්චි කරන්න පුළුවන්. ඒ තාක්ෂණ ක්‍රමවේදය පාවිච්චි කරලා වෙනත් මයික් එකක් on කරන එක නතර කරන්න. ඔබතුමා විසින් මේ සභාව පාලනය කරනවා නම් ඔබතුමාට තමයි අයිතය තිබෙන්නේ කාටද මයික් එක දෙන්න ඕනෑ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ යෝජනාව හරහා ඔබතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවම එවැනි තාක්ෂණ ක්‍රමවේදයක් අපට ලැබිලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, පාසලට ඇතුළත් විය යුතු සියලු දරුවන්ට පාසලට ඒමට ඉඩ ලබා දෙන්නේ කවදාද කියන කාරණය මම ඒ ප්‍රශ්නය හරහා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේක මේ අවුරුද්දේ විතරක් නොවෙයි. මේක දිගටම වුණු දෙයක්. හැබැයි, මේ තිබෙන අකාර්යක්ෂමතාවය හරහා, මේ අර්බුදය හරහා වෙනත් වාසි ලබාගෙන තිබෙනවා. ඒක බොහොම පැහැදිලියි. කොටින්ම කිව්වොත් ඔබතුමන්ලා - මම නම් කියන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා කලබල වෙන්න එපා. කවුරුවත් කලබල වෙන්න එපා. නම් ගම් කියන්නේ නැහැ. අන්තිමේදී මන්ත්‍රීවරයාගේ ලිස්ට් එකකින් තමයි පාසල්වලට ළමයින් ගන්නේ. සාධාරණ ක්‍රමවේදයකට අනුව නොවෙයි.

[සභාවේ ඝෝෂා]

ර්යේ ආණ්ඩු පක්ෂ රැස්වීමේදී ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට තිබුණේ මෙන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

එක.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොන කෝටා එකද?

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඇයි කලබල වෙන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. කලබල වෙන්න ඕනෑ නැහැ. කලබල වෙන්න කාරණාවක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

ඔබතුමන්ලා කලබල වෙන්න අවශ්‍ය නැහැ. එතුමා අදහස් ප්‍රකාශ කරපුවා දෙන්. මහ ඇමැතිතුමා උත්තර දෙයි. ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙතුමා ප්‍රකාශයක් කළා ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීමේදී කථා වුණාය කියලා ළමයින් ඉස්කෝල දාන කෝටා ක්‍රමයක් සම්බන්ධව. මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. මේ විධියේ බොරු ප්‍රකාශ කළාම අපට එළියට යන්න බැරි වෙනවා. මාධ්‍ය හරහා මේවා එළියට යනවා. මේ බොරු ප්‍රකාශය වහාම ඉල්ලා අස් කර ගන්න ඕනෑ. ඉල්ලා අස් කර ගත්තේ නැත්නම් අපි සභාවෙන් නැඟිටලා යනවා. වහාම ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මම -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම ක්‍රමයක් නැහැ. වහාම ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි ඉල්ලා අස් කර ගැනීමේ අවශ්‍යතාවයක් නැහැ. (බාධා කිරීම්) මම කළේ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක ඉල්ලා අස් කර ගත්තේ නැත්නම් අපි සභාවෙන් නැඟිටලා යනවා. වහාම ඉල්ලා අස් කර ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. එතුමාගේ යෝජනාව සඳහා අපි දැන් විනාඩි 15 ක් බෙදා ගත්තා. ප්‍රධාන ඇමැතිතුමා උත්තර දෙයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට මේ කාරණය ඉදිරිපත් කරන්නේ මේ හරහා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නිවැරැදිව කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

සභාවක් හැටියට ජනතාවට වග කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක අයින් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයාද, විපක්ෂයේ මන්ත්‍රීවරයාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වගකීමෙන් අදාළ -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මම වගකීමෙන් කියන්නේ. සියලු කාරණා මේ සභාවට ඉදිරිපත් කරන්නේ වගකීමෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔය කියන කණ්ඩායම් රැස්වීමේ මමත් හිටියා, සභාපතිවරයා වශයෙන්. නමුත් ඔවැනි දෙයක් සාකච්ඡා වුණේ නැහැ. මම කියන්නේ වගකීමෙන්.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදියි. අසත්‍යය ප්‍රකාශයක් ඔබතුමා ඉදිරිපත් කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, ඉතාමත් වගකීමෙන් මම ප්‍රකාශ කරනවා. ඊයේ ආණ්ඩු පක්ෂ රැස්වීමේදී මේ කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා වුණේ නැහැ. හැබැයි, එහෙම කරන්න ඕනෑ නම් ඕක ආණ්ඩු පක්ෂයේ කථා කරන්නේ නැහැ මම.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක හරි. අපි පිළිගන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුත් ඉල්ලීම් කරලා ගෙනැල්ලා දීලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඔබතුමන්ලාගේ බලය යටතේ එහෙම දේවල් කරන්න පුළුවන්. එහෙම නොවෙයි මම කියන්නේ. මොකක් හරි අකාර්යක්ෂමතාවයක්, වැරැදි වැඩක් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ වෙනවා නම් ජනතාවට වග කියන්න ඕනෑ ඔබතුමා හැටියට නොවෙයි. සමස්ත සභාවක් හැටියට. ඒ නිසා අපට උවමනාව තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මේ වාගේ තත්ත්වයක් මේ ප්‍රශ්නය හරහා උද්ගත වෙලා තිබෙනවා. ඒක නිසා අපේ වගකීමක් හැටියට අපි මේ සභාවට කරුණු ඉදිරිපත් කරනවා. ඒ නිසා මේ සම්බන්ධව ගන්නා වූ ක්‍රියා මාර්ග ඒ කියන්නේ, මේවා නිවැරදි කරන්න හරි, මේවා කාර්යක්ෂම කරන්න හරි, එහෙම නැත්නම් ලබන අවුරුද්දෙත් මේ වැරැද්ද හරි ගන්නා වූ ක්‍රියා මාර්ග තිබෙන්නේ ඔබතුමන්ලාගේ පැත්තෙන්. විපක්ෂය පැත්තෙන් අපේ කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා. ස්තූතියි ගරු සභාපතිතුමනි.

[අ.භා. 02.12]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් මේ යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ මම ප්‍රකාශයක් කළා. මොකද, මේ වර්ෂය මුල වනකොට පළාත් සභාව විසුරුවා හැරලා තිබුණා. ඊළඟට පළාත් සභාව පිහිටුවලා දිවුරුම් දුන්නාට

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

පස්සේ මේ විෂයය මා යටතට පත් වුණා පසු අපි අදාළ නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා ක්‍රියාන්විත සේවාවන්වල දරුවන් ඇතුළත් කර ගන්නා පාසල් හැර අනෙක් පාසල්වලට 40 සීමාව දක්වා දරුවන්ව පාසල්වලට ඇතුළත් කර ගැනීමට අපි කටයුතු කරන්න උපදෙස් දීලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේත් මේ විෂයය භාර ඇමැතිවරයා හැටියට මම පත් වුණාට පස්සේ, ළමයින් 42 සීමාව අපි හැම තිස්සේම පාලනය කරන්න කටයුතු කරලා තිබෙනවා. නොහැකිම අවස්ථාවලදී කොට්ඨාශයකට එක පාසලක් බැගින් නම් කරලා 45 දක්වා ගියත් 42 සීමාවට සීමා කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. මේ අවස්ථාවේදී 40 සීමාව දක්වා පාසල් දරුවන් ඇතුළත් කර ගන්න කලාපවලට හැකියාව තිබෙනවා. ඒ පිළිබඳව ගැටළුවක් නැහැ. ඒ වාගේම ක්‍රියාන්විත සේවාවලින් නම් කරලා තිබෙන පාසල්වලට ඇතුළත් කර ගැනීමට කලාපවලට හැකියාවක් නැහැ. ඒ සම්බන්ධව මේ වනකොටත් සංශෝධන ලැයිස්තු ලැබෙමින් පවතින නිසා. රණවිරුවන් ගැන කථා කරන ඔබතුමන්ලා මම හිතන්නේ, ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතුයි. මම හිතන්නේ, ඒ ලකුණු මට්ටමින් රණවිරුවන්ට තිබෙන අවස්ථාව නැති කරන්න කියනවා නම් ඒක වැරදියි. (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ මේ කියන විධියට මට ඒකයි තේරුනේ. එහෙම නැත්නම් ප්‍රශ්නයක් නැහැ. මම කිව්වේ එහෙම කියනවා නම් වැරදියි කියලා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ක්‍රියාන්විත සේවාවේ බඳවා ගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ඉතුරු පුරප්පාඩු තිබුණොත් ඒ පාසල්වලට ඇතුළත් කර ගන්න කටයුතු කරනවා. ඒ වාගේම අත්‍යවශ්‍ය සේවාවන්වලට අමතරව ඕනෑම දේශපාලන පක්ෂයක මහජන නියෝජිතයෙකුගේ දරුවෙකුට අවස්ථාවක් ලබා දෙන්නත් අපි උත්සාහයක් කරනවා. යම් මට්ටමකින් ඊටත් වඩා පුරප්පාඩු ඉතුරු වුණොත් පමණක් 40 සීමාව තුළ අභියාචනා ඉදිරිපත් කරන විදුහල්පතිවරුන්ගේ නිර්දේශ ලබා දීලා තිබෙනවා. සමහර ළමයින්ට අල්ලපු ගෙදර. නමුත් ලේඛන තුළින් ඉදිරිපත් කරන්න බැරි වුණත් එහෙම අවස්ථාවලට ප්‍රායෝගිකව මුහුණ දෙනවා. ඒ අයටත් අවස්ථාව දෙනවා. එතකොට ඔය 40 සීමාව තුළ ඔබතුමන්ලා කියන විධියට ලොකු පුරප්පාඩු ප්‍රමාණයක් නැහැ, මේ කෝටා බෙදන්න. මේ වනකොටත් ඒක නැහැ. ඒක ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා ආණ්ඩුකාරතුමා 465 ක ලේඛනයක් දීලා තිබෙනවා කියලා. අඩු ගාණේ ඒ ලේඛනවලටත් බඳවා ගන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ප්‍රායෝගික තත්ත්වය මේකයි. මේක අවබෝධ කර ගන්න ඕනෑ. ඒ නිසා 40 සීමාව තුළ ක්‍රියාන්විතයේ පුරප්පාඩු ඉතාමත් සීමිත ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ තිබුණා වුණත් අත්‍යවශ්‍ය සේවාවන්වලට, ජනාධිපති ආරක්ෂක අංශයට අපි මූලිකත්වය දෙනවා. ඒ වාගේම වෛද්‍යවරුන්ට අවශ්‍යතාවය දෙනවා. ඊළඟට අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්ට දෙනවා. රාජ්‍ය සේවාවේ අවශ්‍යතාවන් ඇති වුණොත් දෙනවා. ඒ නිසා දැන් 35 බඳවාගෙන අනෙක් ටික පිරුණාම කෝටා දෙන්න විධියක් නැහැ. ඒ නිසා ඔබතුමන්ලාව වැරදි මතවාදයක් ඇති කරනවා රටට කෝටා කියලා. ඒකත් මැතිවරණවලදී පාවිච්චි කරන ක්‍රමයක් කර ගෙන ජනතාවට වැරදි අවබෝධයක් දෙනවා. ඒ නිසා කෝටා කියලා කිසිම ක්‍රමයක් නැහැ. මේ ක්‍රමවේදය පිළිබඳව පැහැදිලි කිරීමක් ඔබතුමාට කළා. ඒ පිළිබඳව මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දිනයට නියමිත න්‍යාය පත්‍රයට අනුව වැඩ කටයුතු අවසන් වෙනවා.

# කල් තැබීම
ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

*ඊට අනුකූලව පළාත් සභාව අ.භා. **02.15** ට, **2014** ජූනි මස **03** වන දින පූ.භා. **09.30** වන තෙක් කල් ගියේය.*

*Accordingly, the Provincial Council was adjourned at 02.15 p.m till 09.30 a.m, on 03.06.2014.*